SPMC

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

# වාර්ෂික වාර්තාව - 2023

# අන්තර


1 රා.ඔෟ.නි.සං පිහිටුවීම සහ මූලික අරමුණු

4 මූල්‍ය සහ මෙහෙයුම් සුවිශේෂතා
5 සභාපතිවරයාගේ සමාලෝචනය
6 සාමාන්‍යාධිකාරිතුමියගේ පණිවිඩය
7 අධ්‍යක්ෂවරු
8 ආයතනික ව්‍යුහය
9 අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව
10 විගණන කමිටු වාර්තාව
11 ආයතනික පාලන වාර්තාව
12 අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව
13 අවදානම් කළමනාකරණ වාර්තාව
14 තිරසාර සංවර්ධන ඉලක්ක
15 ආයතනික සමාජ වගකීම්
16 අපගේ නිපැයුම්
17 බද්ද ව්‍යාපාර නිපැයුම්
18 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

# ර්ශකය

## 2 අපගේ දර්ශනය හා මෙහෙවර

## 3 අපගේ ගමන් මග


19 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

20 ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

21 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

22 ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

23 ගිනුම් පිළිබඳ සටහන්

24 විගණකාධිපති වාර්තාව

25 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

26 අගය එකතු කිරීමේ ප්‍රකාශය

27 ප්‍රස්ථාරාත්මක සමාලෝචනය

28 පසුගිය වසර 10 ක වැදගත් මූල්‍ය විස්තර

29 ආයතනික තොරතුරු

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව පිහිටුවීම සහ මූලික අරමුණු

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1987 වර්ෂයේදී පිහිටුවන ලදී.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2023 වර්ෂයේදී ශ්‍රී ලාංකික ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය ඖෂධ වාණිජමය වශයෙන් නිෂ්පාදනය කිරීමෙහි 36 වසරක් සම්පූර්ණ කර ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා නිෂ්පාදන මාලාව පෙති සහ කරල් නිෂ්පාදන 96 කින් සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ මෙයින් නිෂ්පාදන 52 ක් ක්‍රියාකාරී ලෙසම සංයෝජනය කර ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදනයෙහි නියැලී සිටින එකම රාජ්‍ය සංස්ථාවයි.




### ප්‍රධාන ක්‍රියාකාරීත්වයන්

1. තමා විසින්ම හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, හෝ නැවත ඇසුරුම් කිරීම.
2. පාලිත සමාගම් නිර්මාණය කිරීම.
3. අනාගත ආයෝජකයින් සමඟ ජාත්‍යන්තර ගිවිසුම්වලට එළඹීම.
4. ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
5. ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතිකරණය කිරීම.
6. සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මඟින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මඟින් කරන ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම.

වෙළඳපලට මුදා හරිනු ලබන සියලුම නිෂ්පාදන බ්‍රිතාන්‍ය ෆාමකෝපියා (BP) සහ එක්සත් ජනපද ෆාමකෝපියා (USP) නියමයන්ට අමතරව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ (SPMC) අභ්‍යන්තර පිරිවිතරයන්ට ද අනුකූල වේ.

වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත් (cGMP) නියමයන් සහ කාර්යය පටිපාටි ක්‍රියාවේ යොදවන ආකාරය පිළිබඳව අභ්‍යන්තර ගුණාත්මකතා විගණනය සහ කම්හල් පිරික්සුම හරහා නිරීක්ෂණය සිදු කරනු ලැබේ.

# දර්ශනය

ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති ඖෂධ නිමැවුම් නිෂ්පාදනය හා අලෙවිකරණය කරන දකුණු ආසියාවේ ඇති ආදර්ශමත් ආයතනයක් බවට පත්වීම.

# අපගේ ගමන් මග

## 1987

මිලියන 500ක නිමැවුම් ධාරිතාවකින් යුත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ආරම්භ කිරීම - මිලියන 8

## 1992

ආරම්භක නිමැවුම් ධාරිතාව ඉක්මවීම - මිලියන 600

## 2007

නව වැඩ මුර මාරුවක් හඳුන්වාදීම - මිලියන 1025

## 2009

නිමැවුමේ ප්‍රමාණය දෙගුණයකින් වැඩිවීම - මිලියන 1194

# මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල සඳහා වඩා ආරක්ෂිත, ප්‍රත්‍යක්ෂ හා පහසු මිලකට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඖෂධ නිෂ්පාදනය කිරීම.

පසුගිය වසර 36 තුළ, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විශිෂ්ටත්වය උදෙසා කැපවී කටයුතු කරමින් සන්ධිස්ථාන ගණනාවක් පසු කර ඇත.

## 2023

පවත්නා පෙනිසිලින් කලාපය පුළුල් කිරීම

## 2022

නව නිෂ්පාදන 09ක් වෙළඳපළ වෙත නිකුත් කිරීම

## 2013

නිමැවුමේ ප්‍රමාණය මිලියන 2000 ඉක්මවීම - මිලියන 2003

## 2021

විශේෂිත ලෙවොතිරොක්සින් පෙති නිපැයුම් කලාපය ආරම්භ කිරීම

## 2020

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ආධාර සහිතව නිමැවුම් ධාරිතාව වැඩිදියුණු කිරීම - මිලියන 3015

# මූල්‍ය සහ මෙහෙයුම් සුවිශේෂතා

| | 2023 | 2022 |
|---|---|---|
| | රු.මි. | රු.මි. |
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | |
| ආදායම | 29,331,718,691 | 16,620,184,659 |
| දළ ලාභය | 2,949,749,462 | 2,111,797,411 |
| මෙහෙයුම් ලාභය | 1,608,247,748 | 2,061,371,072 |
| මූල්‍ය ආදායම | 622,548,970 | 330,531,099 |
| බදු පෙර ලාභය | 2,173,308,106 | 2,391,594,478 |
| බදු වියදම | 654,752,799 | 717,249,696 |
| වර්ෂය සඳහා ලාභය | 1,518,555,306 | 1,674,344,783 |
| මුළු විස්තීර්ණ ආදායම | 1,532,049,139 | 2,213,294,789 |
| **මූල්‍ය තත්වය** | | |
| තොගය | 3,911,381,608 | 3,124,019,823 |
| බැංකු සහ අතැති මුදල | 468,896,309 | 758,495,754 |
| ජංගම වත්කම් | 12,020,335,479 | 10,597,367,924 |
| මුළු වත්කම් | 16,517,179,749 | 14,700,781,968 |
| ස්කන්ධය | 11,478,973,961 | 7,393,446,129 |
| ජංගම නොවන බැරකම් | 374,934,339 | 2,981,928,520 |
| ජංගම බැරකම් | 4,663,271,449 | 4,325,407,319 |



**ආදායම**
**මිලියන**
**29,331.7**




**ශුද්ධ ලාභය**
**(බදු පෙර)**
**මිලියන**
**2,173.3**




**නිෂ්පාදන ඒකක**
**මිලියන**
**3,560**

## ආදායම (රු.මි)





## දළ ලාභය (රු.මි)





## ආදායම වර්ගීකරණය





## ස්ථාවර වත්කම් (රු.මි)




## නිෂ්පාදනය (මි)




## කාර්ය මණ්ඩලය





**වාර්ෂික වාර්තාව සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ 2023 දෙසැම්බර් මස 31න් අවසන් වසර සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇතුළත් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මා හට ඉදිරිපත් කරන්නට ලැබීම මහත් සතුටකි.**

**වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවන්ස**
සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
2024 පෙබරවාරි 28

# සභාපතිවරයාගේ සමාලෝචනය

මහජනතාවට දැරිය හැකි මිල ගණන්වලට ගුණාත්මක, ඵලදායී සහ ආරක්ෂිත ඖෂධ නිෂ්පාදනය කිරීමේ අරමුණ පෙරදැරිව 1957 අංක 49 දරන කර්මාන්ත සංස්ථා පනත යටතේ 1987 වසරේදී රාජය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) ස්ථාපනය කරන ලදී. SPMC ශ්‍රී ලංකාවේ විශාලතම සහ ප්‍රමුඛතම රාජ්‍ය ඖෂධ නිෂ්පාදකවරයාය. වර්තමානය වන විට SPMC පුළුල් පරාසයක ඖෂධ වර්ග ආවරණය වන පරිදි වර්ගීය නාමයන් යටතේ ඖෂධ වර්ග 96ක් නිෂ්පාදනය කරයි. SPMC මගින් නිපදවනු ලබන සියළු නිෂ්පාදනවල British Pharmacopeia (BP), United State Pharmacopeia (USP) සහ SPMC ප්‍රමිතීන් මගින් අවශ්‍ය කරන්නා වූ ගුණාත්මකභාවය අන්තර්ගත වේ. වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත් (cGMP), රෙගුලාසි හා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම අභ්‍යන්තර තත්ත්ව විගණනය හා කර්මාන්තශාලා අධීක්ෂණය යටතේ නිරන්තරයෙන් අධීක්ෂණය කෙරේ.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නවතම ජපන්, ජර්මන් සහ කොරියානු යන්ත්‍රෝපකරණ භාවිතා කෙරේ. නිෂ්පාදන ක්‍රියාවලිය අධි පිරිසිඳු තත්ත්වයන් යටතේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ (HWO) සහ වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත්හී (cGMP) අවශ්‍යතාවලට අනුකූල වන පරිදි සිදු කෙරේ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටින වෛද්‍යවරුන්, ඖෂධවේදීන් හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අනෙකුත් වෘත්තිකයන් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා නිෂ්පාදන අගය කරනු හා වඩා ප්‍රිය කරනු ලබයි. ගුණාත්මකභාවයෙන් යුක්ත ඖෂධ නිෂ්පාදකවරයෙක් වශයෙන් අප ලබා ඇති කීර්තිනාමය අපගේ සාර්ථකත්වයේ පදනමයි.

**කාර්යසාධනය**

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2023 වසරේදී රුපියල් මිලියන 2,173ක බදු පෙර ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී.

**නිපැයුම් ප්‍රතිඵලය**

2023 වසරේදී නිෂ්පාදනය කරන ලද පෙති/කරල් මිලියන 3,560ක නිපැයුම් ප්‍රතිඵලය SPMC හි විශාලතම නිපැයුම් ප්‍රතිඵලය ලෙස වාර්තා විය.

**පිරිවැටුම**

2023 වසර සඳහා මුළු පිරිවැටුම රු. මිලියන 29,331.7 ක් විය. එය ආරම්භයේ සිට වාර්තා වූ විශාලතම පිරිවැටුමයි. සමස්ත අලෙවිකිරීම් වලින් 91% ක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් ඒකකය සඳහා විය. මෙම ප්‍රධාන මාධ්‍යයට අමතරව, අප සමඟ ලියාපදිංචිව ඇති පුද්ගලික බෙදාහරින්නන් හරහා කරන ලද අලෙවිකිරීම් 9% කි.

SPMC හට මහා භාණ්ඩාගාරයේ කිසිඳු සහායකින් තොරව තම සම්පත් මනාව කළමනාකරණය කිරීම හරහා ලාභ ඉපැයීමට හැකිවීම පිළිබඳව මා ප්‍රකාශ කරන්නේ සතුටිනි. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2023 වර්ෂය තුල රාජ්‍ය සංස්ථාවක් වශයෙන් සිය වගකීම ඉටු කරමින් රුපියල් මිලියන 300 ක දායකත්ව මුදලක් මහා භාණ්ඩාගාරයට ලබා දී ඇත.

**සංවර්ධන කාර්යයන්**

**කර්මාන්තශාලා සංවර්ධනය**

SPMC මගින් 2023 වසරේදී පෙති සහ කරල් මිලියන 3,560ක් නිෂ්පාදනය කරන ලදී.

**පුළුල් කිරීමේ ව්‍යාපෘතිය**

වසර 2023 දී, කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය (CERHSP) යටතේ ඖෂධ නිපදවීමේ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා සහ දැනට පවතින පෙනිසිලින් කලාපය පුළුල් කිරීම සඳහා ලෝක බැංකුව විසින් රුපියල් මිලියන 630 ක අරමුදලක් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත ප්‍රදානය කරන ලදී.

**පර්යේෂණ සහ බෙහෙත් වට්ටෝරු සංවර්ධනය**

අදාළ කාල සීමාව තුළ පහත සඳහන් නව ඖෂධ නිෂ්පාදන සඳහා අවශ්‍ය බෙහෙත් වට්ටෝරු අනුමැතිය ලබාගෙන ඇත.

නිකොරන්ඩිල් පෙති බී පී මිලි ග්‍රෑම් 10
මෙට්ෆොමින් එස් ආර් පෙති අයි පී මිලි ග්‍රෑම් 500
ටෙල්මිසාටන් පෙති අයි පී මිලි ග්‍රෑම් 20
ටෙල්මිසාටන් පෙති අයි පී මිලි ග්‍රෑම් 40
මයිකොපෙනොලේට් මොෆෙටිල් පෙති මිලි ග්‍රෑම් 250
මොන්ටෙලුකස්ට් පෙති අයි පී මිලි ග්‍රෑම් 5
මොන්ටෙලුකස්ට් පෙති අයි පී මිලි ග්‍රෑම් 10

**මානව සම්පත් සංවර්ධනය සහ සහ සාධනය**

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ මගපෙන්වීම යටතේ සේවා වැඩ මුර දෙකක් තුළ සේවා කටයුතු කාර්යක්ෂමව සහ බාධා විරහිතව ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා අභ්‍යාසලාභීන් 16 දෙනෙකු සහ කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 05 දෙනෙකු ඇතුළුව 2023.12.31 දින වන විට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි සේවක සේවිකාවන් 345 දෙනෙකු සේවයේ යෙදී සිටියේ ය.
සේවකයන් විසින් ඉල්ලීම් කරන මූලික සුහසාධන පහසුකම් SPMC මගින් අඛණ්ඩව සපයනු ලබයි.

**ක්‍රමෝපායන් සහ අපේක්ෂාවන්**

අපගේ මූලික අරමුණ වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය (MSD), රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ (SPC) ඔසුසැල් සහ වෛද්‍ය වෘත්තිකයන්ට අවශ්‍ය කරන්නා වූ නිෂ්පාදන අඛණ්ඩව සැපයීමයි.

හොරණ මිල්ලෑව නගරයේ නව කර්මාන්තශාලා පිහිටුවීම මගින් නිෂ්පාදන ධාරිතාවය පුළුල් කර ගැනීමට SPMC අපේක්ෂා කරයි. ඒ අනුව,

- මුඛයෙන් ලබාදෙන ඝණ ඖෂධ මාත්‍රා (OSD) නිෂ්පාදනය සඳහා යන්ත්‍රෝපකරණ සහිත කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට SPMC අපේක්ෂා කරයි.

නිෂ්පාදනය ඉහළ නැංවීමට, අලෙවි ආදායම් වැඩි කර ගැනීමට, නිෂ්පාදන පරාසය පුළුල් කර ගැනීමට සහ නව රැකියා අවස්ථා නිර්මාණය කිරීමට, තාක්ෂණික දැනුම ඉහළ නංවාගැනීමට සහ SPMC හි ආයතනික නාමයක් නිර්මාණය කිරීමට අපට මෙම නිෂ්පාදන ධාරිතා පුළුල් කිරීම් උපකාරී වනු ඇත.

**තුති පිදුම**

ශ්‍රී ලංකාවේ ඖෂධ කර්මාන්තයේ ප්‍රගතිය උදෙසා අඛණ්ඩව කැපවීම වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම ස්තූතිවන්ත වෙමි. ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතාට සහ ගරු අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතාට ද, ඔවුන්ගේ වටිනා මඟ පෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් මම මගේ කෘතඥතාව ඔවුන් වෙත පුද කර සිටිමි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, ජනක චන්ද්‍රගුප්ත මහතා සහ වෛද්‍ය පී.ජී. මහීපාල මහතා ඇතුළු සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරි මණ්ඩලය විසින් සලසා දෙන ලද මග පෙන්වීම ද මෙහි ලා අපි අතිශයින් අගය කරන්නෙමු. එමෙන්ම, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, මහින්ද සිරිවර්ධන සහ රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ ජනරාල්, පී.ඒ.එස්. අතුල කුමාර යන මහත්වරුන් හා මහා භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තුවල සේවයේ නිරත නිලධාරීන් හට ද, ඔවුන් අප වෙත දක්වන ලද ඔවුන්ගේ මහඟු දායකත්වය වෙනුවෙන් අපගේ තුති ප්‍රණාමය මෙයින් හිමි වේ.

අපගේ ආයතනයේ සාර්ථකත්වය සඳහා විශාල දායකත්වයක් සැපයූ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC), වෛද්‍ය සැපයුම් අංශය (MSD), පුද්ගලික ඔසුසැල් සහ වෛද්‍ය වෘත්තිකයන් කෘතඥපූර්වකව සිහිපත් කරන්නේ මහත් සතුටකිනි.

2023 වසර තුළදී ධනාත්මක ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා කළමනාකාර අධ්‍යක්ෂ, සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, කළමනාකරුවන්, විධායක කාර්ය මණ්ඩලය සහ SPMC හී සියළුම මට්ටම්වල සේවකයන්ගේ කැපවීම අති මහත් ලෙස අගය කළ යුතු වේ.

අවසන් වශයෙන්, සංස්ථාව සාර්ථකත්වය කරා මෙහෙයවීමට වටිනා දායකත්වයක් සහ මඟපෙන්වීමක් ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පිරිනැමිය යුතුය.

**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, වසර 36 කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. මෙම කාල පරිච්ඡේදය තුළ, අප සංස්ථාව සිය ඖෂධ අලෙවිකරණ සහ නිෂ්පාදන පදනම සාර්ථකව සංවර්ධනය කර ශක්තිමත් කර ඇති අතර, වේගයෙන්ම වර්ධනය කරා ලඟා වන ජාතික ඖෂධ සමාගම බවට පත්වීමේ ගෞරවය දිනා ගැනීමට එම වැඩපිළිවෙළ ඔස්සේ අපට හැකි විය.**

**එස්.ඩබ්. ජයසුන්දර**
සාමාන්‍යාධිකාරිණී
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව



# සාමාන්‍යාධිකාරිතුමියගේ පණිවිඩය

සංස්ථා ඉතිහාසයේ ඉහළම විකුණුම් ආදායම් (රු. බිලියන 29) සහ ඉහල බදු පෙර ශුද්ධ ලාභයක් (රු.බිලියන 2) අත් කර ගනිමින්, ස්වකීය විකුණුම්වල සහ ශුද්ධ ලාභය (බදු ගෙවීමට පෙර) තුළ ශක්තිමත් වර්ධනයක් සමග 2023 වර්ෂයේ දී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සාක්ෂාත් කරගත් කාර්ය සාධනය විශිෂ්ට ජයග්‍රහණයක් වූ බව පැවසීමට මම ආඩම්බර වෙමි.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, තවදුරටත් වර්ධනය වෙමින් ඉදිරියට යන බව අපගේ තිර විශ්වාසයයි. වර්ෂ 2022 - 2026 යන කාල පරිච්ඡේදය තුළ, හොරණ - මිල්ලෑව ප්‍රදේශය ආශ්‍රිතව, "ලෝටස් ෆාමා" නමැති ව්‍යාපෘතිය යටතේ, නව නිෂ්පාදන කම්හලක්, එනම්, මුඛයෙන් ලබාදෙන ඝන ඖෂධ මාත්‍රා නිපැයුම් සඳහා පිහිටුවීම අපගේ ප්‍රමුඛ අවධානයට ලක්ව ඇති කාර්යයක් වේ.

ව්‍යවසායකත්වයේ හරයාත්මක වටිනාකම් සමග අනුබද්ධ වෙමින්, ශක්තිමත් වැඩ ආචාර ධර්ම සහ පුළුල් පරාසයක නිෂ්පාදන මාලාවක් සහිතව වර්තමානයට උචිත යහපත් නිෂ්පාදන පිළිවෙත් (cGMP ) සමග දැඩි අනුකූලතාවයකින් යුතුව කටයුතු කරමින්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතම ඖෂධ නිෂ්පාදකයින් අතරට ප්‍රවිෂ්ට වී තිබේ.

අවසාන වශයෙන්, 2023 වසර තුළ දී මා වෙත ලබා දුන් සහාය සහ සේවා කැපවීම වෙනුවෙන් සභාපතිතුමන්, අධ්‍යක්ෂ මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් හා මහා භාණ්ඩාගාර නිලධාරීන්ට ද, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට අයත් සියලුම සේවක සේවිකාවන්ට ද මම මගේ තුති ප්‍රණාමය පළ කිරීමට කැමැත්තෙමි.

# අධ්‍යක්ෂක මණ්ඩලය

වෛද්‍ය උත්පල ඉන්ද්‍රවංස මහතා
සභාපති

වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන මහතා
අධ්‍යක්ෂ

වී.පී. චමින්ද වික්‍රමරත්න මහතා
අධ්‍යක්ෂ

යූ.එස්.කේ. දෙනාවත්ත මහත්මිය
අධ්‍යක්ෂ

ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය
අධ්‍යක්ෂ



# අධ්‍යක්ෂවරු



**වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවංස**

**සභාපති**

වෛද්‍ය උත්පල ඉන්ද්‍රවංස මහතා රුසියාවේ ප්‍රමුඛපෙළේ වෛද්‍ය විද්‍යාලයක් වන සෙනෝව්-වන් වෛද්‍ය විද්‍යාලයෙහි (Medical Academy of Sechenov - one) අධ්‍යාපනය හදාරා ඇති අතර ඔහුගේ සීමාවසික පුහුණුව අවසන් කරන ලද්දේ පොළොන්නරුව මහ රෝහලේය.

පුලස්තිපුර ග්‍රාමීය රෝහලේ ආයතන භාර වෛද්‍ය නිලධාරී ලෙස කටයුතු කරමින් සිටින කාලයේදී 2007 වසරේ 5S ඵලදායීතා පළාත් සම්මානය ලබා ගැනීමට ඔහු පුරෝගාමී වී ඇත, එම කාලසීමාවේදීම වෛද්‍ය කාණ්ඩයෙන් සහ රෝහල් කාණ්ඩයෙන් විශිෂ්ඨ සෞඛ්‍ය සම්මානය ද ඔහු විසින් දිනාගෙන ඇති එතුමන් 2009 වසරේ පටන් ජාතික රෝහලේ, විකලාංග ඒකකයේ හදිසි අනතුරු සේවා අංශයේ සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් 2019 වසරේ පටන් සේවය කරයි.



**වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන**

**අධ්‍යක්ෂ**

විශේෂඥ වෛද්‍ය බන්දුල විජේසිරිවර්ධන මහතා රාජ්‍ය සෞඛ්‍යාරක්ෂණ ක්ෂේත්‍රයේ වසර 33 කට වැඩි පළපුරුද්දක් සහිත අයෙක් වන අතර ඔහු වෛද්‍ය විද්‍යාව සඳහා ප්‍රධාන පරීක්ෂක, MCQ ප්‍රධාන සමූහයේ සභාපති, AAAED කමිටුවේ සාමාජික සහ 2005 වසරේදී ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාපති වශයෙන් ද කටයුතු කර ඇත.

ඔහු වර්තමානයේ පූර්ණකාලීනව පෞද්ගලික සෞඛ්‍යාරක්ෂණ ක්ෂේත්‍රයේ සේවය කරයි. මේ වන විට දිවයින පුරා භාවිතා වන සායනික පුහුණු මාර්ගෝපදේශ, ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය හරහා හඳුන්වාදීමට වෛද්‍ය විජේසිරිවර්ධන මහතා පුරෝගාමී වී ඇත.

ඔහුගේ නමට පළ වන ජාතික මෙන්ම ජාත්‍යන්තර පලකිරීම් ගණනාවක් අතරේ, 2000 වසරේදී සායනික පර්යේෂණය සඳහා ජනාධිපති සම්මානය වෛද්‍ය විජේසිරිවර්ධන මහතා විසින් දිනා ගන්නා ලදී. එමෙන්ම රෝයල් ඔස්ට්‍රේලියන් කොලේජ් ඔෆ් ෆිසීෂියන්ස් (The Royal Australian College of Physicians) සහ දකුණු අප්‍රිකාවේ කොලේජස් ඔෆ් මෙඩිසින් (Colleges of Medicine in South Africa) මගින් ගෞරව සාමාජිකත්වය ද එතුමන්ට පිරිනමන ලදී.

වෛද්‍ය බන්දුල විජේසිරිවර්ධන මහතා MBBS (කොළඹ), MD (කොළඹ) සහ MRCP (UK) දරන අතර ඇමරිකානු වෛද්‍යවරුන්ගේ විද්‍යාලයෙහි (American College of Physicians) සහ ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලයෙහි (Ceylon College of Physicians) සාමාජිකයෙකි.



**ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය**

**අධ්‍යක්ෂ**

ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය 2022 අප්‍රේල් මාසයේ දී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනියක, අධ්‍යක්ෂවරියක සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල වසර 17 කට වඩා වැඩි සේවා පළපුරුද්දක් ඇය සතුව ඇත.

ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය දැනට මුදල් අමාත්‍යාංශයීය භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරියක් සහ සහකාර අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කරන අතර Colombo Lotus Tower (Pvt) Ltd හී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස ද කටයුතු කරන්නී ය.

ඇය කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්, බී.සී.සී (ලංකා) ලිමිටඩ්, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි නීතිගත සංස්ථාව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කර ඇත. ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය මීට පෙර රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනියක ලෙසත්, ටයිම් ගාර්මන්ට්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ් ආයතනයෙහි ගණකාධිකාරිවරියක ලෙසත් සේවය කර ඇත.

ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ද, කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත.



**වී.ජී. චමින්ද වික්‍රමරත්න මහතා**

**අධ්‍යක්ෂ**

වී.ජී. චමින්ද වික්‍රමරත්න මහතා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් වශයෙන් 2020 ජනවාරි පටන් සේවය කරන අතර ඔහුට SMI ඉන්ජිනියරින් පුද්ගලික සමාගමේ නිර්මාතෘ වශයෙන් ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ විසි වසරකට වැඩි පළපුරුද්දක් ඇත.

ඔහු ජාතික තරුණ සේවා සභාවේ (2005-2008), මහජන කාර්ය සාධන මණ්ඩලයේ ජාතික චිත්‍රපට සංස්ථාවේ (2008-2010) සහ ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගමේ (2012-2015) අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කර ඇත.

වර්තමානය වන විට ඔහු හරිත TV ජාල පුද්ගලික සමාගමේ සහ Ariike පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ තනතුර දරයි. ඊට අමතරව ඔහු ජාතික දුම්රිය කෞතුකාගාර කමිටුවේ ද සාමාජිකයෙකි.



**යූ.එස්.කේ. දෙනාවත්ත මහත්මිය**
**අධ්‍යක්ෂ**

යූ.එස්.කේ. දෙනාවත්ත මහත්මිය දැනට ඖෂධ නිෂ්පාදන, සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිපාලන) ලෙස සේවය කරයි.

එතුමිය කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) සහ ව්‍යාපෘති කළමණාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධිය (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) ලබා ඇත.

දෙනාවත්ත මහත්මිය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක් ලෙස (2000-2001) සහ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ (2001-2010) අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කර ඇත. 2010 වර්ෂයේදී ඇය පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ජනදිරිය) ලෙස කටයුතු කළාය. එතුමිය පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ (2011-2017) සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ (2017-2021) ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරියක ලෙසද සේවය කර ඇත.

ඉදිරි පෙළ

ආර්.එම්.ආර්.එම්. රණසිංහ මහතා
ආර්. ධර්මදාස මහතා
එස්.පී. ජයවීර මහතා
එස්.ඩබ්. ජයසුන්දර මහත්මිය
වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවංස මහතා
ඒ.ජී.ඩී.එස්. අතුරලිය මහත්මිය
පී.ඩී. ජයසුන්දර මහතා
සී.ඩී. මගිනආරච්චි මහත්මිය
ඒ.එම්.ටී.පී. කුලසේකර මහත්මිය

# SPM
## කළමනාකරණ කණ්ඩායම




පසු පෙළ

ඒ.සී.පී. ආනන්දකුමාර  මහත්මිය
සී.එස්. ඔබේසේකර මහත්මිය
එස්. වික්‍රමසිංහ මහතා
වයි.එම්.පී. කුමාර මහතා
ජේ.එම්.එස්. ජයසුන්දර මහතා
එම්. බෙනරගම මහතා
බී.වී.එච්.පී.එස්. කුමාර මහතා
පී. දන්තනාරායන මෙනවිය




# ආයතනික



සභාපති / කළමණාකාර අධ්‍යක්ෂ
සාමාන්‍යාධිකාරී
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නිෂ්පාදන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -තත්ත්ව පාලන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වට්ටෝරු පර්යේෂණ සහ සංවර්ධන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු
කළමනාකරු - නිෂ්පාදන
කළමනාකරු - තත්ත්ව පාලන
කළමනාකරු - තත්ත්ව සහතිකකරණය
කළමනාකරු - වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන
කළමනාකරු - ඉංජිනේරු
කළමනාකරු - තොරතුරු තාක්ෂණ
කළමනාකරු - නිරාපද
ඖෂධ තාක්ෂණවේදී - නිෂ්පාදන
තත්ත්ව පාලන නිළධාරී
තත්ත්ව සහතික නිළධාරී
රසායනඥ
නියාමන කටයුතු නිළධාරී
ඉංජිනේරු සහකාර - විදුලි / යාන්ත්‍රික
ප්‍රවාහන නිළධාරී
ඉංජිනේරු සහකාර - පරිගණක දෘඪාංග
පද්ධති විශ්ලේෂක

# ව්‍යුහය


නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සැලසුම් සහ ප්‍රසම්පාදන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත්
කළමනාකරු - සැලසුම් සහ ප්‍රසම්පාදන
කළමනාකරු - අලෙවි
කළමනාකරු - මූල්‍ය
කළමනාකරු - මානව සම්පත්
කළමනාකරු - පුහුණු සහ සංවර්ධන
නීති නිළධාරී
අභ්‍යන්තර විගණක
ඖෂධ තාක්ෂණඥ-
සැලසුම් සහ ප්‍රසම්පාදන
අලෙවි නිළධාරී
මූල්‍ය නිළධාරී
මානව සම්පත් / පරිපාලන නිළධාරී
පුහුණු සහ සංවර්ධ නිළධාරී
පුද්ගලික ලේකම්
අභ්‍යන්තර විගණන නිළධාරී

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව



රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිය විගණිත ගිණුම් වාර්තා ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. ගිණුම් වාර්තා පිටු 36-73 දක්වා ඇත.

## ප්‍රධාන කාර්යයන්

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ,

- ස්වකීයව හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, හෝ නැවත ඇසුරුම් කිරීම.
- පාලිත සමාගම් නිර්මාණය කිරීම.
- අනාගත ආයෝජකයින් සමඟ ජාත්‍යන්තර ගිවිසුම්වලට එළඹීම.
- ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
- ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතිකරණය කිරීම.
- සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මඟින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මඟින් කරන ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම.

## ව්‍යාපාර සමාලෝචනය

2023 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාර්යයන් හි තත්වය පිළිබඳ තොරතුරු අඩංගු ශේෂ පත්‍රය 37 පිටුවේ දක්වා ඇත. අදාල මූල්‍ය වර්ෂයේ සංස්ථාවේ තක්සේරුව පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනය පිටු 06 සිට 08 දක්වා ඇත.

## පිරිවැටුම සහ ප්‍රතිඵල

2023 වර්ෂයේ පිරිවැටුම සහ ප්‍රථිඵල ඇතුලත් ආදායම් ප්‍රකාශය හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය පිළිවෙලින් 36 සහ 39 පිටු වල දක්වා ඇත.

## අනාගත සංවර්ධන කාර්යයන්

ව්‍යාපාරයේ අනාගත සංවර්ධනය පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනය පිටු අංක 06 සිට 08 දක්වා ඇත.

## දේපළ, පිරියත සහ උපකරණ

අදාල වර්ෂය තුළ ව්‍යාපාරයේ දේපළ, පිරියත සහ උපකරණ ඇතුලත් වාර්තා 64 පිටුවේ මූල්‍ය ප්‍රකාශයෙහි 10 වන සටහන මගින් දක්වා ඇත.

## ලාභාංශ / දායකත්වය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලාභාංශ ලෙස රු.300,000,000 ක දායකත්වයක් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට ගෙවා ඇත.

## සංචිත

මුළු සංචිත ප්‍රමාණය හා ඒවායේ සංයෝජනය ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය මගින් 39 පිටුවෙහි දක්වා ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. එක් අධ්‍යක්ෂවරයෙක් මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් වන අතර අනෙක් අධ්‍යක්ෂවරයා සෞඛ්‍ය අමාත්‍යංශය නියෝජනය කරයි. නව අධ්‍යක්ෂ මණ්ඩලය 2020 වර්ෂයේ ජනවාරි මස පත් කරන ලදි.

අදාළ කාලපරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08 ක් පැවැත්වූ අතර අදාල කාලපරිච්ඡේදය සඳහා සංස්ථාවේ කටයුතු සම්බන්ධ වගකීම සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ඇත.

| | | |
|---|---|---|
| වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවංස | - | සභාපති |
| වෛද්‍ය බන්දුල සී විජේසිරිවර්ධන | - | අධ්‍යක්ෂ |
| ඒ.ආර්.වික්‍රමසිංහ | - | අධ්‍යක්ෂ |
| වී.ජී. චමින්ද වික්‍රමරත්න | - | අධ්‍යක්ෂ |
| යූ.එස්.කේ. දෙනාවත්ත | - | අධ්‍යක්ෂ |

## ගිණුම් ප්‍රතිපත්ති

සංස්ථාව උපයෝගී කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 42 සිට 53 දක්වා පිටුවල ඇත.

## පරිසර සංරක්ෂණය

සිය ක්‍රියාකාරීත්වය තුළින් පරිසරයට අහිතකර ප්‍රතිඵලයක් ඇති නොවන පරිදි කටයුතු කිරීම සහ ඉහළම ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදන අපගේ පාරිභෝගිකයන්ට සහ ප්‍රජාවට ලබා දීමෙන් ඔවුන්ට වාසිදායක ප්‍රතිඵලයක් ඇති කිරීම සංස්ථාවේ වගකීම වේ.

## ව්‍යවස්ථානුකූල ගෙවීම්

ශේෂ පත්‍ර දිනට රජයට හා සේවකයන්ට අදාල සියලුම ව්‍යවස්ථානුකූල ගෙවීම් කර තිබේ.

## ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන් හි සැකසීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනයේ සිට සිදුවී නොමැත.

## අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශයන් මූලිකවම පිළියෙල කරන ලද්දේ අඛණ්ඩ පැවැත්ම යන සංකල්පයට අනුකූලවයි. සංස්ථාව සතුව ප්‍රමාණවත් සම්පත් පවත්නා බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය එහි අනාගත මෙහෙයුම් පිළිබඳව සෑහීමකට පත් වේ.

## විගණකවරුන් පත් කිරීම

1971 මූල්‍ය පනත ප්‍රකාරව විගණකාධිපතිවරයා සංස්ථාවේ විගණක වන අතර, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව වාර්ෂික විගණනය විගණකාධිපතිවරයා විසින් කරන ලදී.

වෛද්‍ය පී.පී.ජී.පී.යූ ඉන්ද්‍රවංස
සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
28.02.2024

# විගණන කමිටු වාර්තාව - 2023



රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද, 2021.11.17 දින සිට බලපැවැත්වෙන පරිදි රජය සතු ව්‍යවසායයන් සඳහා ආයතනික පාලන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව විගණන කමිටුව පිහිටුවා ඇත.

ඉහත මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව 2022.12.01 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ විගණන කමිටු ප්‍රඥප්තිය (Audit Committee Charter) මඟින් විගණන කමිටුව මෙහෙයවන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම් වල ප්‍රමාණාත්මක බව සඳහා වන සිය වගකීම ඉටු කිරීම, මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා, ආයතනයට අදාල අණ පනත්වල තොරතුරු අවශ්‍යතා, සමාගම් පනත සහ අනෙකුත් මූල්‍ය වාර්තාකරණයට අදාල රෙගුලාසි සහ අවශ්‍යතාවලට අනුකූල වීම, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවල අවශ්‍යතා සපුරාලීම සඳහා ආයතනයේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි වල ප්‍රමාණාත්මක බව සහතික කිරීම, ආයතනයේ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්යසාධනය සහතික කිරීම, අධීක්ෂණය, කළමනාකරණය සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ ප්‍රධාන කළමණාකාරිත්වය හා සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු වාර්තා කිරීම යන වගකීම් ඉටු කිරීමේදී විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය ලබා දෙනු ලැබේ.

## උක්ත මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව

- වර්ෂය තුළදී සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විත වූ විගණන කමිටුවෙහි සභාපතිත්වය දරනු ලැබුවේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරිය විසිනි.
- ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයින් ලෙස මෙම රැස්වීම් වලට සහභාගී වූහ.
- රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අභ්‍යන්තර විගණක රැස්වීම්වල කැඳවුම්කරු ලෙස කටයුතු කළේය.

ජාතික විගණන කාර්යාලයේ සහකාර විගණකාධිපති 2022 වර්ෂයට අදාලව විගණකාධිපති වාර්තාවේ කෙටුම්පත සාකච්ඡා කිරීම සඳහා නිරීක්ෂකයෙකු ලෙස විගණන කමිටු රැස්වීම් වාර 02 කට සහභාගී විය.

විගණන කමිටුවේ ආරාධනය මත රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයා විගණන කමිටු රැස්වීම් වලට සහභාගී විය.

වර්ෂය තුළ අවම වශයෙන් මාස තුනකට වරක් රැස්වීමක් පැවැත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ වන පරිදි කමිටු රැස්වීම් පහක් (05) පැවැත්විණි.

## 2023 වසර තුළ කමිටුව විසින්,

- ගෙවීම්, විකුණුම්, මුදල් පාලනය, වැටුප් පරිවර්තනය කිරීම, ගිණුම්කරණ ප්‍රමිත යෙදීම්, වැටුප් හා වේතන, අමු ද්‍රව්‍ය හා නිමි භාණ්ඩ තොග සහ වෙළඳ ණයගැතියන් යන ක්ෂේත්‍රයන්ට අදාලව හඳුනාගන්නා ලද අඩුපාඩු හා විගණන නිර්දේශයන් ඇතුලත් අභ්‍යන්තර විගණන වාර්තා පහලවක් (15) සමාලෝචනය කර පෙන්වාදී ඇති අඩුපාඩු මඟ හරවා ගැනීමට කළමනාකාරීත්වය විසින් ගන්නා ලද පසු විපරම් ක්‍රියාමාර්ග යන් පිළිබඳව සලකා බලන ලදී.
- තොග, වැටුප් ගෙවීම්, මුදල් පාලනය, ණයගැතියන් හා විකුණුම් යන ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර පාලන පද්ධති දහ තුනක (13) ප්‍රමාණාත්මක බව සහ සඵලත්වය පිළිබඳව සලකා බලා පවතින පාලනයන් වැඩි දියුණු කිරීමට සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.
- 2019 සහ 2020 වර්ෂ වලට අදාලව විගණකාධිපති වාර්තා මඟින් පෙන්වා දී ඇති නොවිසඳුණු ගැටළු පහක් (05) පිළිබඳව සලකා බලා, එහි ඇතුලත් ඉදිකිරීම් හා කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා, නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවන පරිදි සේවක බඳවා ගැනීම්, භාවිතයට ගත නොහැකි ස්ථාවර වත්කම් විධිමත් ලෙස අපහරණය නොකිරීම යන ගැටළු නිවැරදි කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් ගෙන ඇති පසුවිපරම් ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කර ඇත.
- 2022 වර්ෂයට අදාලව විගණකාධිපති වාර්තාවේ කෙටුම්පත සමාලෝචනය කර පෙන්වා දී ඇති ගිණුම්කරණ හා මූල්‍ය වාර්තාකරණ දුර්වලතා, නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවන පරිදි සේවක බඳවා ගැනීම්, භාණ්ඩ මිල කිරීම්, සේවක ණය හා විශ්‍රාම පාරිතෝෂික ගෙවීම්, සේවක ප්‍රවාහනය, පැමිණීම හා සේවා වැඩ මුර සම්බන්ධ දීමනා ගෙවීම්, ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් යනාදී ගැටළු සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳව අවධානය

යොමු කර ඉතා ඉහළ විනිශ්චයක් ලබාදිය යුතු ක්ෂේත්‍රයන් පිළිබඳව සුදුසු නිර්දේශයන් ලබා දෙන ලදී.

- 2022 වර්ෂයට අදාලව අවසන් විගණකාධිපති වාර්තාව සමාලෝචනය කර එහි සඳහන් වසර පහක (05) කාලයක් තුල පුනරාවර්තනය වූ ගැටළු වන නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම්, ක්‍රියාකාරී සැලැස්ම, අලෙවි සැලැස්ම හා මාසික නිෂ්පාදන සැලැස්ම සම්බන්ධ අඩුපාඩු, ඉදිකිරීම් හා කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා, භාණ්ඩ මිල කිරීම හා විකිණීම, මානව සම්පත් කළමනාකරණය, ස්ථාවර වත්කම් හා ණයගැතියන් සම්බන්ධ අඩුපාඩු, බද්ධ ව්‍යාපාර ගිවිසුම් වලට අනුකූල නොවීම් ඇතුළු ගැටළු 31 ක් පිළිබඳව අවධානය යොමු කර සුදුසු නිර්දේශයන් ලබා දෙන ලදී.

- 2022.12.1 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර, විනිමය අලාභ වර්ගීකරණය සහ අඩමාණ ණය වෙන්කිරීම් සම්බන්ධයෙන් සුදුසු නිර්දේශයන් නිකුත් කරන ලදී.

- අමු ද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය, නොනිමි වැඩ, නිමි භාණ්ඩ, වට්ටෝරු පර්යේෂණ ද්‍රව්‍ය, ස්ථාවර වත්කම්, යන්ත්‍ර අමතර කොටස් හා භාවිතයට ගත නොහැකි විවිධ ද්‍රව්‍ය සම්බන්ධයෙන් දැනට පවතින අපහරණ පටිපාටියට කරන ලද සංශෝධනයන් සලකා බලා නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

- අමු ද්‍රව්‍ය, නිමි භාණ්ඩ හා විකුණුම් යන ක්ෂේත්‍රයන්ට අදාලව ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීමේ පද්ධතියෙන් (ERP) ලබා ගන්නා තොරතුරු වල නිරවද්‍යතාවය පිළිබඳව අවධානය යොමුකර ඇත.

- නියාමන අවශ්‍යතා, අභ්‍යන්තර විගණකගේ සහ ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයාගේ අදහස් ඇතුළුව පාඩු කපා හැරීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කොට ප්‍රතික්ෂේපිත අමු ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය තොග පිළිබඳව නිර්දේශයන් ලබා දී ඇත.

- අවදානම් හා එහි බලපෑම් මත පදනම්ව පිළියෙල කරන ලද, 2024 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර ඇත.

- පහත ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් අවධානය යොමු කර නිර්දේශයන් ලබා දී ඇත.

  1. වෛද්‍ය සැපයුම් අංශයෙන් (Medical Supplies Division) සංස්ථාව වෙත අය වියයුතු හිඟ ණයගැති ශේෂය.
  2. පවතින HRM හා Payroll යන පද්ධති ඒකාබද්ධ කිරීම.
  3. 2024 වර්ෂය සඳහා වූ වාර්ෂික අයවැය.
  4. බදු ගැටළු අවම කිරීම සඳහා අවසාන බද්ද ගණනය කිරීමට විගණන ආයතනයක සේවය ලබා ගැනීම.

විගණන කමිටුවේ කාර්ය පැවරුම් නියමයන් සියලු ප්‍රමාණාත්මක කරුණු සම්බන්ධයෙන් අනුකූල වූ බව කමිටුවේ මතයයි.

## රැස්වීම්වලට සහභාගී වීම

| සාමාජිකයාගේ නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| ඒ.ආර්. වික්‍රමසිංහ | 5/5 |
| වී.ජී.සී. වික්‍රමරත්න | 4/5 |
| යූ.එස්.කේ. දෙනාවත්ත | 4/5 |

## විගණන කමිටු සාමාජිකයින්

| | | |
|---|---|---|
| ඒ.ආර්. වික්‍රමසිංහ | -සභාපතිනි | -අධ්‍යක්ෂ - රා.ඖ.නි.ස./ අධ්‍යක්ෂ (වැඩබලන) - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව |
| වී.ජී.සී. වික්‍රමරත්න | -සාමාජික | -අධ්‍යක්ෂ - රා.ඖ.නි.ස. |
| යූ.එස්.කේ. දෙනාවත්ත | -සාමාජික | -අධ්‍යක්ෂ - රා.ඖ.නි.ස./ අතිරේක ලේකම් (දේශීය වෛද්‍ය අංශය) සෞඛ්‍ය අමාත්‍යාංශය |

ඒ.ආර්. වික්‍රමසිංහ
විගණන කමිටුවේ සභාපතිනි
2024.02.21

# ආයතනික පාලන වාර්තාව



ආයතනික පාලනය යනු ඉහළ විනිවිදභාවය, නිරවද්‍ය හා කාලීන මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කිරීම මගින් ආයතනයට සම්බන්ධ පාර්ශවයන්ගේ (ආයෝජකයින්, සේවකයින්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින්, රජය සහ ප්‍රජාව) අභිමතාර්ථ සාධනය උදෙසා කළමනාකරණය විසින් ආයතන අධ්‍යක්ෂණය සහ පාලනය කරන ක්‍රම පිළිවෙලයි.

සංස්ථාපිත පාලන සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණ, ඖෂධවේද, වෛද්‍ය විද්‍යාව, අලෙවිකරණය, මූල්‍ය හා පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීමය සහ අත්දැකීම් බහුල පුද්ගලයන්ගෙන් සැදුම් ලබයි.

විධායක අධ්‍යක්ෂවරයෙකු වන සභාපතිවරයා සහ විධායක නොවන අධ්‍යක්ෂවරු හතර දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවකදී හෝ ගරු ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොමැති විටකදී හැර අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වේ. අවශ්‍ය විටෙකදී විශේෂ රැස්වීමක් පැවැත්වීමට ද කටයුතු කරනු ලැබේ.

සමාලෝචනයට ලක් වූ කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අටක් පැවැත්වුණි.

## කළමනාකරණ කමිටුව

සංස්ථාපිත කළමනාකරණ කමිටුවේ සභාපති තනතුර සංස්ථාවේ සභාපතිවරයා විසින් හොබවනු ලැබේ. අනෙකුත් කමිටු නිළධාරීන් වන්නේ සංස්ථාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ නියෝජ්‍ය ප්‍රධානීන් ය.

සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ සහ උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම මෙන්ම අවශ්‍ය විටෙක ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සුදුසු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ආදී කටයුතු කළමනාකරණ කමිටුව මගින් සිදුකෙරේ. කළමනාකරණ කමිටුව මාසිකව රැස්වේ.

## විගණන කමිටුව

"යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ" සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටුව පිහිටුවා ඇත.

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙන අතර සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විත වේ. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධක්ෂවරයා කමිටුවේ සභාපති වේ.

සංස්ථාවේ කාර්යයන් පරීක්ෂා කිරීම සහ ඇගයීම් විගණන කමිටුව විසින් ස්වාධීනව කරනු ලැබේ. අභ්‍යන්තර විගණන කාර්යයන්, විගණන කමිටුවේ අනුමැතිය මත පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කෙරෙන අතර එය විගණකාධිපතිවරයාගේ දැනුවත් වීමට ද යොමු කෙරේ.

අදාල කාල පරිච්ඡේදය තුළදී විගණන කමිටු රැස්වීම් පහක් පැවැත්වුණි. විගණන කමිටුවේ වාර්තාව පිටු අංක 20 හි දක්වා ඇත.

## ආයෝජකයන්ගේ සම්බන්ධතා සහ පොදු වගකීම

ජනතාව වෙනුවෙන් රජය විසින් පොදු ව්‍යාපාර පිහිටුවීම, අයිතිය පවත්වා ගෙන යාම සහ මෙහෙයවීම කරනු ලැබේ. එම නිසා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරුවන් ආයතනය පාලනය කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයටත් මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයටත් වගකිව යුතු වේ. මෙම වගකීම සපුරාලමින් වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තු සඳහා ප්‍රගති වාර්තා ආදිය එම අමාත්‍යාංශ වලට ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය සම්බන්ධව අවසාන අධිකාරී බලය ජනතා නියෝජිතයින් නියෝජනය කරන්නා වූ පාර්ලිමේන්තුව සතුව පවතින බව ප්‍රජාතන්ත්‍රවාදී ලෝකය විසින් පිළිගෙන ඇත.

ආයතනයේ ප්‍රගතිය, මූල්‍ය වාර්තා, විගණන වාර්තාව ඇතුලත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

පොදු ව්‍යාපාරයක් ලෙස සංස්ථාව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර සඳහා වන පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) වගකියනු ලැබේ.

## වේතන ප්‍රතිපත්තිය

සංස්ථාවේ වේතන ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත පිහිටුවා සකසා ඇත.

අධ්‍යක්ෂ වේතන සහ අනෙකුත් දීමනා මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන රාජ්‍ය සංස්ථා වලට අදාල වේතන හා දීමනා සඳහා වන චක්‍රලේඛ මත පදනම්ව ගෙවනු ලැබේ.

සේවක වේතන රාජ්‍ය පරිපාලන වැටුප් තලයන් පාදක කර ගනිමින් සංස්ථාව විසින් පිළියෙල කරන ලද වැටුප් තලයන් අනුව මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවේ අනුමැතිය ඇතිව ගෙවනු ලැබේ.

කාර්යසාධනය මත ඍජුවම අගය කිරීමක් ලෙස කාර්යසාධන දිරිදීමනාව හඳුනාගෙන ඇත.

## අභ්‍යන්තර පාලනය

ආයතනය විසින් එළඹෙන සියලු ගනුදෙනු සඳහා නියමිත අධිකාරිය ලැබුන බවටත්, සටහන් ගත කිරීම, වාර්තා කිරීම යන කරුණු සම්බන්ධයෙන් සාධාරණ තහවුරු කිරීමක් ඇතිවන පරිදි අභ්‍යන්තර පාලනය සැලසුම් කොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

කාර්යයන් මත පදනම් වූ ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක වේ. නියමිත කාර්යයන් අනුව දෙපාර්තමේන්තු සැලසුම් කර ඇති අතර ඒවා නිෂ්පාදන, තත්ව පාලන, නඩත්තු, මූල්‍ය, සැලසුම්, වට්ටෝරු පර්යේෂණ හා සංවර්ධන, අලෙවිකරණ ආදී වශයෙන් වේ. සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වන සාමාන්‍යාධිකාරී වෙත එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා ඍජුවම වාර්තා කරයි. සාමාන්‍යාධිකාරී, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.

අභ්‍යන්තර විගණන කාර්යය මගින් අභ්‍යන්තර පාලනය තව දුරටත් ශක්තිමත් කෙරේ. අභ්‍යන්තර විගණක ඍජුවම සභාපතිවරයාට සහ විගණන කමිටුවට වාර්තා කිරීම මගින් අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය තවදුරටත් තහවුරු කෙරේ.

මිලදී ගැනීමේ ක්‍රියාවලිය තරඟකාරී ටෙන්ඩර් පටිපාටිය මගින් සිදු කෙරෙන අතර ගණුදෙනු වල විනිවිදභාවය රැකීම තුලින් සැපයුම්කරුවන්ට මෙමගින් සමාන අවස්ථා ද ලැබේ.

ප්‍රාග්ධන අයවැය ඇතුළත් වාර්ෂික අයවැය ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට සෞඛ්‍ය අමාත්‍යාංශයට හා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව



මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, පිටු අංක 75-85 හි ඇතුලත් විගණකාධිපති වාර්තාවේ සඳහන් විගණකවරයාගේ වගකීම තුලින් වෙනස් වේ.

1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව රාජ්‍ය සංස්ථා විසින් ආදායම්, වියදම්, වත්කම්, වගකීම් සහ සංස්ථාවේ අනෙකුත් සියළුම ගනු දෙනු පිළිබඳ ගිණුම් වාර්තා සුදුසු පරිදි තබා ගත යුතුය. රාජ්‍ය සංස්ථා විසින් ගිණුම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් සහ සංස්ථාවේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ වූ සංඛ්‍යානමය කරුණු, එකී ස්වරූපයන් හා එකී කරුණු ඇතුලත්ව පිළියෙල කළ යුතුය.

රජය සහ ආයතනයට සම්බන්ධ පාර්ශවයන් නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයට, ආයතනයේ භාරකාරීත්වය සම්බන්ධයෙන් ව්‍යවස්ථානුකූලව වගකීමක් හිමිව තිබෙන අතර සංස්ථාවේ මූල්‍ය තත්වය පිළිබඳ සාධාරණ නිවැරදිතාවයකින් යුක්තව හෙළිදරව් කිරීම සඳහා ප්‍රමාණවත් ගිණුම් වාර්තා සංස්ථාව තුළ තබා ගැනීමට ඔවුන් වගකීමෙන් බැඳේ. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සිදු කොට ඇති බවට සහ 1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව අවශ්‍ය තොරතුරු සපයා ඇති බවට සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම සංකල්පය අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කර ඇති බව සහතික කළ යුතුය.

සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ පියවරයන් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමක් ඇති අතර, මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනය, අභ්‍යන්තර සෝදිසි කිරීම්, මූල්‍යමය සමාලෝචනය, වංචා හා අක්‍රමිකතා අනාවරණය කර ගැනීම ඇතුළත් වූ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම සඳහා සුදුසු සලකා බැලීම් කිරීමේ වගකීමද ඔවුන් සතුය.

1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව විගණකාධිපති, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කළ සියලුම මූල්‍ය වාර්තා හා සම්බන්ධිත දත්ත සමඟ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර ඇති අතර ප්‍රකාශිත මතය මෙම වාර්තාවේ පිටු අංක 75-85 හි සඳහන්ව ඇත.

වෛද්‍ය පී.පී.ජී.පී.යූ ඉන්ද්‍රවංස
සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

# අවදානම් කළමනාකරණ වාර්තාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වන අප, අපගේ ආයතනයේ කෙටි කාලීන සහ දිගු කාලීන යන කාලද්වයේම තිරසාර භාවය සුරැකීම සඳහා අවදානම් කළමනාකරණය හා බැඳි වටිනාකම වටහාගෙන සිටින්නෙමු. අවදානම් කළමනාකරණය, අපගේ ආයතනික උපාය මාර්ගයේ සහ ව්‍යාපාර ආකෘතියේ අත්‍යවශ්‍ය අංගයකි. ඒ මක්නිසාදයත්, කාලයත් සමග යම් අගයක් එකතු කිරීමට අපට ඇති හැකියාව කෙරෙහි එය, ඍජු බලපෑමක් ඇති කරන හෙයිනි.

### අවදානම් කළමනාකරණයේ අරමුණු වන්නේ,

- සංස්ථාවේ දිගු කාලීන පැවැත්ම සහතික කිරීම.
- පාරිසරික සහ වෙළෙඳපළ තත්වයන්ගෙන් සංස්ථාව ආරක්ෂා කිරීම.
- සංස්ථාවේ සේවක සේවිකාවන්, සංස්ථාවේ වත්කම් සහ මහජනතාව ආරක්ෂා කිරීම.
- සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා සහාය වීම.

ද්‍රවශීලතා අවදානම, ප්‍රසම්පාදන අවදානම, නිෂ්පාදන අවදානම, වෙළෙඳපළ අවදානම, විනිමය අනුපාත අවදානම, සමාජ ආර්ථික අවදානම හා මානව සම්පත් අවදානම ඇතුළු අවදානම් ගණනාවක් කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා කළමනාකාරිත්වය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

### ද්‍රවශීලතා අවදානම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රජයේ වෛද්‍ය සැපයුම් අංශයට 100% ණය කොන්දේසි මත ඖෂධ සපයයි. වෛද්‍ය සැපයුම් අංශය විසින් දිගු කාලීනව පියවා නොමැති බිල්පත් මගින් ද්‍රවශීලතා අවදානමක් ඇති විය හැකි ය. එබැවින්, ද්‍රවශීලතා අවදානම මගහරවා ගැනීම සඳහා අදාළ බලධාරීන් වෙතින්, මහා භාණ්ඩාගාරයේ මැදිහත්වීම ඇතිව, අදාළ මුදල් පියවා ගැනීමට සංස්ථා කළමනාකාරිත්වය විසින් පියවර ගනු ලැබ ඇත.

### ප්‍රසම්පාදන අවදානම

නව අමු ද්‍රව්‍ය ප්‍රසම්පාදනය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ, රජයේ ටෙන්ඩර් පටිපාටියට අනුව වන අතර අමු ද්‍රව්‍යවලින් 80% කට වැඩි ප්‍රමාණයක් ආනයනය කෙරේ. එබැවින්, නිෂ්පාදන ක්‍රියාවලියට බලපෑ හැකි අමු ද්‍රව්‍ය අඛණ්ඩව සැපයීමේ අවදානමක් පවතී.

මෙම අවදානම මගහරවා ගැනීම සඳහා, කළමනාකාරිත්වය විසින් අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව සමීපව නිරීක්ෂණයට හසු කරනු ලබන අතර, ලෝක ව්‍යාප්ත ටෙන්ඩර් පටිපාටිය හරහා සැපයුම්කරුවන් ප්‍රමාණය පුළුල් කිරීම සඳහා අවැසි පියවර ගනු ලැබ ඇත.

### නිෂ්පාදන අවදානම

වෙළඳපළ වෙත නිකුත් කෙරෙන සියලුම නිෂ්පාදන, අපගේ අභ්‍යන්තර පිරිවිතරයන් මෙන්ම, බ්‍රිතාන්‍ය ඖෂධ පිරිවිතරවලට (BP) සහ එක්සත් ජනපද ඖෂධ පිරිවිතරවලට (USP) අදාළ අවශ්‍යතා සපුරාලයි.

යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) නිතිපතා අධීක්ෂණය කරනු ලබන අතර ඖෂධ නිෂ්පාදන, නියමිත ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා එකී නිෂ්පාදනවලට අදාළ අනෙකුත් පද්ධති සහ ක්‍රියා පටිපාටින් අඛණ්ඩව සමාලෝචනයට හසු කෙරේ.

### වෙළඳපළ අවදානම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා සම්බන්ධ වෙළඳපළ තරගකාරිත්වය වැඩි වීමේ අවදානමක් ඇත. අපගේ නිෂ්පාදන සඳහා ප්‍රධාන

තරඟකරුවන් ලෙස ඖෂධ ආනයනය කරන ඖෂධ සමාගම් හඳුනා ගත හැකි ය. අවදානම පිළිබඳව දැනුවත්ව සිටිමින්, සමස්ත පිරිවැය අඩු කිරීම සඳහා, ඵලදායිතාව ඉහළ නැංවීමට අපි අපගේ අවධානය අඛණ්ඩව යොමු කරන්නෙමු.

## විනිමය අනුපාත අවදානම

විනිමය අනුපාතවල උච්චාවචනය නිෂ්පාදනවල මිලකරණය කෙරෙහි සෘජුවම බලපෑම් ඇති කරයි, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි කළමනාකාරීත්වය, එහිලා ඇති වූ යම් දුර්වලතා මඟහරවා ගැනීම සඳහා මිලකරණ කමිටු රැස්වීමක් පැවැත්වී ය.

## සමාජ ආර්ථික අවදානම

ජාතික සෞඛ්‍ය ආරක්ෂණ සේවා පද්ධතියට සහ සාමාන්‍ය ජනතාවට දැරිය හැකි මිල ගනන් වලට ඵලදායී ඖෂධ ලබා දීම, රාජ්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි ප්‍රමුඛ වගකීම වේ.

## මානව සම්පත් අවදානම

ආයතනවල පුහුණු සේවකයින් විදේශවලට සංක්‍රමණය වීමේ අවදානමක් පවතින හෙයින් ඊට අදාළ වැටුප් රහිත නිවාඩු පටිපාටිය වෙනස් කිරීමට කළමනාකාරීත්වය තීරණය කර ඇත.

# තිරසාර සංවර්ධන ඉලක්ක

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, වගකිව යුතු රාජ්‍ය ආයතනයක් ලෙස සංස්ථාවේ කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන උපාය මාර්ග තුළ තිරසාර සංවර්ධන ඉලක්ක අන්තර්ගත කිරීම මඟින් එම ඉලක්ක සපුරා ගැනීමට දායක වේ.

## 1 දරිද්‍රතාවය තුරන් කිරීම

සංස්ථාව විසින්, ස්වකීය සේවක සේවිකාවන් 345 දෙනෙකුගේ ජීවනෝපායික තත්වය ඉහළ නැංවීම පිණිස ඔවුන්ගේ සේවක පිරිවැය ලෙස රුපියල් මිලියන 543 ක මුදල් ප්‍රමාණයක් ගෙවනු ලැබ ඇත. තවද, එම සේවක සේවිකාවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින්, ණය යෝජනා ක්‍රම හා වෛද්‍ය පහසුකම් යනාදී විවිධ සුබසාධන කටයුතු ඔවුන් වෙත සපයා දෙනු ලැබේ.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රාජ්‍ය ආයතනයක් ලෙස සාමාන්‍ය ජනතාවට ආර්ථික සහන සැලසීමේ අරමුණින් උසස් තත්ත්වයේ ඖෂධ වර්ග ඔවුනට දැරිය හැකි මිලකට සපයයි.

## 3 යහපත් සෞඛ්‍ය තත්වය සහ යහ පැවැත්ම

ඖෂධ නිෂ්පාදනය කරන එකම රාජ්‍ය ආයතනය ලෙස රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලියේ දී ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් අනුගමනය කරයි.

රජයේ රෝහල්වල ඖෂධ හිඟයක් ඇති නොකර විවිධ ඖෂධ වර්ග (රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන මාලාව) අඛණ්ඩව රජයේ රෝහල් වෙත සපයනු ලබන අතර බෙදාහැරීමේ සේවා මාර්ග ඔස්සේ දැරිය හැකි මිලකට පුද්ගලික අංශයේ වෙළඳපළ වෙත ද එකී ඖෂධ වර්ග සම්පාදනය කරනු ලැබේ.

සෞඛ්‍ය සුවතාව සහ යහ පැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා සංස්ථා සේවක සේවිකාවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආවරණය වන වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය, පාරිතෝෂිත දීමනා ගෙවීම හා ප්‍රසූත නිවාඩු ලබා දීම යනාදී ක්‍රම මගින් සංස්ථාව තම සේවක සේවිකාවන් වෙත වෛද්‍ය ප්‍රතිලාභ ඇතුළු ප්‍රතිලාභ සලසා දී ඇත.

## 5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

සංස්ථාව, තම සියලුම සේවක සේවිකාවන්ට සමාන අවස්ථා ලබා දී ඇති අතර ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව කිසිදු වෙනස්කමක් නොදක්වයි. සියලුම සේවක සේවිකාවන් විෂයයෙහි කිසිදු වෙනස්කම් දැක්වීමක් නොකර ඔවුනට සමාන ප්‍රතිලාභ සලසා දීමේ ප්‍රතිපත්තියක් තුළ ඔවුනට සලකන අතර, සියලු ව්‍යවස්ථාපිත සහ අනෙකුත් අවශ්‍යතාවලට අනුකූලව, එකම රැකියා කාණ්ඩ වෙනුවෙන් සමාන ප්‍රතිලාභ පරිමාණයන් (1:1) සඳහා සුදුසුකම් ලබන අයුරින්, ස්ත්‍රී සහ පුරුෂ යන දෙපාර්ශවයම අතර අසමානතා කිසිවකට ඉඩකඩක් නොතබා කටයුතු කරයි.

## 8 සෑදු කාර්ය නියුක්තිය සහ ආර්ථික වර්ධනය

සංස්ථාව විසින් රුපියල් මිලියන 1,130 ක මුදල් ප්‍රමාණයක්, රටේ ආර්ථික වර්ධනය උදෙසා විවිධ බදු, අය බදු සහ තීරුබදු ලෙස රජයට දායක කර දී ඇත. රජය සතු එකම රාජ්‍ය ඖෂධ නිෂ්පාදකයා ලෙස, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රට තුළ ඖෂධ හිඟයක් ඇති නොවන පරිදි විවිධ ඖෂධ වර්ග වසර පුරා රජයේ රෝහල්වලට සහ පෞද්ගලික අංශය වෙත අඛණ්ඩව සැපයීමෙහි නියැලෙයි.

තවද, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින්, 2023 වර්ෂයේ දී එහි මුළු පිරිවැටුමෙන් 35% කට වඩා වැඩි ප්‍රමාණයක ආර්ථික වටිනාකමක් සහ ඩොලර් ඉතිරියක් රටට එකතු කර දෙන ලදී.

## 9 කර්මාන්ත නවෝත්පාදනය සහ යටිතල පහසුකම්

ලෝක බැංකුවේ කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය (CERHSP) යටතේ, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි දැනට පවතින පෙනිසිලින් කලාපය නව දුරටත් පුළුල් කර, වත්මන් නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා නව යන්ත්‍ර සූත්‍ර වලින් සමන්විත කෙරුණි. මුඛ ඝන මාත්‍රා (OSD) පිළිකා ඖෂධ සහ විකලාංග උපකරණ නිෂ්පාදනය සඳහා නව කර්මාන්ත ශාලාවක් හොරණ - මිල්ලෑව ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් සැලසුම් සකස් කරනු ලැබ ඇත.

## 10 අසමානතා පහත හෙළීම

පුහුණු කිරීම්, බඳවාගැනීම්, වැඩ පවරා දීම් සහ උසස්වීම් ලබා දීම් වැනි එදිනෙදා කටයුතුවල දී සැමට සාධාරණව සැලකීම පිණිස උපකාර කර ගැනීමට පැහැදිලි සමානාත්මතා ප්‍රතිපත්ති පවත්වා ගැනීම හරහා හැකියාව ලැබෙනු ඇත.

## 12 වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය

එකඟ වූ ජාත්‍යන්තර කාර්ය රාමුවලට අනුකූලව, අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වූ පරිසර හිතකාමී කළමනාකරණ පද්ධතියක් අප විසින් පවත්වා ගෙන යනු ලබන අතර ඉන් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදු වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ඒවා වාතයට, ජලයට සහ පසට මුදා නොහැරීම අප විසින් සහතික කරනු ලබන්නෙමු. ඖෂධ නිෂ්පාදනවල අපද්‍රව්‍ය බැහැර කරනු ලබන්නේ, ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන් සහ ඊට අදාළ නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව ය.

## 13 දේශගුණය විෂයයෙහි ක්‍රියාමාර්ග

දේශගුණය ආශ්‍රිත උවදුරු සහ ඊට අදාළව සිදු වන ස්වභාවික විපත් මගින් ඇති වන බලපෑම් අවම කිරීම සහ වළක්වා ගැනීම සඳහා වූ අභ්‍යන්තර ක්‍රියා පටිපාටි සහ පරිචයන් අප විසින් ගොඩනගා ගනු ලැබ ඇත. ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලයට අවැසි පුහුණු කිරීම් හා දැනුවත් කිරීමේ වැඩසටහන් අප විසින් සලසා දෙනු ලබන්නෙමු.

State Pharmaceuticals
Manufacturing Corporation

Won The

# SUPER GOLD AWARD

At the National Industry Excellence Award Ceremony 2023






කර්මාන්ත අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධව සංවිධානය කරන ලද "2023 වර්ෂයේ ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන තිළිණ ප්‍රදානෝත්සවයේ" දී මහා පරිමාණ බටහිර හා ආයුර්වේද ඖෂධ සහ ඒ ආශ්‍රිත කර්මාන්ත අංශයීය කාණ්ඩය යටතේ පිරිනමනු ලැබූ "සුපිරි රන් සම්මානය" රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් දිනා ගන්නා ලදී

# SILVER AWARD 2022










ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද "2023 වර්ෂයේ විශිෂ්ටතම වාර්ෂික වාර්තාව සහ ගිණුම් පිළිබඳ සම්මාන තිළිණ ප්‍රදානෝත්සවයේ" දී 2022 වසරේ රාජ්‍ය අංශයට අයත් විශිෂ්ටතම වාර්ෂික වාර්තාව සහ ගිණුම් සඳහා වන රජත සම්මානය (දෙවන ස්ථානය), රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත පිරිනමන ලදී

# ආයතනික සමාජ වගකීම්

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) අඛණ්ඩව ප්‍රමාණවත් සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා අත්‍යවශ්‍ය ඖෂධ නිෂ්පාදනය හා බෙදා හැරීම සම්බන්ධ මහජන සෞඛ්‍ය සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දී ඇත. ඊට අමතරව සෞඛ්‍ය, සුහසාධනය සහ සමාජයේ තිරසාර සංවර්ධනයට දායක වීමට සංස්ථාව පියවර කිහිපයක් ගෙන ඇත.

2023 වර්ෂය තුළ, සංස්ථාව විසින් අත් සනීපාරක්ෂක, අත් සෝදන සබන්, කුණු බඳුන්, පිරිසිදු කිරීමේ දියර, පිරිසිදු කිරීමේ අත්වැසුම්, පිරිසිදු කිරීමේ බුරුසු, කොසු, මොප්ස්..... යනාදී අවශ්‍ය ද්‍රව්‍ය සහ ප්‍රදර්ශන පුවරු, පානදුර සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයේ (MOH) මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සායනය වෙත පරිත්‍යාග කර ඇත.



# අපගේ නිපැයුම් වර්ග - 2023

## එක් එක් නිපැයුම් වර්ග අනුව නිෂ්පාදිත පෙති හා කරල් සංඛ්‍යාව

| නිපැයුම් වර්ග | ප්‍රමාණය (මිලියන) |
|---|---|
| ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 250 | 85.13 |
| ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 500 | 25.50 |
| ඇමොක්සිසිලින් පෙති USP මි.ග්‍රෑ 125 | 8.75 |
| ඇස්කෝබික් අම්ලය පෙති BP මි.ග්‍රෑ 100 | 29.70 |
| ඇටෝවාස්ටටින් පෙති IP මි.ග්‍රෑ 10 | 304.50 |
| ඇටෝවාස්ටටින් පෙති IP මි.ග්‍රෑ 20 | 4.00 |
| බෙන්සෙක්සෝල් පෙති BP මි.ග්‍රෑ 2 | 60.00 |
| බිසප්‍රොලෝල් පෙති BP මි.ග්‍රෑ 5 | 19.50 |
| කාබමෙසපීන් පෙති BP මි.ග්‍රෑ 200 | 29.00 |
| සෙට්රිසින් පෙති BP මි.ග්‍රෑ 10 | 15.60 |
| සිප්රොෆ්ලොක්සසින් පෙති USP මි.ග්‍රෑ 250 | 8.75 |
| සිප්රොෆ්ලොක්සසින් පෙති USP මි.ග්‍රෑ 500 | 10.00 |
| ක්ලැරිත්රොමයිසීන් පෙති මි.ග්‍රෑ 250 | 13.80 |
| ක්ලොක්සසිලීන් කරල් BP මි.ග්‍රෑ 250 | 24.43 |
| ක්ලොක්සසිලීන් කරල් BP මි.ග්‍රෑ 500 | 18.90 |
| කො-ට්‍රිමොක්සසෝල් පෙති BP (වැඩිහිටි) | 4.50 |
| ඩයික්ලෝෆෙනැක් සෝඩියම් පෙති USP මි.ග්‍රෑ 50 | 26.00 |
| ඩයිතයිල්කාබමසීන් පෙති BP මි.ග්‍රෑ 50 | 5.40 |
| ඩිල්ටියසෙම් HCL පෙති මි.ග්‍රෑ 30 | 66.75 |
| ඩිල්ටියසෙම් HCL පෙති මි.ග්‍රෑ 60 | 36.75 |
| ඩොම්පෙරිඩෝන් පෙති මි.ග්‍රෑ 10 | 33.60 |
| එනලප්‍රිල් මැලියේට් පෙති මි.ග්‍රෑ 5 | 68.40 |
| ෆැමොටිඩීන් පෙති USP මි.ග්‍රෑ 20 | 89.10 |
| ෆ්ලුක්ලොක්සසිලින් කරල් BP මි.ග්‍රෑ 250 | 12.78 |
| ෆ්ලුක්ලොක්සසිලින් කරල් BP මි.ග්‍රෑ 500 | 14.80 |
| ෆෝලික් ඇසිඩ් පෙති BP මි.ග්‍රෑ 1 | 64.00 |

| නිපැයුම් වර්ග | ප්‍රමාණය (මිලියන) |
|---|---|
| ෆෘසෙමයිඩ් පෙති BP මි.ග්‍රෑ 40 | 33.00 |
| ගාබපෙන්ටින් කරල් USP මි.ග්‍රෑ 300 | 10.71 |
| ග්ලික්ලසයිඩ් පෙති BP මි.ග්‍රෑ 40 | 194.00 |
| ග්ලික්ලසයිඩ් පෙති BP මි.ග්‍රෑ 80 | 506.00 |
| ලෙවොතයිරොක්සීන් පෙති IP ම.ග්‍රෑ 50 | 108.74 |
| ලොරටඩීන් පෙති USP මි.ග්‍රෑ 10 | 15.00 |
| ලොසාටන් පොටෑසියම් පෙති මි.ග්‍රෑ 50 | 253.40 |
| මෙබන්ඩසෝල් පෙති USP මි.ග්‍රෑ 100 | 20.75 |
| මෙෆෙනමික් ඇසිඩ් පෙති BP මි.ග්‍රෑ 500 | 0.41 |
| මෙට්ෆෝමින් පෙති BP මි.ග්‍රෑ 500 | 43.43 |
| නිමොඩිපයින් පෙති BP මි.ග්‍රෑ 30 | 0.22 |
| ඔමෙප්‍රසෝල් කරල් IP මි.ග්‍රෑ 20 | 170.42 |
| පැරසිටමෝල් පෙති BP මි.ග්‍රෑ 500 | 429.31 |
| ෆිනොක්සිමීතයිල් පෙනිසිලින් පෙති BP මි.ග්‍රෑ 250 | 27.39 |
| ප්‍රෙඩ්නිසෙලෝන් පෙති BP මි.ග්‍රෑ 1 | 0.11 |
| ප්‍රෙඩ්නිසෙලෝන් පෙති BP මි.ග්‍රෑ 5 | 308.00 |
| ප්‍රොප්‍රනලෝල් පෙති BP මි.ග්‍රෑ 40 | 24.00 |
| සැල්බියුටමෝල් පෙති BP මි.ග්‍රෑ 2 | 199.20 |
| සැල්බියුටමෝල් පෙති BP මි.ග්‍රෑ 4 | 12.00 |
| සිටග්ලිප්ටින් පෙති BP මි.ග්‍රෑ 50 | 0.77 |
| ස්පයිරනොලැක්ටෝන් පෙති USP මි.ග්‍රෑ 25 | 36.00 |
| තියෝෆිලීන් ER පෙති මි.ග්‍රෑ 125 | 4.20 |
| ට්‍රැමඩෝල් කරල් IP මි.ග්‍රෑ 50 | 7.31 |
| ට්‍රයිප්ලුවොපෙරසීන් පෙති BP මි.ග්‍රෑ 5 | 11.22 |
| වෙරපමිල් පෙති BP මි.ග්‍රෑ 40 | 23.10 |
| විටමින් බී පෙති CHF | 42.00 |



# බද්ධ ව්‍යාපාර නිෂ්පාදන 2023

1 Acetaminophen Suppositories USP 125mg
2 Acetaminophen Suppositories USP 250mg
3 Acetaminophen Suppositories USP 500mg
4 Acetazolamide Tablets BP 250mg (Blister)
5 Aciclovir Tablets BP 200mg
6 Aciclovir Tablets BP 800mg
7 Alfacalcidol Softgelatin Capsules 0.25mcg
8 Amantadine HCl Capsules USP 100mg
9 Amiodarone Tablets BP 100mg
10 Amisulpride Tablets BP 200mg
11 Amlodipine Besylate Tablets USP 2.5mg
12 Aripiprazole Tablets USP 10mg
13 Ascorbic Acid Tablets BP 100mg
14 Aspirin Tablets BP 75mg - Gastro Resistant
15 Atorvastatin Tablets IP 10mg
16 Atorvastatin Tablets IP 20mg
17 Atorvastatin Tablets 40mg
18 Baclofen Tablets 5mg
19 Baclofen Tablets BP 10mg
20 Betamethasone Valerate Cream USP 0.1%
21 Betamethasone Valerate Oinment USP 0.1%
22 Bisacodyl Suppositories USP 10mg
23 Bisacodyl Tablets BP 10mg
24 Bisoprolol Fumarate Tablets USP 2.5mg
25 Bosentan Tablets 62.5mg
26 Bosentan Tablets 125mg
27 Cabergoline Tablets USP 0.5mg
28 Calciferol Tablets 10000IU
29 Calcitriol Softgel Capsules 0.25mcg
30 Calcium Carbornate - Chewable Tablets BP 500mg
31 Calcium Carbonate Tablets 1250mg
32 Calcium Gluconate Injection USP 10% w/v, 10ml
33 Calcium Lactate Tablets BP 300mg
34 Captopril Tablets 12.5mg
35 Carvedilol Tablets USP 3.125mg
36 Carvedilol Tablets USP 6.25mg
37 Carvedilol Tablets USP 12.5mg
38 Cetirizine Hydrochloride BP 10mg
39 Cetirizine Oral Solution BP 5mg/5ml
40 Chlorphenamine Injection BP 10mg/ml, 1ml Ampoule
41 Chlorpheniramine Oral Solution USP 2mg/5ml
42 Chlorpromazine Tablets BP 50mg (Blister)
43 Ciprofloxacin Intravenous Infusion BP 0.2% w/v, 100ml
44 Clindamycin Capsules BP 150mg
45 Clindamycin Capsules BP 300mg
46 Clomipramine Tablets 50mg
47 Clopidogrel 75mg Tablets USP
48 Clotrimazole Cream BP 1%
49 Clozapine Tablets USP 100mg
50 Colecalciferol Capsules 1000IU
51 Colecalciferol Tablets BP 400IU
52 Compound Sodium Lactate Intravenous Infusion BP 500ml
53 Cotton Crape Bandage - 5cm - 3m Roll
54 Cotton Crape Bandage - 7.5cm - 4.5m Roll
55 Cotton Crape Bandage - 7.5cm - 9m Roll
56 Cotton Crape Bandage - 10cm - 6m Roll
57 Dapsone Tablets BP 25mg
58 Dapsone Tablets BP 50mg
59 Deferasirox Tablets 100mg
60 Deferasirox Tablets 400mg
61 Dextran 40 Intravenous Infusion BP 10% w/v, 500ml
62 Diazepam 10mg/2ml Ampoule
63 Diclofenac - Gastro Resistant Tablets BP 25mg
64 Diclofenac Sodium DR Tablets USP 50mg
65 Diclofenac Sodium Suppositories 12.5mg
66 Diclofenac Sodium Suppositories 25mg
67 Diclofenac Sodium Suppositories 100mg
68 Diltiazem - Prolonged Release Tablets BP 90mg
69 Domperidone Tablets BP 10mg
70 Domperidone Suppositories 10mg
71 Domperidone Suppositories 30mg
72 Domperidone Suppositories 60mg
73 Donepezil Hydrochloride Tablets USP 5mg
74 Doxepin Capsules BP 50mg
75 Enalapril Maleate Tablets USP 5mg
76 Ephedrine Injection BP 30mg/ml
77 Fentanyl Injection BP 100mcg/ 2 ml Ampoule
78 Ferrous Fumarate 91.2mg + Folic Acid Tablets 400mcg
79 Ferrous Fumarate 182.4mg + Folic Acid 400mcg Tablets
80 Ferrous Sulphate Tablets 200mg
81 Fluphenazine HCl USP 5mg
82 Frusemide Tablets BP 40mg
83 Gabapentin Capsules USP 300mg
84 Gliclazide Modified Release Tablets 30mg
85 Gliclazide Tab BP 40mg
86 Gliclazide Tab BP 80mg
87 Glucose Intravenous Infusion BP 5% w/v, 500ml
88 Glucose Intravenous Infusion BP 10% w/v, 500ml
89 Glucose Intravenous Infusion BP 25% w/v, 25ml
90 Glucose Intravenous Infusion BP 50% w/v, 50ml
91 Haemodialysis Solution (Part A)
92 Haemodialysis Solution (Part B)
93 Hydralazine Tablets BP 50mg (Blister)
94 Hydrocortisone Acetate Cream BP 1%
95 Hydrocortisone Ointment BP 1%
96 Hydroxychloroquine Sulfate Tablets USP 200mg
97 Isosorbide Mononitrate ER Tablets USP 30mg
98 Ketamine HCL Inj. 200mg/20ml Vial
99 Ketamine HCL Inj. 500mg/10ml Vial
100 Labetalol Tablets BP 100mg
101 Lamotragine Tablets USP 25mg
102 Lamotragine Tablets USP 50mg

103 Lamotragine Tablets USP 100mg
104 Levamisole Hydrochloride Tablets USP 40mg
105 Levetiracetam Tablets USP 250mg
106 Levetiracetam Tablets USP 500mg
107 Lidocaine 2% Injection BP 5ml Vial
108 Lidocaine Injection BP 2% w/v (Preservative free) 20ml vial
109 Lithium Carbonate Tablets BP 250 mg
110 Losartan Potassium Tablets BP 25mg
111 Losartan Potassium Tablets BP 50mg
112 Magnesium Sulfate Injection BP 50% w/v, 10ml
113 Mannitol Intravenous Infusion BP 20% w/v, 250ml
114 Mebendazole Tablets USP 100mg
115 Mebendazole Tablets USP 500mg (Chewable)
116 Mebendazole Tablets USP 500mg (Sachet)
117 Mesalazine Suppositories BP 500mg
118 Metaraminol Injection BP 10mg/ml, 1ml Ampoule
119 Metformin SR Tablets 500mg
120 Metformin Tablets BP 500mg
121 Methionine Tablets 500mg
122 Methyldopa Tablets BP 250mg
123 Metolazone Tablets USP 5mg
124 Metoprolol Tartrate Tablets USP 50mg
125 Metronidazole Intravenous Infusion BP 0.5% w/v, 100ml
126 Miconazole Nitrate Cream BP 2%
127 Midazolam Injection BP 5mg/ ml Ampoule
128 Mycophenolate Mofetil Tablets 250mg
129 Mycophenolate Mofetil Tab USP 500mg
130 Nalidixic Acid Tablets 250mg
131 Nicorandil Tablets BP 10mg
132 Nimodipine Tablets BP 30mg
133 Ofloxacin Intravenous Infusion 0.2% w/v, 100ml
134 Omeprazole Magnesium - Gastero Resistant Tablets 10mg
135 Omeprazole GR Capsules 20mg
136 Oseltamivir Phosphate Capsules USP 30mg
137 Oseltamivir Phosphate Capsules USP 45mg
138 Oxcarbazepine Tablets USP 150mg
139 Oxcarbazepine Tablets USP 300mg
140 Paediatric Paracetamol Oral Solution BP 120mg/5ml
141 Pancreatin Capsules 150mg
142 Paracetamol Tablets BP 500mg
143 Penicillamine Capsules USP 250mg
144 Phenytoin Sodium Injection 250mg/5ml Ampoule
145 Phytomenadione Tablets BP 5mg
146 Pizotifen Tablets BP 0.5mg
147 Pottasium Chloride 15% Injection 10ml
148 Prazosin Tablets 1mg
149 Pregabalin Capsules IP 75mg
150 Primidone Tablets USP 250mg
151 Promethazine Injection BP 25mg/ml, 2ml Ampoule
152 Propranolol - Prolong Released Capsules BP 160mg
153 Pyridostigmine Tab BP 60mg
154 Pyridoxine Tablets BP 10mg
155 Pyrimethamine Tabs BP 25mg
156 Quetiapine Tablets USP 25mg
157 Quetiapine Tablets USP 100mg
158 Quetiapine ER Tablets USP 200mg
159 Risperidone Tablets USP 1mg
160 Risperidone Tablets USP 2mg
161 Salbutamol Oral Solution 2mg/5ml
162 Sertraline HCl Tablets USP 50mg
163 Sildenafil Tablets USP 50mg
164 Sitagliptin Tablets USP 50mg
165 Sitagliptin Tablets BP 100mg
166 Sitagliptin Tablets USP 100mg
167 Sodium Bicarbonate Tablets USP 600mg
168 Sodium Chloride Intravenous Infusion BP 0.9% w/v, 500ml
169 Sodium Chloride & Glucose Intravenous Infusion BP 0.45% & 5% w/v, 500ml
170 Sodium Chloride & Glucose Intravenous Infusion BP 0.45% & 10% w/v, 500ml
171 Sodium Chloride & Glucose Intravenous Infusion BP 0.9% & 5% w/v, 500ml
172 Sodium Chloride & Glucose Intravenous Infusion BP 0.9% & 10% w/v, 500ml
173 Sodium Chloride Infusion BP 0.9% w/v, 5ml Ampoule
174 Sodium Chloride Injection BP 0.9% w/v, 5ml
175 Sodium Chloride Intravenous Infusion BP 3% w/v, 500ml
176 Sodium Fusidate Tablets 250mg
177 Sodium Valproate - Gastro Resistant Tablets BP 100mg
178 Sodium Valproate - Gastro Resistant Tablets BP 200mg
179 Solifenacin Succinate Tablets 5mg
180 Solifenacin Succinate Tablets 10mg
181 Sotalol Hydrochloride Tablets USP 80mg (Blister)
182 Sterilised Water for Injections BP-10ml
183 Sulfadiazine Tablets USP 500mg
184 Sumatriptan Tablets BP 50mg
185 Tamsulosin Prolonged Release Capsules BP 0.2mg
186 Tamsulosin Prolonged Release Capsules BP 0.4mg
187 Theophyline Extended Release Tablets 125 mg
188 Thiamine Hydrochloride Tablets USP 10mg
189 Thiamine Hydrochloride Tablets USP 100mg
190 Thiamine Injection BP 100mg/2ml Ampoule
191 Tranexamic Acid Capsules 500mg
192 Tranexamic Acid Injection 500 mg/ml
193 Trientine Hydrochloride Capsules USP 300mg
194 Trifluoperazine Tablets BP 5mg
195 Ursodeoxycholic Acid Tablets BP 150mg
196 Valganciclovir Tablets USP 450mg
197 Venlafaxine Hydrocholoride ER Capsules USP 37.5mg
198 Venlafaxine Hydrocholoride ER Capsules USP 75mg
199 Verapamil HCL Injection 2.5 mg/2ml Ampoule
200 Verapamil PR Tablets BP 240mg
201 Vigabatrin Tablets BP 500mg
202 Vitamin A Capsules USP 100000IU
203 Voriconazol Tablets 200mg
204 Wafarin Sodium Tablets USP 0.5mg
205 Wafarin Sodium Tablets USP 1mg
206 Wafarin Sodium Tablets USP 3mg
207 Wafarin Sodium Tablets USP 5mg
208 Zinc Sulfate Tablets USP 10mg (Dispersible)
209 Zinc Sulfate Tablets USP 20mg (Dispersible)

# මූල්‍ය ප්‍රකාශන



# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

## 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | සටහන | 2023 | 2022 - යලි ප්‍රකාශිත |
|---|---|---|---|
| ආදායම | 1 | 29,331,718,691 | 16,620,184,659 |
| විකුණුම් පිරිවැය | 2 | (26,381,969,229) | (14,508,387,248) |
| **දළ ලාභය** | | **2,949,749,462** | **2,111,797,411** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 3 | 14,096,335 | 780,459,814 |
| පරිපාලන වියදම් | 4 | (396,275,773) | (327,114,999) |
| විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් | 5 | (937,035,896) | (472,762,064) |
| අනිකුත් මෙහෙයුම් වියදම් | 6 | (22,286,381) | (31,009,091) |
| **මෙහෙයුම් ලාභය** | | **1,608,247,748** | **2,061,371,072** |
| මූල්‍ය පිරිවැය | 7 | (57,488,612) | (307,693) |
| මූල්‍ය ආදායම | 8 | 622,548,970 | 330,531,099 |
| **බදු පෙර ලාභය** | | **2,173,308,106** | **2,391,594,478** |
| බදු වියදම | 9 | (654,752,799) | (717,249,696) |
| **වර්ෂය සඳහා ලාභය** | | **1,518,555,306** | **1,674,344,783** |

| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශය** | | | |
|---|---|---|---|
| වර්ෂය සඳහා ලාභය | | 1,518,555,306 | 1,674,344,783 |
| (+/-) විශ්‍රාම ප්‍රතිලාභ බැඳියා මත ආයු ගණක ලාභය / (අලාභය) | | 12,513,552 | (32,822,249) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳියා මත ආයු ගණක ලාභ / (අලාභ) ආදායම් බද්ද | 9 (ආ)(i) | (3,754,066) | 9,846,675 |
| | | **8,759,486** | **(22,975,574)** |
| (+) සැලසුම් වත්කම් මත ආයු ගණක ලාභය | | 6,763,352 | 5,612,914 |
| සැලසුම් වත්කම් මත ආයු ගණක ලාභ ආදායම් බද්ද | 9 (අ) | (2,029,006) | (1,683,874) |
| | | **4,734,346** | **3,929,040** |
| (-) දේපළ, පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගණන අතිරික්තය | | - | 797,137,916 |
| දේපළ, පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගණන අතිරික්තය මත ආදායම් බද්ද | 9 (ආ)(i) | - | (239,141,375) |
| **බදු ගැලපීමෙන් පසු වෙනත් විස්තීර්ණ ආදායම** | | **-** | **557,996,541** |
| **බදු ගැලපීමෙන් පසු මුළු විස්තීර්ණ ආදායම** | | **1,532,049,139** | **2,213,294,789** |

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

## 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | සටහන | 2023 | 2022 - යලි ප්‍රකාශිත |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 10 | 4,002,112,060 | 3,656,401,030 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 5,488,440 | 6,258,463 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 14 | 6,818,836 | 1,361,876 |
| පෙර ගෙවූ කල් බදු | 13 | 319,077,963 | 322,383,586 |
| නොනිමි වැඩ - ඉදිකිරීම් | | 163,346,971 | 117,009,089 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 15 | 3,911,381,608 | 3,124,019,823 |
| වෙළඳ හා වෙනත් අයවිය යුතු දේ | 16 | 1,622,883,799 | 2,405,400,384 |
| පූර්ව ගෙවීම් | 17 | 42,619,403 | 68,366,319 |
| වෙනත් මූල්‍ය වත්කම් | 18 | 5,974,554,359 | 4,241,085,643 |
| බැංකු සහ අතැති මුදල් | 19 | 468,896,309 | 758,495,754 |
| | | **12,020,335,479** | **10,597,367,924** |
| **මුළු වත්කම්** | | **16,517,179,749** | **14,700,781,968** |
| | | | |
| **කාරක ප්‍රාග්ධනය හා බැරකම්** | | | |
| අනුදත් ප්‍රාග්ධනය | | 850,000,000 | 850,000,000 |
| | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 20 | 3,106,173,043 | 690,079,000 |
| රඳවා ගත් ඉපැයීම් | | 7,376,658,041 | 6,145,370,588 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 557,996,541 | 557,996,541 |
| ප්‍රදානය - ලෝක බැංකු සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතිය | 21 | 438,146,336 | - |
| **මුළු කාරක ප්‍රාග්ධනය** | | **11,478,973,961** | **7,393,446,129** |

| | | | |
|---|---|---|---|
| **ජංගම නොවන බැරකම්** | | | |
| ශුද්ධ සේවක ප්‍රතිලාභ බැරකම් | 22 | (14,557,672) | 8,366,568 |
| විලම්බිත බදු බැරකම් | 23 | 389,492,010 | 557,467,909 |
| JICA ණය - රජයේ ප්‍රාග්ධන ආයෝජනය | 24 | - | 2,416,094,044 |
| | | **374,934,339** | **2,981,928,520** |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දේ | 25 | 4,052,364,858 | 3,868,611,101 |
| ගෙවිය යුතු බදු | | 610,906,591 | 456,796,217 |
| | | **4,663,271,449** | **4,325,407,319** |
| **මුළු කාරක ප්‍රාග්ධනය හා බැරකම්** | | **16,517,179,749** | **14,700,781,968** |

මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 42 සිට 53 දක්වා ඇත. එසේම මෙම මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරණු ලබන අතර මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යොමුකර ඇති සේම රජයේ විගණන දෙපාර්තමේන්තුවට ද ඉදිරිපත් කර ඇත.

**සභාපති** : ..............................

**අධ්‍යක්ෂ** : ..............................

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (මූල්‍ය)** : ..............................

**දිනය** : 10. 07. 2024

# ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

## 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ලාභය / (අලාභය) | ප්‍රත්‍යාගණන සංචිතය | ප්‍රදානය - ලෝක බැංකු සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතිය | එකතුව |
|---|---|---|---|---|---|
| 2023.01.01 දිනට ශේෂය | 690,079,000 | 6,145,370,588 | 557,996,541 | - | 7,393,446,129 |
| රජයේ ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස මාරු කිරීම | 2,416,094,043 | - | - | - | 2,416,094,043 |
| පෙනිසිලින් කලාප සංවර්ධන ව්‍යාපෘතිය (CERHSP) | - | - | - | 438,146,336 | 438,146,336 |
| වර්ෂය සඳහා ලාභය | - | 1,518,555,306 | - | - | 1,518,555,306 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | 13,493,833 | - | - | 13,493,833 |
| මුළු විස්තීර්ණ ආදායම් | - | 1,532,049,139 | 557,996,541 | 438,146,336 | 2,528,192,016 |
| මහා භාණ්ඩාගාරය වෙත දායකත්වය | - | (300,000,000) | - | - | (300,000,000) |
| පෙර වර්ෂයේ ගැලපුම් | - | (761,686) | - | - | (761,686) |
| **2023.12.31 දිනට ශේෂය** | **3,106,173,043** | **7,376,658,041** | **557,996,541** | **438,146,336** | **10,482,831,084** |

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය යලි ප්‍රකාශිත | ලාභය / (අලාභය) යලි ප්‍රකාශිත | ප්‍රත්‍යාගණන සංචිතය යලි ප්‍රකාශිත | ප්‍රදානය - ලෝක බැංකු සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතිය යලි ප්‍රකාශිත | එකතුව යලි ප්‍රකාශිත |
|---|---|---|---|---|---|
| 2022.01.01 දිනට ශේෂය | 690,079,000 | 4,589,998,197 | - | - | 5,280,077,197 |
| වර්ෂය සඳහා ලාභය | | 1,674,344,781 | - | - | 1,674,344,781 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | (19,046,535) | 557,996,541 | - | (19,046,535) |
| මුළු විස්තීර්ණ ආදායම් | - | 1,655,298,246 | 557,996,541 | - | 1,655,298,246 |
| මහා භාණ්ඩාගාරය වෙත දායකත්වය | - | (100,000,000) | - | - | (100,000,000) |
| පෙර වර්ෂයේ ගැලපුම් | - | 74,145 | - | - | 74,145 |
| **2022.12.31 දිනට ශේෂය** | **690,079,000** | **6,145,370,588** | **557,996,541** | **-** | **6,835,449,588** |

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

## 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | 2023 | 2022 - යලි ප්‍රකාශිත |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්** | | |
| බදු සහ අති විශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ ලාභය / (අලාභය) | 2,173,308,106 | 2,391,594,478 |
| පෙර වර්ෂයේ ගැලපුම් | (761,686) | (7,645,166) |
| **ගැලපුම් :-** | | |
| ස්ථාවර වත්කම් මත ක්ෂය | 258,320,398 | 262,466,303 |
| වර්තමාන පාරිතෝෂික පිරිවැය | 9,944,092 | 13,640,020 |
| සේවක පොළී පිරිවැය | 29,768,523 | 12,688,161 |
| සැලසුම් වත්කම් මත අපේක්ෂිත ලාභය | (28,262,541) | (15,615,371) |
| අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | 800,926,792 | 312,417,918 |
| ණයහිමියන්ගේ උපලබ්ධි නොවූ විනිමය ලාභය | 1,182,184 | 259,021 |
| ස්ථාවර වත්කම් විකිණීම මත ලාභ/අලාභ | 167,416 | 374,963 |
| හානි වූ හා අභාවිත ද්‍රව්‍ය පිරිවැය | 956,432 | 433,204 |
| පොළී ආදායම | (611,027,968) | (325,885,479) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **2,634,521,748** | **2,644,728,052** |
| | | |
| **කාරක ප්‍රාග්ධන අයිතමයන්හි වෙනස් වීම්** | | |
| තොග අඩු /(වැඩි) වීම | (787,361,785) | (1,499,993,382) |
| ණයගැතියන්ගේ හා අය විය යුතු දේහි අඩු / (වැඩි) වීම | (18,410,208) | (2,210,181,820) |
| තැන්පතු වල සහ පෙර ගෙවීම්වල අඩු / (වැඩි) වීම | 25,746,916 | (37,724,130) |
| බැරකම් වල (අඩු) /වැඩි වීම | 182,571,573 | 3,312,135,613 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල** | **2,037,068,244** | **2,208,964,333** |
| | | |
| පාරිතෝෂික ගෙවීම් | (15,097,410) | (4,101,585) |
| ආදායම් බදු ගෙවීම් | (674,401,394) | (251,546,593) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල** | **1,347,569,440** | **1,953,316,155** |

| | 2023 | 2022 - යලි ප්‍රකාශිත |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්** | | |
| කෙටිකාලීන ආයෝජන (සටහන - අ) | (1,719,245,538) | (745,071,893) |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | (209,443,180) | (498,564,648) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදයම | 172,003 | 485,127 |
| ලැබුණු පොළිය | 596,804,790 | 146,594,142 |
| වෙනත් ජංගම නොවන වත්කම් ඉහළ නැංවීම | (5,456,960) | (30,577) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල** | **(1,337,168,885)** | **(1,096,587,849)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මහා භාණ්ඩාගාර දායකත්වය | (300,000,000) | (100,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල** | **(300,000,000)** | **(100,000,000)** |
| | | |
| **මුදල් සහ ආසන්න මුදල්වල ශුද්ධ වැඩි/ (අඩු) වීම** | **(289,599,444)** | **756,728,306** |
| **වර්ෂය ආරම්භක මුදල් සහ ආසන්න මුදල්** | **758,495,754** | **1,767,448** |
| **වර්ෂය අවසාන මුදල් හා ආසන්න මුදල් (සටහන ආ)** | **468,896,309** | **758,495,754** |

| **සටහන (අ) - ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | **2023** | **2022 - යලි ප්‍රකාශිත** |
|---|---|---|
| වර්ෂය තුළ මුදල් ගලා ඒම් | (250,086,842,213) | 86,999,367,276 |
| වර්ෂය තුළ මුදල් ගලා යෑම් | 251,806,087,751 | (87,744,439,170) |
| **ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,719,245,538** | **(745,071,893)** |

| | | |
|---|---|---|
| **සටහන (ආ) - මුදල් සහ ආසන්න මුදල්** | | |
| ලංකා බැංකුව - රත්මලාන ශාඛාව | 18,550 | 18,550 |
| ලංකා බැංකුව - ආයතනික ශාඛාව | 2,173,504 | 1,049,142 |
| මහජන බැංකුව - රත්මලාන ශාඛාව | 136,565 | 136,590 |
| මහජන බැංකුව - ආයතනික ශාඛාව | 48,435 | 174,433 |
| ඩොලර් ආන්තිකය - ලංකා බැංකුව, ආයතනික ශාඛාව | 466,399,254 | 757,059,739 |
| මුදල් ශේෂය | 100,000 | 37,550 |
| සුළු මුදල් ශේෂය | 20,000 | 19,750 |
| | **468,896,309** | **758,495,754** |

# ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. ආයතනික තොරතුරු

**පොදු තොරතුරු**

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපිත කර ඇත. මෙය රත්මලාන ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවතේ අංක 11 දරණ ස්ථානයේ පිහිටා ඇත.

2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ වලට 2024 පෙබරවාරි 28 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ,

(අ) තමා විසින්ම හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම හෝ නැවත ඇසුරුම් කිරීම.

(ආ) පාලිත සමාගම් නිර්මාණය කිරීම.

(ඇ) අනාගත ආයෝජකයින් සමඟ ජාත්‍යන්තර ගිවිසුම්වලට එලබීම.

(ඈ) ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.

(ඉ) ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතකරණය කිරීම.

(ඊ) සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මඟින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මගින් කරන ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම.

## 2. පිළියෙල කිරීමේ පදනම

**2.1 අනුකූලතා ප්‍රකාශය**

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මඟින් නිකුත් කල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS/LKAS) වලට අනුකූලවය.

**2.2 මිනුම් පදනම**

මූල්‍ය ප්‍රකාශ පිළියෙල වී ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය. සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ වල අගයන් ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි. සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන මත ඔවුන්ගේ වගකීම පිළිගෙන ඇත.

**2.3 අඛණ්ඩ පැවැත්ම**

අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල වී ඇත.

## 3. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

**3.1 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**3.1.1 දේපළ, පිරියත සහ උපකරණ**

දේපළ, පිරියත සහ උපකරණ සටහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ වීම් ඇත්නම් ඒවා ද අන්තර්ග්‍රහණය කොට ගණනය කළ ශුද්ධ පිරිවැය ලෙසය. එම පිරිවැයට දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවලට අළුතින් කොටස් මාරු කිරීමේදී දැරීමට සිදුවන පිරිවැය සහ පිරිවැය නිර්ණායක වලට අනුකූල වන්නේ නම්, දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණයට ගැනීමේ පිරිවැය ද ඇතුළත් වේ. යම් නියමිත කාලයකට වරක් දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල වැදගත් කොටස් වෙනුවට අලුත් ඒවා යෙදීම අවශ්‍ය වන්නේ නම්, එම ඉවත් කරනු ලබන කොටසට

අදාළ පිරිවැය මුළු පිරිවැයෙන් ඉවත්කරන අතර නව කොටසෙහි පිරිවැය ඇතුළත් කරන අතර ක්ෂය එහි ප්‍රයෝජනවත් ආයු කාලය මත ගණනය කරනු ලබයි. එලෙසම, ප්‍රධාන පෙළේ පිරික්සීමක් සිදු කරනු ලබන අවස්ථාවේදී එහි පිරිවැය, පිරිවැය නිර්ණායක සපුරා ලන්නේ නම්, දේපළ හා පිරියතෙහි ලියාපදිංචි අගයට ඇතුළත් කරනු ලබයි. දේපළ හා පිරියතෙහි අනිකුත් අලුත්වැඩියා කිරීම් හා නඩත්තු වියදම්, ආදයම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

### 3.1.2 ක්ෂය

ක්ෂය කිරීම් LKAS 16 මත පදනම්ව සිදු කරන අතර ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය කිරීම් එම වත්කම් භාවිතය ආරම්භ වූ දිනයේ සිට SLFRS 05 ට අනුව එම වත්කම විකිණීමට තීරණය කළ දිනය දක්වා සරල මාර්ග ක්‍රම පදනම අනුව, ක්ෂය කරනු ලැබේ. දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| බදු ඉඩම් | 99 අවුරුදු බදු කාලය සඳහා |
| භූමි අලංකරණ වියදම් | 99 අවුරුදු බදු කාලය සඳහා |
| ගොඩනැගිලි | අවුරුදු 40 |
| වාහන නවත්වන ගොඩනැගිල්ල | අවුරුදු 12 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | අවුරුදු 1 සිට 20 දක්වා |
| මෝටර් වාහන | අවුරුදු 3 සිට 8 දක්වා |
| යතුරු පැදි | අවුරුදු 7 |
| පා පැදි හා කරත්ත | අවුරුදු 7 සිට 20 දක්වා |
| උපකරණ | අවුරුදු 1 සිට 25 දක්වා |
| පරිගණක උපාංග | අවුරුදු 1 සිට 5 දක්වා |
| පරිගණක මෘදුකාංග | අවුරුදු 1 සිට 5 දක්වා |
| ලී බඩු හා සවිකිරීම් | අවුරුදු 3 සිට 20 දක්වා |
| මෙවලම් | අවුරුදු 1 සිට 15 දක්වා |

### 3.1.3 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය වන්නේ අත්පත් කරගැනීමේ පිරිවැයයි. මූලික පිරිවැය හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත අපචය අඩු කරමිනි. ප්‍රාග්ධනීකරණය කරන ලද සංවර්ධන පිරිවැය අගයන් හැර අභ්‍යන්තරිකව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය කරනු නොලබන අතර වියදම ඇති වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශය තුළ අදාළ වියදම පිළිබිඹු කෙරේ.

### 3.1.4 දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍ර වල හානිකරණය

දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍ර වල ධාරණ වටිනාකමේ හානිකරණය සමාලෝචනය කරනු ලබන්නේ වාර්ෂිකව හෝ වෙනස්කම් සිදුවීම් මගින් හෝ දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍රවල ධාරණ වටිනාකම අය කර ගත නොහැකි වීමට ඉඩ ඇති බව හඳුනා ගත් අවස්ථාවකදීය. එබඳු තත්ත්වයක් පවතින්නේ නම් සහ ධාරණ වටිනාකම ඇස්තමේන්තුගත අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම්, වත්කම් ඒවායේ අය කර ගත හැකි වටිනාකමට සටහන් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයෙහි ප්‍රත්‍යාගණන අතිරික්තයන් සටහන් කිරීමට ප්‍රතිවිරුද්ධ සටහනක් ලෙස වත්කම් හානිකරණ අලාභ සටහන් කරනු ලැබේ.

### 3.1.5 මූල්‍ය නොවන වත්කම් වල හානිකරණය

වත්කමක් හානි විය හැකි බව දක්වන සංඥාවක් ඇතිදැයි සංස්ථාව එක් එක් වාර්තා කරන දිනයේදී තක්සේරු කරයි. කවර හෝ සංඥාවක් පවතී නම්, එසේත් නැති නම් වත්කමක් සඳහා වාර්ෂික හානි පිරික්සුමක් අවශ්‍ය වූ විට, සංස්ථාව

අදාළ වත්කමේ අය කර ගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරයි. වත්කමක අය කර ගත හැකි ප්‍රමාණය වනාහි වත්කමේ හෝ මුදල්-උත්පාදන ඒකකයේ (CGU) සාධාරණ වටිනාකමෙන්, විකිණීමේ වියදම් අඩු කිරීමෙන් ලැබෙන අගය හා භාවිතයේදී එහි වටිනාකම අඩු කළ විට ලැබෙන අගය යන අගයන් දෙකෙන් වඩා විශාල අගයයි. එය තනි වත්කම් සඳහා නිර්ණය කරනු ලබන්නේ වෙනත් වත්කම් වලින් හෝ වත්කම් සමූහ වලින් ආයතනය තුලට එන මුදල් ප්‍රවාහ වලින් ස්වායත්තව අදාළ තනි වත්කම ආයතනය තුලට මුදල් උත්පාදනය කරන්නේ නම් පමණි. වත්කමක හෝ මුදල්-උත්පාදන ඒකකයක ධාරණ අගය එහි අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන විට, වත්කම හානිකරණය වී ඇතැයි සැලකෙන අතර, එය එහි අය කර ගත හැකි ප්‍රමාණය ලෙස සටහන් කරනු ලැබේ. භාවිතයේදී වටිනාකම තක්සේරු කිරීමේදී, මුදලේ වර්තමාන අගය සහ වත්කමට ආවේණික අවදානම් පිළිබඳ වත්මන් වෙළඳපල තක්සේරු අගයන් පිළිබිඹු කරන බදු-පූර්ව වට්ටම් අනුපාතිකය භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වත්මන් වටිනාකමට වට්ටම් කරනු ලැබේ. සාධාරණ වටිනාකමෙන් විකිණීමේ පිරිවැය අඩු කොට අගය නිර්ණය කිරීමේදී, මෑත කාලීන වෙළඳපල ගනුදෙනු (තිබේ නම්) සැලකිල්ලට ගනු ලැබේ. එබඳු ගනුදෙනු හඳුනා ගත නොහැකි නම්, උචිත තක්සේරු ක්‍රමයක් භාවිතා කරනු ලැබේ.

## 3.1.6 බදුකරණය

### 3.1.6.1 වර්තමාන බදුකරණය

වර්තමාන සහ පෙර වර්ෂවල දී මෙන් බදු ආයතන වලට, ආයතනයේ බදු වත්කම් සහ බැරකම් මත බදු ගෙවීමක් සිදු කරයි. එම බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගන්නා ලද බදු අනුපාතික හා බදු නීති වනාහි ශේෂ පත්‍ර දින වන විට පනවා තිබූ ඒවා වේ.

ඒ අනුව, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ හා එයට කරන ලද සංශෝධන හා විධිවිධාන වලට අනුකූලව පනතේ නියම කර ඇති අනුපාතිකයන්ට අනුව බදු ගෙවීමේ කාර්යය සඳහා ගලපන ලද වර්ෂයේ ලාභය පදනම් කරගනිමින් බදු ප්‍රතිපාදනය කරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත්තේ පනතේ නියම කර ඇති අනුපාතික වලට යටත්ව ගිණුම්ගත ලාභය පදනම් කරගෙනය.

### 3.1.6.2 විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇති වත්කම් සහ වගකීම් වලට අදාල තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු බැරකම් හා වත්කම් ප්‍රතිපාදන කර ඇත. අපගේ මූල්‍ය ප්‍රකාශයන් තුළ ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම් වල ලියාහල පොත් අගය හා ලියාහල බදු වටිනාකම සඳහා විලම්බිත බදු බැරකමක්ද, විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් වූ ප්‍රතිපාදනය සඳහා විලම්බිත බදු වත්කමක්ද හඳුනා ගත්තෙමු. විලම්බිත බදු වත්කම් සහ බැරකම් මනිනු ලබන්නේ ආදායම් බදු අනුපාත අනුවය.

## 3.2. භාණ්ඩ තොග

'ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කල' පදනමින් අගය තක්සේරු කෙරෙන අභාවිත හෝ මන්දගාමී චලනයක් සහිත භාණ්ඩ සඳහා නිසි වෙන් කිරීම් කළ පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත භාණ්ඩ තොග අගය කරනු ලැබේ.

### 3.2.1 තොග අගය කිරීම

**තොග පිරිවැය**

**අමුද්‍රව්‍ය**

කවර හෝ පසු වියදම්ද ඇතුළුව මිලට ගැනීමේ පිරිවැය

**නොනිමි වැඩ**

අමුද්‍රව්‍ය පිරිවැය සහ සම්පූර්ණ විචල්‍ය නිෂ්පාදන පිරිවැය

**නිමි භාණ්ඩ**

අමුද්‍රව්‍ය පිරිවැය සහ සම්පූර්ණ විචල්‍ය නිෂ්පාදන පිරිවැය

**වෙනත් තොග**
පිරිවැය නිශ්චය කර ඇත්තේ බර තැබූ සාමාන්‍යය පදනමිනි.

**3.2.2 වෙළඳ සහ අනිකුත් අය විය යුතු දේ**
වෙළඳ සහ අනිකුත් අය විය යුතු දේ ප්‍රථමයෙන් සාධාරණ වටිනාකම මත හඳුනා ගෙන පසු වර්ෂයන්හිදී හානිකරණය සඳහා ප්‍රතිපාදන වලට යටත්ව සඵල පොළී අනුපාතිකය ආධාරයෙන් ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය. සංස්ථාව විසින් 2023.12.31 දිනට දීර්ඝ කාලයක් හිඟ හිටි වෛද්‍ය සැපයුම් අංශය වෙතින් අය විය යුතු මුදල් සඳහා අඩමාණ ණය ප්‍රතිපාදනයක් සිදු කොට ඇත.

**3.2.3 මුදල් හා මුදල්වලට සමාන දේ**
මුදල් හා මුදල්වලට සමාන දේ යන්නට අත ඇති මුදල්, බැංකු ශේෂය හා කෙටි කාලීන ආයෝජන ඇතුළත්ය.

**3.2.4 සබැඳි පාර්ශවයන් සමඟ ගනුදෙනු**

**කළමණාකරන පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු**
සංස්ථාවේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම ඇති පුද්ගලයින් ප්‍රධාන කළමණාකරන නිලධාරීන් ගනයට වැටේ. එම හඳුන්වා දීම අනුව සංස්ථාවේ විධායක සහ විධායක නොවන ගණයට අයත් අධ්‍යක්ෂකවරුන් ප්‍රධාන කළමණාකරන නිලධාරීන් ලෙස වර්ගීකරණය කළ හැක.

ප්‍රධාන කළමණාකරන නිලධාරීන්ට (අධ්‍යක්ෂක මණ්ඩලයට) ගෙවන ලද දීමනා පහත පරිදි වේ.

| | 2023 | 2022 |
|---|---|---|
| කෙටිකාලීන ප්‍රතිලාභ | 2,830,423 | 2,779,163 |
| තෑගි වවුචර | 180,000 | 100,000 |

**රාජ්‍ය හා රාජ්‍ය පාලනය සහිත ආයතන සමඟ ගනුදෙනු**
සංස්ථාව සිය සාමාන්‍ය මෙහෙයුම් වලදී සබැඳි පාර්ශවයන් සමඟ ගනුදෙනු වලට එළඹෙයි. සබැඳි පාර්ශවයන්ට ශ්‍රී ලංකා රජය (රජයඃ සංස්ථාවේ හිමිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන ඇතුළත්ය. රජය සහ රජය විසින් පාලනය කරනු ලබන හා තනි තනිව වැදගත් වන්නාවූ හෝ අන් සමහර ගනුදෙනු සම්බන්ධයෙන් තනි තනිව නොව, සාමූහිකව වැදගත් වන්නා වූ ආයතන සමග සංස්ථාව එළඹුනු ගනුදෙනු හා විධිවිධාන පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

**ගනුදෙනුවේ ස්වභාවය**

| **ගනුදෙනු** | 2023 | 2034 |
|---|---|---|
| සංස්ථාව සතු ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වල ආයෝජන | 6,165,113,878 | 4,398,099,758 |
| වර්ෂය තුළ රජය වෙත කල ගෙවීම් | 300,000,000 | 100,000,000 |
| විකුණුම් | 29,331,718,691 | 16,620,184,659 |
| **හිඟ ශේෂ** | | |
| රා. ඖ. සං. වෙතින් අය විය යුතු දේ | 8,426,990 | 33,288,612 |
| සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙතින් අය විය යුතු දේ | 2,378,686,753 | 2,355,035,504 |

**3.2.5 ප්‍රාග්ධනය**
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අනුදත් ප්‍රාග්ධනයෙහි වෙනසක් වී නොමැත.

**3.2.6 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසු සිදුවීම්**
මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසු සිදු වූ සියලුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනයෙහි අවශ්‍ය අවස්ථාවන්හිදී යෝග්‍ය වෙනස්කම් සිදු කර ඇති අතර, අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශයට අනාවරණයන් සිදු කර ඇත.

**3.2.7 පර්යේෂණ පිරිවැය**
නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අරමුණින් සිදු කරන ලද පර්යේෂණ කටයුතු සඳහා වියදම් ඇති වූ අවස්ථාවේදී ඒවා ලාභාලාභ ගිණුම තුළ පෙන්වා ඇත.

## 4. බැරකම් හා ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

#### 4.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිර්වචනය කරන ලද දායකත්ව සැලැස්මක්ම නොවන පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. සුදුසුකම් ලත් ස්වාධීන ආයු ගණක විශ්ලේෂකයෙකු විසින් තීරණය කරනු ලබන මෙම බැඳියාවේ ඇස්තමේන්තුකරණයෙහිලා දිගු කාලීන උපකල්පන අවශ්‍යයෙන්ම ඇතුළත් වන්නේ ය. නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව, ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. 19 වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 - සේවක ප්‍රතිලාභ (LKAS – 19) අනුව, නියමිත ප්‍රතිපාදන ගණනය කිරීමේ දී ආයු ගණක තක්සේරු ක්‍රමය අනුගමනය කරන ලද රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විෂයයෙහි නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ තක්සේරුව තීරණය කිරීම සඳහා සුදුසුකම් ලත් ආයු ගණක විශ්ලේෂකයෙකුගේ සේවය ලබා ගැනේ. සමාගම විසින් අනුගමනය කරන ලද ආයු ගණක තක්සේරුව අරබයා ආසන්න වශයෙන් වූ ක්‍රියාකාරී තාක්ෂණික ශිල්ප ක්‍රම ද මෙම ප්‍රමිතිය මඟින් සපයා දෙයි. ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය, ආයු ගණක උපකල්පන භාවිතයෙන් ප්‍රවර්තන දත්ත ප්‍රක්ෂේපණය කර දක්වන අතර අදාළ සහභාගිත්වය දරන තැනැත්තන්ගේ උපකල්පිත විශ්‍රාම දිනයේ දී ඊට සබැඳි ප්‍රක්ෂේපිත ප්‍රතිලාභ ද ගණනය කර පෙන්වයි.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා ගෙන ඇති නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව, සැලසුම් වත්කම්වල සාධාරණ අගයෙන් අඩු කරන ලද නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ ප්‍රවර්තන අගය නියෝජනය කරයි. ආයු ගණක ලාභ සහ අලාභ, ඒවා පැන නගින මූල්‍ය වර්ෂය තුළ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ආදායම හෝ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා බැඳි පාරිතෝෂික වගකීම්, පාරිතෝෂිත අරමුදලක් මගින් වෙන් වශයෙන් හඳුනා ගනු ලබන අතර, එකී අරමුදලේ ආයෝජනය ප්‍රධාන වශයෙන් රජයේ බැංකුවක් හරහා සිදු කෙරෙන භාණ්ඩාගාර බිල්පත් අනුසාරයෙන් වන්නේ ය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 - සේවක ප්‍රතිලාභ (LKAS – 19) අනුකූලව, සේවයේ පළමු වසරේ සිට සියලුම සේවකයින් වෙනුවෙන් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැඳියාව සඳහා ප්‍රතිපාදන වෙන් කර සලසා දෙනු ලබයි.

ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය / ගිණුම්කරණ ප්‍රමිතිය යටතේ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ ප්‍රවර්තන ආයු ගණක අගය (PVDBO) යනු, තක්සේරු දිනය දක්වා වූ සේවා කාලය මත පදනම් වන නමුත්, සේවකයා තම රැකියාවෙන් ඉවත් වෙතැයි (අයහපත් සෞඛ්‍ය තත්ත්වය, විශ්‍රාම ගැනීම, මරණය සිදු වීම, සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා) අනුමාන කරනු ලබන දිනය දක්වා වූ ප්‍රක්ෂේපිත අවසාන වැටුප් ප්‍රමාණ සමඟ, යෝජනා ක්‍රමය තුළ දැනට සිටින සේවක සේවිකාවන් විෂයයෙහි උපචිත වන සියලුම ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම වේ. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික මුදල් ගෙවීමේ පනත යටතේ, සේවකයකු විෂයයෙහි අදාළ වගකීම උද්ගත වන්නේ, අඛණ්ඩ සේවා කාලය වසර පහක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

#### ආයු ගණක ලාභ සහ අලාභ හඳුනා ගැනීම

මුළු ආයු ගණක ලාභය හෝ අලාභය, එය සිදු වන කාල සීමාව තුළදීම රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගැනේ.

#### ප්‍රවර්තන සේවා පිරිවැය හඳුනා ගැනීම

සේවා අවසන් කිරීමේ පාරිතෝෂික නිශ්චිත ප්‍රතිලාභය, ව්‍යවස්ථාපිත ප්‍රතිලාභයක් වන බැවින්, ප්‍රවර්තන සේවා පිරිවැය හඳුනා ගැනීම පැන නගින්නේ, සේවා නියුක්තිය අවසන් කිරීමේ දී පොරොන්දු වූ ප්‍රතිලාභය වැඩි කිරීම සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික මුදල් ගෙවීම් පනත ඉදිරියේ දී සංශෝධනය කළහොත් පමණි. එවැනි අවස්ථාවක දී, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් දැනට පවත්නා නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුගමනය කරනු ඇත.

#### සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය, ආයු ගණක තක්සේරු කිරීම් භාවිතයෙන් තීරණය කරනු ලැබේ. ආයු ගණක තක්සේරුකරණයෙහි ලා විවිධ උපකල්පනය කිරීම්, වට්ටම් අනුපාත තීරණය කිරීම, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාත ඇතුළත් වේ. තක්සේරුවේ සංකීර්ණත්වය, ඊට පාදක වූ උපකල්පන සහ ඒවායේ දිගු කාලීන ස්වභාවය කරණ කොට ගෙන, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිත තත්වයකට යටත් වේ. අදාළ සියලු උපකල්පන සෑම වාර්තාකරණ දිනයක දී ම සමාලෝචනයට හසු කෙරේ.

සුදුසු වට්ටම් අනුපාතය තීරණය කිරීමේ දී, කළමනාකාරිත්වය ශ්‍රී ලංකා රජයේ බැඳුම්කරවල පොලී අනුපාත සලකා බලයි. මර්ත්‍යතා අනුපාතිකය, දැනට ප්‍රකාශිතව පවත්නා අදාළ මර්ත්‍යතා වගු මත පදනම් වේ. අනාගත වැටුප් වැඩිවීම් පිළිබඳ ඇස්තමේන්තුව පදනම් වනුයේ, අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාත සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීම් අනුපාතය යන කරුණු මත ය. සැලසුම් වත්කම්වල ආයෝජන කළඹ, වෙළෙඳපළ අවදානම්වලට සහ ණය අවදානම්වලට නිරාවරණය වේ.

සැලසුමක ප්‍රතිලාභ වෙනස් කරනු ලබන විට හෝ සැලසුමක් ලුහුඩු කරන කල්හි, අතීත සේවයට අදාළ ප්‍රතිලාභ විෂයයෙහි සිදු වන වෙනස හෝ අදාළ ලුහුඩු කිරීමේ ලාභය හෝ අලාභය, ලාභ හෝ අලාභ ගිණුම තුළ වහා හඳුනා ගැනේ. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් එකී ලාභය හෝ අලාභය නිශ්චිත සැලැස්මක් නිරාකරණය කිරීම මත හඳුනා ගනු ලබන්නේ, එම නිරවුල් කිරීම සිදු කරන අවස්ථාවේ දී ය.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව නිර්ණය කරනු ලැබ ඇත්තේ, සීමාසහිත ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ප්‍රයිවේට් ලිමිටඩ් ආයතනයේ ආයු ගණකඥ, මුනිසාමි පූපලනාදන් මහතා විසින් සිදු කරන ලද ආයු ගණක තක්සේරු කිරීම් මත පදනම්ව ය.

**4.1.2 නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට හා සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වයට සුදුසුකම් ඇති සියලුම සේවකයන් අදාල රෙගුලාසි වලට අනුකූලව අදාළ දායකත්ව අරමුදල් මගින් ආවරණය කරනු ලැබේ. සේවකයන් ආවරණය කරමින් අර්ථසාධක අරමුදලට හා භාරකාර අරමුදලට සැපයෙන දායකත්වයන් පිළිබඳ වගකීම් භාරයන් ආදායම් ප්‍රකාශය තුළ වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

**සේවක අර්ථසාදක අරමුදල**

සංස්ථාවේ සියලුම සේවකයින් සේවක අර්ථසාදක අරමුදලේ සාමාජිකයන් වන අතර සංස්ථාව විසින් සේවක ඒකාබද්ධ වැටුපෙන් 15% ක් අරමුදලට දායක කරනු ලබයි.

**සේවක භාරකාර අරමුදල**

සංස්ථාව සේවකයන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායක කරනු ලබයි.

**4.1.3 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ**

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ ඒවායේ පිරිවැය අනුව සඳහන් කර ඇත. වෙළඳ සහ අනිකුත් ගෙවිය යුතු දේ ප්‍රථමයෙන් සාධාරණ වටිනාකම මත අගය කර පසුව සඵල පොළී අනුපාතිකය ආධාරයෙන් ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට හානිකරණ සඳහා ප්‍රතිපාදනයන් අඩුකරයි. 2023.12.31 දිනට සැලකිය යුතු අවදානමක් නොමැති බැවින් පසු වර්ෂයන්හිදි ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂිත පිරිවැයන් සඳහා සංස්ථාව කිසිදු ප්‍රතිපාදනයක් සිදු කොට නැත.

**4.1.4 ප්‍රතිපාදන**

**පොදු**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන (නෛතික හෝ අර්ථවිග්‍රහ කළ) වගකීම් භාරයක් සංස්ථාවට ඇති විට ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. අදාළ වගකීම පියවනු පිණිස ආර්ථික ප්‍රතිලාභයක් ඇති වත්කම් වලින් මුදල් ප්‍රවාහයක් ගලා යන්නේ නම් සහ වගකීම් භාරයේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් කළ හැකි වීමේ හැකියාව තිබිය හැකිය. සංස්ථාව ප්‍රතිපාදනයෙන් කොටසක් හෝ සමස්තයම ප්‍රතිපූරණය කෙරෙනු ඇතැයි අපේක්ෂා කරන තැන්හිදී (නිදසුනක් ලෙස රක්ෂණ ගිවිසුමක් යටතේ) වුවද ප්‍රතිපූරණය වෙනම වත්කමක් ලෙස හඳුනා ගනු ලබන්නේ ප්‍රතිපූරණය නිශ්චිතවම හඳුනාගත් විටය. කවර හෝ ප්‍රතිපාදනයක් සම්බන්ධයෙන් වූ වියදමක් ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලබන්නේ ඊට අදාල ප්‍රතිපූරණයන් අඩු කොටය.

මුදලේ වර්තමාන අගයේ වෙනස්වීම වැදගත් නම්, උචිත තැන්හිදී බැරකමට වන විශේෂිත අවදානම් සඳහා පිළිඹිබු කරන වත්මන් බදු-පූර්ව අනුපාතිකයක් භාවිතා කරමින් ප්‍රතිපාදන වට්ටම් කෙරේ. වට්ටම්කරණය භාවිතා කරන තැන්හිදී කාලය ගත වීමත් සමගම ප්‍රතිපාදනයේ ඇති වන වෙනස මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

## 5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා වියදම් ශ්‍රිත ක්‍රමය යොදා ගෙන ඇත්තේ එමගින් සංස්ථාවේ කාර්යසාධනයෙහි සංරචකයන් සාධාරණව නිරූපනය වන නිසාය.

### 5.1.1 පිරිවැටුම

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ බෙදා හරින්නන් වෙත කෙරෙන අලෙවියෙන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පිරිවැටුම සමන්විත වේ.

### 5.1.2 ආදායම් හඳුනා ගැනීම

ගෙවන අවස්ථාව කවරක් වුවද, ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා ඒමේ හැකියාව ඇති හා ආදායම හා ඊට සම්බන්ධ පිරිවැය විශ්වාසය තැබිය හැකි අයුරින් මැනිය හැකි මට්ටමට ආදායම හඳුනා ගනු ලැබේ. ගිවිසුම්ගතව නිර්වචනය කරන ලද ගෙවීමේ නියමයන් සැලකිල්ලට ගනිමින් හා බදු හෝ තීරු ගාස්තු බැහැර කරමින්, ලැබුණු හෝ අය විය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. සංස්ථාව සිය ආදායම් සැලසුම් වල විධිවිධානයන් දෙනු ලබන ප්‍රධානියා වේ.

**භාණ්ඩ අලෙවිය**

ආයතනයේ විකිණුම් ආදායම සමන්විත වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය වෙත කරන ලද විකිණුම්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට හා අප වෙත ලියාපදිංචිව සිටින බෙදා හරින්නන් වෙත කෙරෙන විකිණුම් වලින් වේ.භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගනු ලබන්නේ ආයතනයේ අවදානම සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත මාරු කළ පසුවය.

**සංස්ථාවේ ආදායම පහත සඳහන් ප්‍රභවයන්ගෙන් සැකසී ඇත.**

(අ) වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ සැපයීම

(රජයේ රෝහල්) - සංස්ථාව නිෂ්පාදනය කරන ඖෂධ සහ බද්ධ ව්‍යාපාර වලින් මිලදී ගන්නා ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත විකිණීම සිදු කරයි. නිෂ්පාදන වෛද්‍ය සැපයුම් අංශයට මාරු කරන අවස්ථාවේදී "විකිණුම්" ආදායමක් ලෙස හඳුනා ගැනේ. රා.ඖ.නි.ස. බද්ධ ව්‍යාපාර නිෂ්පාදන වෛද්‍ය සැපයුම් අංශයට සපයනු ලබන්නේ මිලදී ගැනුම් මිලට 6% ක් එකතු කිරීමෙනි.

සංස්ථාව පහත සඳහන් බද්ධ ව්‍යාපාර පිහිටුවා ඇත.

| ආයතනයේ නම | ලිපිනය | හිමිකාරීත්වයේ ප්‍රතිශතය | ප්‍රධාන ක්‍රියාකාරකම |
|---|---|---|---|
| සෙලොජන් ලංකා පුද්ගලික සමාගම | 116, ලයාඩ්ස් බ්‍රෝඩ්වේ, කොළඹ 14 | 10% | SPMC හරහා වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය හා බෙදා හැරීම |
| දියත ෆාමසියුටිකල් ඇන්ඩ් හෙල්ත්කෙයා පුද්ගලික සමාගම | 53/ඒ/1, බටගම උතුර, ජාඇල | 10% | SPMC හරහා වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය හා බෙදා හැරීම |
| ග්ලොසන්තේ පුද්ගලික සමාගම | 372, සර් කුඩාරත්වත්තේ මාවත, දොඩන්වල, මහනුවර | 10% | SPMC හරහා වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය හා බෙදා හැරීම |
| මෙඩිකොම් පුද්ගලික සමාගම | 20, විජිතපාර, නැදිමාල, දෙහිවල | 10% | SPMC හරහා වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය හා බෙදා හැරීම |
| යාඩින් ලැබොරටොරීස් පුද්ගලික සමාගම | 67, නොරිස් කැනල් පාර, කොළඹ 10 | 10% | SPMC හරහා වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය හා බෙදා හැරීම |
| සැන්ඩ්ස් ඇක්ටිව් පුද්ගලික සමාගම | 36, අබ්දුල් ජබාර් මාවත, කොළඹ 12. | 10% | SPMC හරහා වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය හා බෙදා හැරීම |

සංස්ථාව හා බද්ධ ව්‍යාපාර සමාගම්, බද්ධ ව්‍යාපාරයේ ඉහත සඳහන් කොටස් හිමිකම සම්බන්ධයෙන් කොටස් හිමි ගිවිසුමක් ක්‍රියාත්මක කළ යුතුය. මෙම බද්ධ ව්‍යාපාර සමාගම් SPMC වෙත ප්‍රධානය කරන ලද මෙම කොටස් හිමිකාරත්වයේ ප්‍රතිශතය, ගිවිසුමේ අපේක්ෂිත කාලය පුරාවටම පවත්වාගෙන යාමට වගබලා ගනී.

කොටස් හිමිකම පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

| කොටස් හිමි ආයතනය | කොටස් ගණන | නිකුතු දිනය | වටිනාකම (රු) |
|---|---|---|---|
| සෙලොජන් ලංකා පුද්ගලික සමාගම | 3,000,000 | 21.10.2020 | 3,000,000 |
| දියත ෆාමසියුටිකල් ඇන්ඩ් හෙල්ත්කෙයා පුද්ගලික සමාගම | 1,500,000 | 21.10.2020 | 1,500,000 |
| ප්‍රීමියම් ඉන්ටනැෂනල් ඉන්ජෙක්ටබල් පුද්ගලික සමාගම | 16,162 | 22.12.2020 | 16,162 |
| සැන්ඩ්ස් ඇක්ටිව් පුද්ගලික සමාගම | 33 | 15.11.2019 | 33 |
| යාඩින් ලැබොරටොරීස් පුද්ගලික සමාගම | 4,111,111 | 07.06.2021 | 4,111,111 |
| සිනර්ජි පාර්මසියුටිකල්ස් පුද්ගලික සමාගම | 10 | 01.07.2018 | 10 |
| ග්ලොසන්තේ පුද්ගලික සමාගම | 10 | 06.06.2022 | 10 |

(ආ) බෙදා හරින්නන් හරහා ඖෂධ සැපයීම : සංස්ථාව 2003 සිට බෙදා හරින්නන් හරහා ඖෂධ අලෙවි කරයි.

**ආදායම වර්ගීකරණය**

විකිණුම් වල ස්වභාවය අනුව ආදායම වර්ගීකරණය කර ඇත.

| | | 2023 | 2022 |
|---|---|---|---|
| වෛද්‍ය සැපයුම් අංශය | -SPMC නිෂ්පාදන | 6,529,310,266 | 5,365,222,678 |
| | -බද්ධ ව්‍යාපාර නිෂ්පාදන | 20,166,340,889 | 8,562,572,974 |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | -SPMC නිෂ්පාදන | - | 96,546,063 |
| | -බද්ධ ව්‍යාපාර නිෂ්පාදන | - | 11,860,062 |
| බෙදාහරින්නන් | -SPMC නිෂ්පාදන | 2,432,304,839 | 2,458,969,992 |
| | -බද්ධ ව්‍යාපාර නිෂ්පාදන | 203,762,697 | 125,012,890 |

**විකිණුම් මත වට්ටම්**

**බෙදාහරින්නන් වෙත විකිණුම්**

| | |
|---|---|
| ණයට විකිණුම් | 9% |
| මුදලට විකිණුම් | 10% |

**නියෝජිත ඔසුසල් වෙත විකිණුම්**

| | |
|---|---|
| රු.50,000 සිට රු.100,000 | |
| දක්වා ණයට විකිණුම් | 6% |
| රු.50,000 සිට රු.100,000 | |
| දක්වා මුදලට විකිණුම් | 7% |
| වෛද්‍යවරුන් හට මුදලට විකිණුම් | 5% |

**රාජ්‍ය ඖෂධ සංස්ථාව වෙත සෘජු විකිණුම්**

| | |
|---|---|
| ණයට විකිණුම් | 10% |

**5.1.3 වියදම්**

වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී, ව්‍යාපාරය පවත්වා ගෙන යාමෙන් ඇති වූ සියලුම වියදම් ආදායමෙන් අඩු කර ඇත. අළුත්වැඩියාවන් හා අළුත් කිරීම් එම වියදම ඇති වූ වර්ෂයේ ලාභ අලාභවලට අය කරනු ලැබේ.

**5.1.4 මූල්‍ය වියදම්**

මූල්‍ය වියදම් සමන්විත වන්නේ බැංකු අයිරා මත පොළිය, ණයවර ලිපි විවෘත කිරීමේ වියදම්, සහ ණය පහසුකම් ගිවිසුම් ගාස්තු යන මේවායින්ය.

**5.1.5 පොදුකාර්ය වියදම් ප්‍රතිපාදනය**

මූල්‍ය ප්‍රකාශ තුළ පොදුකාර්ය ප්‍රතිපාදන ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

**වියදම්**

ඇ. වරිපනම් බදු, විදුලිය, ජල ගාස්තු, රක්ෂණ, උපකරණ නඩත්තු, පොදු නඩත්තු, ගොඩනැගිලි නඩත්තු, ක්ෂය

ආ. සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ වාරිකය, කාර්ය මණ්ඩල සුභසාධනය, නිල ඇඳුම් හා පාවහන්, ප්‍රවාහන ගාස්තු

ඇ. අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු, වෙනත් දිරිදීමනා, මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු, වාහන සඳහා ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය, තැපැල් හා ෆැක්ස් ගාස්තු, දුරකථන ගාස්තු, ආරක්ෂක ගාස්තු, වාහන හා ඖෂධ බලපත්‍ර ගාස්තු, මුද්‍රණ කටයුතු හා ලිපිද්‍රව්‍ය, කාර්යාල වියදම්, විගණන ගාස්තු, කුළී ගාස්තු, ප්‍රචාරක දැන්වීම්, වෙළඳ දායකත්වයන් හා වාර සඟරා, නීති හා පරීක්ෂණ වියදම්, වෘත්තීයවේදී ගාස්තු, සංග්‍රහ, වාර්ෂික දායකත්වයන්, වාර්ෂික සමුළු හා රැස්වීම්, මුද්දර ගාස්තු, ලිපිද්‍රව්‍ය තොග සත්‍යාපන ගැලපුම්.

ඈ. කාර්ය මණ්ඩල ප්‍රතිලාභ සහ වෙනත් වියදම්

**ප්‍රතිපාදන ක්‍රමය**

අ. අදාල පිරිවැය සෘජුවම නිෂ්පාදන හෝ පරිපාලන වියදම් ලෙස හඳුනා ගනු ලබන අවස්ථා වලදී ඒ ඒ පිරිවැය යටතේද පොදු පිරිවැයක් වන්නේ නම් එයද 70% හා 30% වශයෙන් පිලිවෙලින් නිෂ්පාදන හා පරිපාලන වශයෙන් වෙන් කරනු ලැබේ.

ආ. එක් එක් අංශයේ සිටින සේවක සංඛ්‍යාව පදනම් කර ගෙන පිරිවැය බෙදනු ලැබේ.

ඇ. තථ්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කෙරේ.

ඈ. තථ්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කෙරේ.

**6. මූල්‍යකරණ මෙවලම්**

**6.1 මූල්‍ය වත්කම්**

**මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 හි විෂයපථය තුළ මූල්‍ය වත්කම් වර්ගීකරණය වී ඇත්තේ ලාභ අලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම්, ණය හා අය විය යුතු දේ, කල් පිරීම දක්වා කරනු ලබන ආයෝජන හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙසයි. ඒ අනුව වටිනාකම ආයතන වලට යෝග්‍ය ආකාරයට තම මූල්‍ය වත්කම් වර්ගීකරණය නිර්ණය කළ යුතුය.

සියලුම මූල්‍ය වත්කම් වෙළඳපල වටිනාකමට අගය කලයුතු අතර වෙළඳපල අගය තීරණය කල නොහැකි අවස්ථා වල එම මූල්‍ය වත්කම් ගනුදෙනු අගය කල පිරිවැයට අගය කල යුතුය. සංස්ථාවේ මූල්‍ය වත්කම් වලට මුදල් හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන, වෙළඳ හා වෙනත් අයවිය යුතු දේ, කාර්ය මණ්ඩල ණය, සහ වෙනත් අය විය යුතු දේ ඇතුළත් වේ.

**පසු තක්සේරුව**

මූල්‍ය වත්කම් වල පසු වර්ෂ වල තක්සේරුව පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

**6.1.1 ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම්**

ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම් වලට අන්තර්ගත වනුයේ විකිණීම සඳහා වෙන් කරන ලද මූල්‍ය වත්කම් හා මුල් හඳුනාගැනීමේදී මෙම වර්ගීකරණයට අයත් යැයි නිර්ණය කරන ලද මූල්‍ය වත්කම්ය. මූල්‍ය වත්කම් නුදුරු කාලයේදී විකිණීමේ හෝ යළි මිලට ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇති නම් ඒවා විකිණීම සඳහා වෙන්කරන ලද මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

### 6.1.2 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ අය විය යුතු දේ වනාහි ක්‍රියාශීලී වෙළඳපලක තක්සේරු නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික හඳුනා ගැනීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසු වර්ෂයන් හි තක්සේරු කරනු ලබන්නේ හානිවීම අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය. ගාස්තු හා පිරිවැය සහ අත්කර ගැනීමේදී වූ වට්ටම් හෝ විශේෂ දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කල සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදයම තුළ සඵලපොලී අනුපාතික ක්‍රමක්ෂය ඇතුළත් කරනු ලැබේ. හානිවීම් නිසා පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ.

### 6.1.3 කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන වෙළඳපලේ විකිණීමක් නොකරන සංස්ථාවට කල්පිරීම දක්වා දැරීමේ හැකියාව හා සාධනීය චේතනාව තිබේ නම් ඒවා කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ. මූලික හඳුනාගැනීමෙන් පසුව කල් පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන තක්සේරු කරනු ලබන්නේ හානිවීම් අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය. ගාස්තු හා පිරිවැය සහ අත්කර ගැනීමේදී වූ වට්ටම් හෝ විශේෂ දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලබන පොළී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම තුළ සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ඇතුළත් කරනු ලැබේ. හානිවීම් තුලින් පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන නොතිබුණි.

### 6.1.4 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන වලට කාරක ප්‍රාග්ධනය හා ණය සුරැකුම් ඇතුළත්ය. විකිණීමට ඇති මූල්‍ය ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇත්තේ කාරක ප්‍රාග්ධන ආයෝජන විකිණීම සඳහා රඳවා ගනු ලබන ලෙස වර්ගීකරණය කරනු ලැබූ ,ලාභ හෝ අලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය කර නොමැති ඒවාය. මෙම ප්‍රභේදය තුල ඇති ණය සුරැකුම් වනාහි ද්‍රවශීලතාව සඳහා වූ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳපල තත්ත්වයන්ගේ වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් අලෙවි කරනු ලැබිය හැකි අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා රඳවනු ලැබීමට අපේක්ෂා කෙරෙන ඒවාය.

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන මූලික හඳුනාගැනීමෙන් පසුව, සමුච්චිත අලාභය, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ යළි වර්ගීකරණය කොට විකිණීමට ඇති සංචිතයෙන් ඉවත් කෙරෙන අතර, සමුච්චිත අලාභය වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනා ගන්නා හෝ හානි වූ ලෙස නිර්ණය කරනු ලබන අවස්ථාවක, ආයෝජන ලෙස හඳුනා නොගැනීමක් කෙරෙන තෙක්, විකිණීමට ඇති සංචිතය තුළ අනෙකුත් අංග සම්පූර්ණ ආදායම ලෙස හඳුනා ගනු ලැබූ අනු උපලබ්ධි ලාභ හෝ අලාභ සමග වෙළඳපල වටිනාකමට තක්සේරු කරනු ලැබේ. විකිණීමට ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලැබේ.

සංස්ථාව සිය විකිණීමට ඇති මූල්‍ය වත්කම් තක්සේරු කරනුයේ නුදුරු කාලයේදී මෙම මූල්‍ය වත්කම් විකිණීමට ඇති හැකියාව හා අභිප්‍රාය තවමත් උචිතද යන්න නිශ්චය කරනු පිණිසය. වෙළඳපලේ අක්‍රීය බව නිසා මෙම මූල්‍ය වත්කම් ගනුදෙනු කිරීමට සංස්ථාවට නොහැකි වන විට සහ එසේ කිරීමට කළමනාකාරිත්වයට ඇති අභිප්‍රාය සාදෘශ්‍ය අනාගතයේදී සැලකිය යුතු ලෙස වෙනස් වන විට, සංස්ථාව ඉතා කලාතුරකින්

මෙම මූල්‍ය වත්කම් යළි වර්ගීකරණය කිරීමට තීරණය කිරීමට ඉඩ ඇත. මූල්‍ය වත්කම් ණය හා අයවිය යුතු දේවල නිර්වචනය සපුරාලයි නම් සහ සාදෘශ්‍ය අනාගතය තුළ හෝ කල්පිරෙන තෙක් මෙම වත්කම් රඳවා ගැනීමට ඇති හැකියාව හා අභිප්‍රාය බැංකුවට ඇති විට ඒවා ණය හා අයවිය යුතු දේ ලෙස යළි වර්ගීකරණය කිරීමට අවසර ලැබේ. කල්පිරෙන තෙක් රඳවනු ලබන ආයෝජන ලෙස යළි වර්ගීකරණය කිරීමට අවසර ලැබෙනුයේ ආයතනයට අදාළ මූල්‍ය වත්කම එලෙස රැඳවීමට හැකියාව හා අභිප්‍රාය තිබේ නම් පමණි.

| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | | | |
| - බෙදාහරින්නන් හරහා | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | 75,474,864 |
| - ටෙන්ඩරපත් හරහා | ගනුදෙනුකරු | භාණ්ඩ විකිණීම | - |
| බෙදාහරින්නන් | | | 2,560,592,672 |
| **එකතුව** | | | **29,331,718,691** |

# විගණන

# වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

එම්එස්යූ/සී/එස්පීඑම්සී/1/23/50 2024 ජූලි 25 දින

සභාපති
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.3 සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු  ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 103,104,105 | නිෂ්පාදන අංශය තුළ සිදු වූ රු.1,551,283ක මූල්‍ය අලාභයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා තිබුණද, රජයට සිදුවී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදය. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වට්ටෝරු හා පර්යේෂණ තනතුර සඳහා අඛණ්ඩව වර්ෂ 05 කට අධික කාලයක් වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු පත් කර තිබුණි. ඊට අමතරව වසරකට වැඩි කාලයක සිට නියෝජ්‍ය සාමාන්‍යධිකාරි මානව සම්පත් හා නියෝජ්‍ය සාමාන්‍යධිකාරි අලෙවි තනතුරු 02 සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරිණියන් දෙදෙනෙකු පත් කර තිබුණි. 2018 සිට 2021 දක්වා කාල සීමාව තුළ අවස්ථා 04කදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වට්ටෝරු පර්යේෂණ සහ සංවර්ධන තනතුර හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තත්ව පාලන යන තනතුරු ද්විත්වය සඳහා අයදුම්පත් කැඳවා තිබුණද සුදුසු පුද්ගලයෙකු බඳවා ගැනීමට අපොහොසත් වී තිබුණි. |
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් (SOE) සඳහා වන මෙහෙයුම් අත්පොත 3.4 (X) හා 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයේ VI ඡේදය | අනුමත කාර්ය මණ්ඩලයේ සේවකයින් විශ්‍රාම යෑමේදී අදාල පුරප්පාඩු පිරවීම සඳහා විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් (Succession Plan) සකස් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ (Guidelines on Corporate Governance for state owned Enterprises) චක්‍රලේඛයේ 2.6 ඡේදය | අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්වරයකු මේ දක්වාම බඳවා ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2023 සැප්තැම්බර් 29 දිනැති අංක SEC/2023/E/01 දරන දේශීය ආදායම් චක්‍රලේඛයේ 7 (g) ඡේදය | සංස්ථාව විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා ප්‍රාථමික සේවා නියුක්ති ප්‍රකාශයක් හා ද්විත්ව සේවා නියුක්ති ප්‍රකාශයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඊට අදාළව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අඩුකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) උපදේශක තෝරාගැනීම සම්බන්ධයෙන් වන FIDIC මාර්ගෝපදේශයේ 2.8 වගන්තිය හා 2007 අගෝස්තු උපදේශන ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.6 වගන්තිය | පෙන්සිලීන් කලාපය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ උපදේශන සේවා සපයන ආයතනය විසින් වෘත්තීය නොසැලකිල්ල මත පැන නගින අවධානම ආවරණය කිරීම වෙනුවෙන් ලබාදිය යුතු වෘත්තිය වගකීම් රක්ෂණ (Professional Liability Insurance) සහතිකය ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) 2015 ජුනි 04 දිනැති අංක BP/30/15 හා 2022 සැප්තැම්බර් 22 දිනැති අංක BP/62/22 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතියකින් තොරව සේවකයින් සඳහා ගෙවනු ලබන පා පැදි ණය රු. 20,000 සිට 75,000 දක්වා වැඩි කර තිබුණි. |
| (ඌ) බද්ධ ව්‍යාපාර සඳහාවූ ගිවිසුම | |
| (i) අංක 5.2.4 දරන වගන්තිය | ආයෝජකයන් විසින් ගිවිසුම් ගතවී මාස 03 ක් ඇතුළත සිය නිෂ්පාදනාගාර (Plant) ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතු වුවද, ආයෝජකයින් 08 දෙනෙකු විසින් අදාළ නිෂ්පාදන සැපයීම සඳහා සූදානම් වීම පිළිබඳව සංස්ථාව විසින් තහවුරුවක් ලබාගෙන නොතිබුණි. |
| (ii) අංක 10 වගන්තිය | තෝරාගත් නියැදියට අනුව වටිනාකම රු.362,851,044ක් වූ එන්නත් 978,587ක ප්‍රමාණයක් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට සැපයීමට ප්‍රථමයෙන් තෝරාගත් පුද්ගලික ආයතනය විසින් ඉදිරිපත් කළ යතෝක්ත කාර්ය සාධන සුරැකුම්වල කාලය ඉකුත් වී තිබූ අතර, ඒ පිළිබඳ සමාලෝචනය කර එම සුරක්ෂණ දීර්ඝ කර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. |

| | |
|---|---|
| (iii) අංක 2.1.1 වගන්තිය | තෝරාගත් පුද්ගලික ආයතනය විසින් තම කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 10කට සමාන කොටස් 4,111,111 ක් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත නිකුත් කර තිබුණද 2022 වර්ෂය වෙනුවෙන් නිකුත් කළ වාර්ෂික වාර්තාවේ උපලේඛන යටතේ ඒ බව හෙළිදරව් කර නොතිබුණි. |
| (iv) උපලේඛන 1හි 1 වගන්තිය | 2023 වර්ෂයේ දෙවැනි අර්ධ වර්ෂයේ සිට මේ දක්වා තෝරාගත් පුද්ගලික ආයතනය සපයන එන්නත් වෙනුවෙන් මිල සමාලෝචනයක් අදාල පාර්ශව විසින් සිදුකර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය, සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2023 වර්ෂයේ Amoxicillin අමුද්‍රව්‍ය අවශ්‍යතාවය වෙනුවෙන් ඇණවුම් අංක 20231556AA යටතේ Amoxicillin අමුද්‍රව්‍ය 9000නටක් මිලදී ගැනීම සඳහා සිදුකළ ප්‍රසම්පාදනයේදී සමස්ථ අමුද්‍රව්‍ය ප්‍රමාණය එකවර ආනයනය නොකර මූලිකව 25නටක් සපයාගෙන සිදුකළ නිෂ්පාදනයන්ගේ ව්‍යුහාත්මක ස්ථායිතාවය අඛණ්ඩව පරීක්ෂා කර, ප්‍රගතිය සාර්ථක නම් ඉතිරි ප්‍රමාණය ආනයනය කිරීම සඳහා බහුතරය රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිළධාරීන්ගෙන් සැදුම්ලත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබා දුන් නිර්දේශය හා සංස්ථාවේ තත්ව පාලන අංශයේ නිර්දේශය ප්‍රසම්පාදන කමිටුව විසින් සලකා නොතිබුණි. අමුද්‍රව්‍ය වල ප්‍රගතිය පරීක්ෂාවකින් තොරව කඩිනම්ව සිදු කළ උක්ත ප්‍රසම්පාදනය හරහා මිලදී ගත් අමුද්‍රව්‍ය ගුණත්වය අසමත් වී තිබීම හේතුවෙන් සමාලෝචිත විගණිත දින දක්වා මාස 10ක කාලයක් සංස්ථා පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවති අතර ඒ සඳහා දරා තිබුණ රු. 104,844,337ක් වූ පිරිවැය අනාර්ථික වී තිබුණි.

(ආ) ඇණවුම් අංක 20231556AA යටතේ සැපයුම්කරු වෙත සංස්ථාවෙන් නිකුත් කළ කොන්ත්‍රාත් ප්‍රදාන ලිපිය මගින් සැපයිය යුතු ලෙස අවධාරණය කරන ලද පූර්ව නියැදි පරීක්ෂාවෙන් තහවුරු කරන ලද අමුද්‍රව්‍ය කාණ්ඩ 09ට පරස්පර කාණ්ඩ 09ක් යටතේ අමුද්‍රව්‍ය සපයා තිබුණි. සංස්ථාව පූර්ව නියැදි පරීක්ෂා කර ගුණත්වය තහවුරු කරන ලද කාණ්ඩ අංක හා සපයන ලද අමුද්‍රව්‍ය කාණ්ඩ අංක නොසැසඳෙන බව 2023 සැප්තැම්බර් 07 දින සැපයුම්කරු වෙත දන්වා තිබුණේ අමුද්‍රව්‍ය සංස්ථාව වෙත භාරගෙන තොග ලෙජරයට ඇතුලත් කළ පසුව වූ අතර භාණ්ඩ භාර ගැනීමට පෙර පූර්ව පරීක්ෂාවක් සිදුකර අදාල

කොන්දේසි හා එකඟ බවට තහවුරු කිරීමේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා නොග ැනීම හේතුවෙන් කොන්දේසි හා එකඟ නොවූ අමුද්‍රව්‍ය තොගයක් භාර ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 (අ) ප්‍රකාරව සපයන ලද භාණ්ඩ පිරිවිතරවලට සහ වෙනත් එකඟ වූ නියමයන්ට අනුකූල බවට ස්ථානභාර නිලධාරියා විසින් සහතිකයක් නිකුත් කළ යුතු වන අතර සංස්ථාවේ ආනයනික අමුද්‍රව්‍ය භාර ගැනීමේදී එවැනි පරිචයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2022 වර්ෂයේ ඇති වූ විදේශ විනිමය අර්බුදය හමුවේ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ඖෂධ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමේ අරමුණෙන් අමුද්‍රව්‍ය ආනයනය සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් (TOD) 2022 වර්ෂයේදී ලබාදී තිබූ රු.4,373,072,154 කට සමාන වූ එ.ජ.ඩොලර් 15,350,621ක ප්‍රතිපාදනය, 2023 වර්ෂය අවසන් වන විට නිසි පරිදි උපයෝජනය කර නොතිබුණි.

(ආ) 2022 වර්ෂයේ හඳුන්වාදී තිබූ නව ඖෂධ 10 අතුරින් Rosuvastatin Table IP 10mg හා Aspirin GR Tablets BP 75mg ඖෂධ නිෂ්පාදනය සමාලෝචිත වර්ෂයේදී අපේක්ෂිත නිෂ්පාදන ප්‍රගතියට ළඟා වී නොතිබුණ අතර වෙළඳපොල ඉල්ලුම පවතින blister pack ඖෂධය යන්ත්‍ර ධාරිතාවය නොමැති හෙයින් නිෂ්පාදනය සිදු කර නොතිබීම හේතුවෙන් අදාල ඖෂධ නිපදවීමේ අපේක්ෂාවෙන් මිලදී ගෙන තිබූ පිරිවැය රු.14,315,960ක් වූ අමුද්‍රව්‍ය 572kg ක් වර්ෂය තුළ භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවති අතර මෙම ඖෂධ කාණ්ඩ දෙක 2024 වර්ෂයේදී ද නිෂ්පාදනය කිරීමට සැලසුම් කර නොතිබුණි.

(ඇ) 2018 සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල නව ඖෂධ වර්ග 25 ක් පමණ හඳුන්වා දී තිබුණද (Omeprazole Gr Capsules IP 20mg Levothyroxine (Thyroxine), Atorvastatin, Flucloxacillin, Cetirizine BP 10mg, Diltiazem Hydrochloride Tablets USP 30mg ඖෂධ හැර) අළුතින් හඳුන්වා දී තිබූ ඖෂධ අඛණ්ඩව නිෂ්පාදනයට සහ ප්‍රවර්ධනයට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබීම හේතුවෙන් සංස්ථාවේ නිෂ්පාදන මිශ්‍රණය සඳහා එම හඳුන්වාදීම් වලින් ප්‍රමාණවත් දායකත්වයක් සිදු වී නොතිබුණි.

(ඈ) Clopidogrel Tablets USP 75 mg (500 Pack Size) ඖෂධය 2020 වර්ෂයේ නව ඖෂධයක් ලෙස සංස්ථාව තුළ නිපදවීම හඳුන්වා දී තිබුණද, එහි නිෂ්පාදන සූත්‍රයෙහි (Formula) පවතින දුර්වලතාවයන් හේතුවෙන් එම ඖෂධයේ විසිරීම (Dissolution) නිසි අවශ්‍යතාවට නොගැලපීම මත සංස්ථාව තුළ නිපදවීම අසාර්ථක වී තිබුණි. නිෂ්පාදන සූත්‍රය සංවර්ධනය කර මෙම ඖෂධය සංස්ථාව තුළ නිපදවා වෛද්‍ය සැපයීම් අංශයේ අවශ්‍යතා වෙනුවෙන් සපයන්නේ නම් සියයට 10ක ලාභයක් ළඟා කර ගැනීමට අවස්ථාව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) 2023 වර්ෂය තුළදී සංස්ථාව විසින් නිෂ්පාදනය කර පෞද්ගලික වෙළඳපොළ (බෙදාහරින්නන්) වෙත අලෙවි කර තිබූ ඖෂධ වර්ග 10ක් ඒවායේ නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් අලෙවි කිරීම තුළින් සංස්ථාවට සමාලෝචිත වර්ෂයේදී රු.15,265,626ක අලාභයක් දැරීමට සිදුවී තිබුණි.

(ඒ) සංස්ථාවේ දැනට භාවිතා වන සිසිලන පද්ධතියේ ප්‍රමාණාත්මක නොවීම හේතුවෙන් සිසිලන ඉල්ලුම සපුරාලන කාර්යක්ෂම සිසිලන පද්ධතියක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාව පෙන්වා දී තිබූ අතර එම යෝජනාවට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් එය ක්‍රියාත්මක තත්වයට පත් වී නොතිබුණි. මෙය සංස්ථාවේ බලශක්ති පරිභෝජනයේ පිරිමැසුම්දායීබවට ඍණාත්මකව බලපා තිබුණි.

(උ) සංස්ථාවේ නිෂ්පාදිත නිමි ඖෂධ තොග ගබඩා කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේ කඳවල පාරේ දෙමහල් ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර, එහි ඉදිකිරීම් අතරමඟ නතර කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.46,032,361ක් වැය කර තිබුණි. විගණිත දින වන විට මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කර තිබූ අතර, එය ලංසු ඇගයීම් අදියරේ පැවතුණි. මෙම දෙමහල් ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු 2018 සිට වසර 06කින් ප්‍රමාද වීම නිසා ඉන් අපේක්ෂිත අරමුණු ඉටු නොවී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංස්ථාවේ ගබඩා පහසුකම් වෙනුවෙන් කුලී පදනම් මත ගබඩා පහසුකම් ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.41,796,482 ක වියදමක් දරා තිබුණි.

(ඌ) වෛද්‍ය සැපයීම් අංශයේ අංක 2023/SPM/N/R/P/000467 දරන සාමාන්‍ය ඇණවුම වෙනුවෙන් Tranexamic Acid Injection 500mg/5ml Ampoule ඒකකයක් රු.92.45 බැගින් රු.27,735,000ක මුළු පිරිවැයකට එන්නත් ඒකක 300,000ක් මිලදී ගැනීම සඳහා ආයතනයක් වෙත ගැනුම් ඇණවුම නිකුත් කර තිබුණි. දෙන ලද කාල රාමුව අනුව එන්නත් ඒකක 300,000ක් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට සැපයීම් කළ යුතු වුවද, යතෝක්ත ඇණවුම සම්පූර්ණ කිරීම සඳහා මාස 04 ක වැඩිපුර කාලයක් ගතකර තිබුණි. 2023 අප්‍රේල් 06 දින රැස්වූ මිල කමිටුවේ තීරණය අනුව මෙම එන්නතේ මිල සංශෝධනයක් සිදුවී තිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පුද්ගලික ආයතනය විසින් ප්‍රමාද වී සැපයීම් කළ කාණ්ඩ අංක (Lot No.) YA230012 යටතේ වූ එන්නත් ඒකක 30,540ක් වෙනුවෙන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට අතිරේකව රු.7,980,713 ක මුදලක් සැපයුම්කරුට ගෙවා තිබුණි.

(එ) දේශීයව ඖෂධ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා යෝග්‍ය පෞද්ගලික ආයෝජකයන් අතර බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා වූ යෝජනාව යටතේ සංස්ථාව විසින් විභව ආයෝජකයන් 15 දෙනෙකු සමඟ ඖෂධ සැපයීම සඳහා 2018, 2019 හා 2021 වර්ෂයන්හිදී ගිවිසුම් ගතවී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයෝජකයන් 05 දෙනෙකුගෙන් පමණක් සංස්ථාව ඖෂධ මිලදී ගෙන තිබුණි.

(ඒ) පුද්ගලික ආයතනයක් වෙතින් අන්තරායකාර ඖෂධයක් වන Midazolam Injection BP 5mg Ampoule එන්නත් ඒකකයක මිල රු.330 පදනම් කර ගනිමින් අවස්ථා 7කදී එම ආයතනය විසින් සපයා තිබුණු අතර 2023 මැයි මස සිට මෙම එන්නත සම්බන්ධයෙන් දේශීය වෙළඳපොළ තුළ මිල අඩු වීමක් සිදුවී තිබුණද ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් මෙම එන්නත වෙනුවෙන් නියම කරන ලද උපරිම සිල්ලර මිල වූ රු.330ට එන්නත් මිලදී ගෙන තිබුණි.

(ඔ) 2020 වර්ෂයේදී Covid - 19 වසංගත රෝගී තත්ත්වය සඳහා පිළියම් ලෙස භාවිතා කිරීමේ අපේක්ෂාවෙන් මිලදීගෙන තිබුණ 2025 මාර්තු 31 දිනට ජීව කාලය අවසන් වීමට නියමිත රු.6,698,610 ක් වටිනා Chloroquine Phosphate BP අමුද්‍රව්‍ය 600kg නිෂ්කාර්යව ගබඩා පරිශ්‍රය තුළ පැවතුණි.

(ඕ) වෛද්‍ය සැපයීම් ඉන්වොයිස් පත් නිසිපරිදි නිරවුල් කර ගැනීමට නොහැකි වීම මත 2023 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය සැපයීම් අංශයෙන් සංස්ථාවට ලැබිය යුතු රු. 2,368,675,503 ක ශේෂයට අදාලව කාල විශ්ලේෂණයක් (Age Analysis) පිළියෙල කර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ක) 2023 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල ඇතුළත් පිරිවැය රු.370,965,843ක් වූ අයිතම 535ක් සමාලෝචිත වර්ෂයේ සිදු කර තිබුණු භෞතික තොග සමීක්ෂණයට ලක්වී නොතිබුණි.

(ග) 2023 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 430 ක් වූ අතර සත්‍ය සේවක සංඛ්‍යාව 328ක් ද පුරප්පාඩු සේවක සංඛ්‍යාව 106ක්ද විය. නමුත් 2024 මාර්තු 31 දින වන විටත් නිෂ්පාදන ක්‍රියාවලියට ඉතාමත් වැදගත් අංශ වූ වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන අංශය මෙන්ම තත්ත්ව පාලන අංශය සඳහා වූ අංශ ප්‍රධාන තනතුරු 01 ක් ඇතුළුව විධායක ශ්‍රේණියේ තනතුරු 25 ක්, විධායක නොවන ශ්‍රේණියේ තනතුරු 51 ක් හා සුළු සේවක තනතුරු 30ක් වශයෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 106 ක් වී තිබුණි. මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කළ නොතිබුණි

(ජ) බද්ධ ව්‍යාපාර යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිල කමිටුව (Official Committee) විසින් නිර්දේශ කර තිබුණු පරිදි, බද්ධ ව්‍යාපාර සඳහා ගිවිසගත් ආයෝජකයාගේ නිෂ්පාදන ක්‍රියාවලියේ තත්ත්ව පාලනය, කළමණාකරණය හා තාක්ෂණික සහාය සංස්ථාව විසින් සැපයිය යුතු අතර, ඒ සඳහා එම ආයෝජකයා ව්‍යාපාරයේ කොටස් වලින් සියයට 10ක් සංස්ථාව වෙත නිකුත් කළ යුතු විය. එසේ වුවද ආයෝජකයන් 08 දෙනෙකු විසින් සංස්ථාව වෙත කොටස් නිකුත් කර නොතිබුණි.

(ට) ලෝටස් ෆාමා නව නිෂ්පාදනාගාරය තුළ රටේ මූලික ඖෂධ අවශ්‍යතාව ආවරණය කෙරෙන නිෂ්පාදන කර්මාන්ත ශාලා 05 ක් පිහිටුවීමට සැලසුම් කළද වසර 03කට පසුව ඉන් ප්‍රථම අදියර ලෙස මුඛ මාර්ගයෙන් ලබා දෙන සාමාන්‍ය ඖෂධ නිපදවීම සඳහා වන කර්මාන්ත ශාලාවක් පිහිටුවීම වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 13.1කට සමාන රු. මිලියන 4,349.2ක වටිනාකමක් ඇස්තමේන්තු කර තිබුණි. 2022 ඔක්තෝම්බර් 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව වන BP/44/22 හා ඔක්තෝම්බර් 07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත නිෂ්පාදනාගාර 03 නිපදවීමට අක්කර 20ක වපසරිය ප්‍රමාණවත් බව දක්වා තිබුණද රු. මිලියන 322.4ක් වැයකර අක්කර 65ක් මිලදී ගැනීමට හේතු පැහැදිලි නොවුණි. තවද, 2024 පෙබරවාරි 02 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටුව විසින් ව්‍යාපෘතියට අදාල සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි ශක්‍යතා අධ්‍යනයක් (Comprehensive Feasibility Study) එදිනෙන් මාස 03ක කාලයක් තුළ සිදුකළ යුතු බව දන්වා තිබුණද, විගණිත දිනය වූ 2024 මැයි 06 වන විටද ඒ සඳහා ලබා දී

තිබූ කාලය ඉකුත් වී තිබුණි. 2022 සිට 2026 දක්වා වූ පස් අවුරුදු සැලැස්මට අනුව මෙම ව්‍යාපෘතිය වසර 03කදී නිම කිරීමට බලාපොරොත්තු වුවද විගණිත දිනය වූ 2024 මැයි 15 දින වන විටද ව්‍යාපෘතිය නිම කිරීමට බලාපොරොත්තු වූ කාලයෙන් වසර 02කුත් මාස 05ක් ඉකුත් වී භෞතික ප්‍රගතිය ශූන්‍ය වී තිබුණි.

(ඩ) පොදු පරීක්ෂණ රසායනාගාරයක් සහ පුහුණු පාසලක් ස්ථාපිත කිරීමේ අරමුණින් බුලත්සිංහල ප්‍රදේශයෙහි පිහිටි සිව්මහල් ගොඩනැගිල්ලක් 2017 වර්ෂයේ මිලදීගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විටත් එය එම අරමුණු සඳහා භාවිතා කර නොතිබුණි. මේ නිසා උක්ත අරමුණු වෙනුවෙන් ලබාගත් ශ්‍රවනාගාර පුටු 30 ක්, ආලින්ද පුටු 10 ක් වසර 04 ක කාලයක සිට උපයෝජනය කර නොතිබුණු අතර මෙම භාණ්ඩ විනාශ වෙමින් පැවතුණි.

(ත) සංස්ථාවේ වෙළඳ ණයගැති වෛද්‍ය සැපයීම් (Debtor DHS) ගිණුම් තුළ ඇතුලත් 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වෛද්‍ය සැපයීම් අංශයට සපයා ඇති බද්ධ ව්‍යාපාර ඖෂධ වලට අදාල ඉන්වොයිසි සඳහා ඖෂධ මිල විචලනයන් මත (Variation of unit price) හා නියමිත කාල සීමාවට ඖෂධ නොසැපයීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස (Delivery Late Chargers) වෛද්‍ය සැපයීම් අංශය විසින් සංස්ථාවෙන් අයකරන ලද රු.884,136,286 ක වටිනාකම බද්ධ ව්‍යාපාර වලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ථ) ස්ථාවර වත්කම් හඳුනාගැනීමේදී කුමන අගයකින් යුත් වත්කමක් ස්ථාවර වත්කමක් ලෙස හඳුනාගත යුතුද යන්න පිළිබඳ ප්‍රතිපත්තියක් සංස්ථාව වෙත නොතිබුණි.

.............................................
ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# 2023 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

2.2.2

(අ) අදාල මූල්‍යමය අලාභය සම්බන්ධයෙන් එම නිලධාරින් කල ඉල්ලීමකට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් අයෙකුගේ මසකට රු. 2000.00 බැගින් වසර 5 ක් යනතෙක් අයකර ගන්නා ලෙස දන්වා ඇත. මෙහිදි ඔවුන්ගේ පලපුරුද්ද සේවා කාලය සහ මීට පෙර සිදුවු සිදු වීම් වලදි මුළු ප්‍රමාණයට මූල්‍ය වශයෙන් අය කරගෙන නොමැති වීම් ආදිය සලකා බලා ඉහත තීරණය ලබා දී ඇත. ඒ අනුව ඔවුන්ගෙන් අයකර ගැනිමට කටයුතු කරනු ලැබේ.

(ආ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන තනතුර 2017.04.19 වන දින පුරප්පාඩු විය. එබැවින් 2018.10.04 / 2019.02.24 / 2019.09.08 / 2020.09.20 දින වලදී අයදුම්පත් කැදවූ අතර 2021.12.01 සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදි. නමුත් එහිදී සුදුසු අයෙක් නොවු බැවින් තනතුර සදහා බදවා ගැනීමට නොහැකි විය. පසුව 2021.12.12 දිනද අයදුම්පත් කැදවන ලද අතර සුදුසුකම් ලැබූ අයදුම්කරුවෙකු නොවීය. එබැවින් සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ තනතුරක් වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන තනතුරේ වැඩ බැලීම සදහා අධ්‍යක්ෂ මණ්ඩලයෙහි තීරණය අනුව පහත සදහන් ලෙස නිලධාරියෙකු පත් කර ඇත.

- 2017.04.19 දින සිට 2022.06.30 දක්වා
- 2022.07.01 දින සිට 2022.09.30 දක්වා
- 2022.10.01 දින සිට 2022.12.31 දක්වා
- 2023.01.01 දින සිට 2023.06.30 දක්වා
- 2023.07.01 දින සිට 2023.12.31 දක්වා
- 2024.01.01 දින සිට 2024.06.30 දක්වා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් තනතුර සදහා 2022.01.18 දින නිලධාරියෙකු බදවා ගත් අතර එම නිලධාරියා 2022.12.01 වන දින ඉල්ලා අස් වූ බැවින් එදින සිට එම තනතුර පුරප්පාඩු විය. මෙම තනතුරද ජ්‍යෙෂ්ඨ තනතුරක් වන බැවින් වැඩ බැලීම සදහා අධ්‍යක්ෂ මණ්ඩලයෙහි තීරණය අනුව පහත සදහන් ලෙස නිලධාරියෙකු පත් කර ඇත.

- 2022.12.01 දින සිට 2023.02.28 දින දක්වා
- 2023.03.01 දින සිට 2023.08.31 දින දක්වා
- 2023.09.01 දින සිට 2024.02.29 දින දක්වා
- 2024.03.01 දින සිට 2024.08.31 දින දක්වා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි තනතුර සදහා 2022.01.18 දින නිලධාරියෙකු බදවා ගත් අතර එම නිලධාරියා 2022.10.13 වන දින ඉල්ලා අස්වූ බැවින් එදින සිට එම තනතුර පුරප්පාඩු විය. මෙම තනතුරද ජ්‍යෙෂ්ඨ තනතුරක් වන බැවින් 2022.12.01 දින සිට වැඩ බැලීම සදහා අධ්‍යක්ෂ මණ්ඩලයෙහි තීරණය අනුව පහත සදහන් ලෙස නිලධාරියෙකු පත් කර ඇත.

- 2022.12.01 දින සිට 2023.02.28 දින දක්වා
- 2023.03.01 දින සිට 2023.08.31 දින දක්වා
- 2023.09.01 දින සිට 2024.02.29 දින දක්වා
- 2024.03.01 දින සිට 2024.08.31 දින දක්වා

තවද මෙම තනතුරු සඳහා පළපුරුදු අයදුම්කරුවන්ගේ හිගය හා කඩිනමින් පුරප්පාඩු පිරවීම පිණිස HM 1-1 තනතුරු සඳහා බඳවා ගැනීමේදී සලකා බලන පළපුරුද්ද වසර 12 සිට 10 දක්වා අඩු කිරීමේ යෝජනාවක්ද 2023.06.16 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු කණ්ඩායම සමග කළ සාකච්ඡාවේදී ඉදිරිපත් කළ අතර එසේ පළපුරුද්ද අඩු කිරීමට නොහැකි බව පවසන ලදි.

තවද ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 දරණ රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් නිකුත් කළ චක්‍රලේඛය අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වට්ටෝරු,පර්යේෂණ හා සංවර්ධන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි තනතුරු සඳහා පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ඉල්ලා 2022.12.15 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කළ අතර ඒ සඳහා 2024.03.22 දිනැති ලිපිය මගින් අනුමැතිය ලැබී ඇත. දැනට අයදුම්පත් කැඳවා ඇති සාමාන්‍යාධිකාරී තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සිදු කරමින් පවතින අතර සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගත් වහාම මෙම තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම සුදුසු බවට සංස්ථාවේ කළමනාකරණ කමිටු රැස්වීමේදී තීරණය කරන ලදි.

(ඇ) අනුප්‍රාප්තික සැලැස්මක් ඉදිරියේදී සකස් කිරීමට නියමිතය.

(ඈ) නීති නිලධාරී තනතුරේ රැකියා පිරිවිතරයේ (Job Description) සඳහන් කාර්යයන්ට අමතරව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට අදාළ කටයුතු සිදු කිරීම ඇතුලත් කර නීති නිලධාරී / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස නීති නිලධාරී තනතුරු නාමය සංශෝධනය කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදි. එයට ලැබුණු 2024.05.31 දිනැති පිළිතුරු ලිපිය හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරෙහි සේවා අවශ්‍යතාවය බාහිර සේවා සපයනු ලබන ආයතනයක් මගින් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රාථමික සේවා නියුක්ති ප්‍රකාශයක් ලබා ගෙන බදු වගු අංක 07 ප්‍රකාරව ඉදිරියේදී බදු අයකිරීමට කටයුතු කරනු ලැබේ.

(ඊ) Meridian ආයතනය විසින් SPMC Lotus Pharma ව්‍යාපෘතිය සඳහා වෘත්තීය වගකීම් රක්ෂණයක් ලෙස එක්සත් ජනපද ඩොලර් 50,000.00 ක බැංකු ඇපකරයක් සහ එක්සත් ජනපද ඩොලර් 19,285.00 ක කාර්ය සාධන සුරක්ෂණයක් ලබා දී ඇති බැවින් මෙම ලෝක බැංකු ව්‍යාපෘතිය සඳහා වෙනම වෘත්තීය වගකීම් රක්ෂණයක් ලබාගෙන නොමැත.

(උ) අදාල දීමනා සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කොට සංශෝධනය කරන ලද සියලු ගෙවීම් සඳහා අනුමැතිය ඉල්ලා ඇත. එම දීමනා සඳහා අනුමැතිය හැකි ඉක්මනින් ලබා ගැනිමට කටයුතු කරනු ලැබේ.

විශේෂයෙන්ම පාපැදි ණය ලබා දීමේදි කොරොනා වසංගත කාලයේදී ආයතනයේ ප්‍රවාහන පහසුකම් වලට පැමිණිමට නොහැකි සේවකයන් වෙත ලබා දුන් අතර මෙම පාපැදි ණය නැවත පොලියක් සමඟ අයකර ගනු ලැබේ. මේ නිසා ආයතනයට ලාභයක්ද ලබා ගත හැකි වේ.

(ඌ)

(i) බද්ධ ව්‍යාපාර ඇති කර ගනු ලැබූ ආයෝජකයින්ගේ නිෂ්පාදනාගාර ඉදිකිරීමේ කටයුතු සම්බන්ධයෙන් අප නිරීක්ෂණය කරන ලබන අතර, මේ වන විට Greenthrough ආයතන විසින් ඔවුන්ගේ නිෂ්පාදනගාර ඉදිකිරීම් කටයුතු බැලීම සඳහා පැමිණෙන ලෙසට දැනුවත් කර ඇත.

(ii) එම කාර්යය සාධන සුරක්ෂණ වල වලංගු කාලය ඉක්ම වුවද, ඒවායේ සත්‍ය පිටපත් නොමැතිව නැවත එහි වටිනාකම ඔවුනට ලබාගත නොහැකි භාවය පවතී. එම නිසා එම සෑම සුරක්ෂණයක්ම නැවත ලබා දෙන ලද්දේ අදාළ අයිතමයේ අවසාන සැපයීම දිනට අවමය මසකට පසුවයි.

තවද ඉදිරියට කාර්යය සාධන සුරක්ෂණ වල වලංගුතාවයන් සැපයීම කාල සීමාව පුරාවට දීර්ඝ කර ගැනීමට අවධානය යොමු කර ඇත.

(iii) මේ වන විට 2022 වාර්ෂික වාර්ථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බැවින් 2023 වර්ෂයේ වාර්ෂික වාර්ථාවේ මෙය නිවැරදිව ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ලැබේ.

(iv) Yadan Laboratories ආයතනය හා SPMC සම්බන්ධ අනිකුත් බද්ධ ව්‍යාපාර සම්බන්ධයෙන් මිල සංශෝධනය කිරීම සඳහා මිල කමිටු රැස්වීමක් ඉල්ලා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ලේකම්තුමාගේ කාර්යාලයෙන් දුරකථන මාර්ගයෙන් සහ ලිඛිතව කීප විටකම ඉල්ලීම් කළද ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් මේ වන තෙක් ලැබී නොමැත. තව දුරටත් මේ සම්බන්ධයෙන් මිල කමිටු රැස්වීමක් ඉල්ලීම් කරමින් සිටියි.

2.2.4

(අ) Amoxicillin නිමි නිෂ්පාදනයේ ස්ථායිතාවය පරීක්ෂා කිරීම සඳහා අවම වශයෙන් Accelerated Stability testing සඳහා මාස 06ක කාලයක්ද, Real Time Stability testing සඳහා Amoxicillin නිමි නිෂ්පාදනයේ ජීව කාලය වන වසර දෙකක්ද එකී අමුද්‍රව්‍ය භාවිතා කර නිපදවූ නිමි නිෂ්පාදනයන් අදාල පාරිසරික තත්ත්ව යටතේ තැබිය යුතුය. ප්‍රගතිය සාර්ථකදැයි පරීක්ෂා කල හැකි වන්නේ ඉන් අනතුරුවය.

එතරම් කාලයක් ගතවූ පසුව සිදු කිරීමට නියමිත ප්‍රසම්පාදනයක් වෙනුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව ලබා දී තිබූ නිර්දේශය, ඒ අවධිය වනවිට නුදුරු අනාගතයේ නිර්මාණය වෙමින් තිබූ Amoxicillin අමුද්‍රව්‍ය තොග ශූන්‍ය තත්ත්වයට ප්‍රායෝගික විසඳුමක් නොවුණි.

(ආ) ප්‍රසම්පාදන අස්තිත්වය විසින් පරීක්ෂා කර තහවුරු කරන ලද පූර්ව නැව්ගත ලේඛණ සියල්ලෙහිම පූර්ව නියැදි පරීක්ෂා මගින් තහවුරු කළ කාණ්ඩ අංක නිවැරදිව දක්වා තිබුණ නමුත් සැපයුම්කරු නැව් ගත කර තිබුනේ ප්‍රසම්පාදන අස්තිත්වය විසින් පරීක්ෂා කර තහවුරු කරන ලද පූර්ව නැව්ගත ලේඛණ වල සඳහන්ව තිබූ අමුද්‍රව්‍ය කාණ්ඩ අංක 09ට පරස්පර කාණ්ඩ අංක 09ක් සහිත තොගයකි.

2.3

(අ) මූල්‍ය ප්‍රකාශන වන අදාල නිවැරදි කිරීම් කර ඇත.

(ආ) Aspirin AR Tablets 75mg - මෙම ඖෂධයේ තාක්ෂණික ප්‍රශ්න කීපයක් පවතින අතර වට්ටෝරු සංවර්ධන අංශයෙන් එම කටයුතු නිමකරන තෙක් ඖෂධ නිෂ්පාදනය සිදුකල නොහැක.

Rosuvastine 10mg - මෙම ඖෂධය blister pack ලෙස වෙළඳපොලට හඳුන්වාදීමට අවශ්‍ය ඇලුමිනියම් ඇසුරුම් පෙට්ටි වල සැලසුම (Art work) නිමකර, අනුමැතිය ලබාගෙන මිලදී ගැනීම් සිදුකර ඇත. එසේම Blister ක්‍රමයට ඇසුරුම් කිරීමට අවශ්‍ය Stability studies නිමකර අනුමැතිය ලබා ගෙන ඇත. මෙම කටයුතු සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ. 2024 වර්ෂයේදී blister pack ලෙස මෙම ඖෂධය වෙළඳපොලට නිකුත් කිරීමට සැලසුම් කර ජූනි, ජූලි මාස වලදී එම කටයුතු සිදු කරනු ඇත.

(ඇ) අළුතින් හඳුන්වා දුන් ඖෂධ අඛණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් ඇණවුම් ලැබීම අත්‍යවශ්‍ය වේ. එසේ ඇණවුම් නොලැබීම නිසා අඛණ්ඩව නිෂ්පාදනය සිදු කල නොහැකි විය. ඉදිරියේදී ඇණවුම් ලැබුණු පසු නිෂ්පාදන ධාරිතාව වැඩි කර ගත හැක.

(ඈ) නිෂ්පාදන සූත්‍රයෙහි පවතින දුර්වලතාවයන් නිවැරදි කිරීම සඳහා තවමත් පර්යේෂණ කටයුතු සිදු කරමින් පවතී. මෙම සංවර්ධන කටයුතු හැකි ඉක්මණින් නිම කොට අප සංස්ථාව තුල මෙම ඖෂධය නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ. (Clopidogrel Tablets USP 75 mg)

(ඉ) පෞද්ගලික වෙළඳපොල (බෙදාහරින්නන්) සඳහා අලෙවි කරන නිෂ්පාදන සමහර අවස්ථා වලදී මුළු පිරිවැයට වඩා අඩු මිලකට විකිණීමට සිදුවිය හැක. එනම් වෙළඳපොලේ පවතින විවිධ ඖෂධ වර්ග (Brands) සමග තරගකාරිව අලෙවි කිරීමේදී වෙළඳපොල පවතින මිල ගණන් වලට සමානව හෝ ඊට වඩා අඩු මිලකට වෙළඳපොලට සැපයීම සිදු නොකලොත් අපගේ ඖෂධ විකිණීමට නොහැකි වන අතර ඖෂධ කල් ඉකුත් වී විනාශ කිරීමට පවා සිදු විය හැක. එසේම මෙම ඖෂධ වල මිල තීරණය කරනු ලබන්නේ එක් මාසයකට අදාල පිරිවැය පත්‍රිකා පදනම් කරගෙන සහ එම මිල ගණන් මාස 6 ක පමණ කාලයක් පවත්වාගෙන යනු ලබයි. මන්ද අප ආයතනයේ ස්ථාවර පිරිවැය ක්‍රමයක් නොමැති නිසා. මෙහිදී අපගේ පිරිවැය පත්‍රිකා අවුරුද්ද පුරා වෙනස් වන තත්වයක් පවති. එනම් අමුද්‍රව්‍ය ආනයනය කරන සෑම මසක් පාසාම පිරිවැය වෙනස් අගයක් ගනී. නමුත් විගණනය මගින් සලකා පදනම් කරගෙන ඇත්තේ එක් මාසයක පිරිවැය පමණි. එසේම වෙළඳපොල සමග තරගකාරිව අලෙවි කිරීමේදී අපගේ බොහොමයක් ඖෂධ ලාභ සහිතව අලෙවි කිරීමට උත්සහ කරනු ලබන අතර ඇමුණුමේ දක්වා ඇති ඖෂධ වර්ග අතරින් බොහොමයක් අවම වශයෙන් විචල්‍ය පිරිවැය හෝ ආවරණය වන පරිදි තැනීමේ අමුද්‍රව්‍ය හා ශ්‍රම පිරිවැය වත් ආවරණය වන පරිදි අලෙවි කිරීමට උත්සහ කරනු ලබයි. එසේ නොවුනහොත් අපගේ වෙළඳපොල අහිමි වීම සේම අපගේ ඖෂධ කල් ඉකුත් වී විනාශ කර ලාභයෙන් කපා හැරීමට සිදුවිය හැක. ඇමුණුමේ දක්වා ඇති අදාල ඖෂධ වර්ග ඉතා ඉක්මනින් මිල ඉහල නංවා වෙළඳපොලට ඉදිරිපත් නිරීමට කටයුතු කරනු ලැබේ.

(ඊ) නව සිසිලන පද්ධතියක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය

2019 වසරේ බලශක්ති විගණනය සිදු කරන ලද ආයතනය වන M/s. Sri Lanka Energy Managers Association ආයතනය විසින්ම සිදු කිරීමට අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කල අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව සඳහා ලබාදුන් 2021-04-20 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුව, මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශන සමාගමක් පත් කරගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන අනුමැතීන් ලබා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ ප්‍රමාදයන් පහත දැක්වේ.

- අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව උපදේශන ආයතනය ලෙස ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය පත්කර ගැනීමට 2021-05-16 දින සැලසුම් සහ ප්‍රසම්පාදන අංශය වෙත සාමාන්‍යාධිකාරීතුමිය විසින් යොමු කරන ලදී.
- ඒ අනුව ප්‍රසම්පාදන අංශය එම ආයතනයෙන් යෝජනා කැඳවීම (requesting proposals) කරන ලද අතර, ඔවුන් මේ සඳහා ගාස්තු ලෙස රු. 3,492,750.00 ක් සඳහන් කරමින් ඔවුන්ගේ යෝජනාව 2021-06-16 දින ප්‍රසම්පාදන අංශය වෙත ලබා දී ඇත.
- මෙම යෝජනාව සඳහා අනුමැතිය ලබාගැනීමට යාමේදී, 2021-06-29 දිනැති තාක්ෂණික ඇගයීමෙ කමිටු වාර්තාව මගින් තවදුරටත් ඇගයීම සඳහා කමිටුවක් පත්කරන ලෙස නිර්දේශ කරමින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මන්ඩලය වෙත යොමු කරන ලදී.

- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මන්ඩලය මේ සඳහා පස් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් 2021-07-07 දින පත්කරන ලදී.

- එම කමිටුව විසින් ඔවුන්ගේ වාර්තාව 2021-09-15 දින ලබා දෙමින් සඳහන් කර ඇත්තේ, මෙම කාර්යය සඳහා අත්දැකීම් සහ ප්‍රවීණත්වය තාක්ෂණික ඇගයීමෙ කමිටුව වෙත ඇති බවත්, අධ්‍යක්ෂ මණ්ඩලය උපදේශන ආයතනය පත්කිරීමට ලබාදී ඇති අනුමැතිය අනුව කටයුතු කරන ලෙසත් ය.

- තාක්ෂණික ඇගයීමේ කමිටුව 2022-01-20 දින උපදේශන ආයතනය ලෙස ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය රු. 3,492,750.00 ක ගාස්තුවක් යටතේ පත්කිරීමට, ප්‍රසම්පාදන කමිටුව වෙත ඔවුන්ගේ නිර්දේශ යොමු කරන ලදී.

- මේ සඳහා ප්‍රසම්පාදන කමිටුව 2022-01-28 දින අනුමැතිය ලබාදෙන ලද අතර, ඒ අනුව උපදේශන ආයතනය පත්කර ගැනීමේ ටෙන්ඩරය 2022-02-11 දින ප්‍රදානය කර ඇත.

මේ සම්බන්ධව MSU/A/SPMC/I/2021/AQ 11 විගණන විමසුම සඳහා සවිස්තරව කරුණු ඉදිරිපත් කර ඇත.

ඒ අනුව තෝරා ගන්න ලද උපදේශක සමාගම වන M/S Sri Lanka Energy Managers Association සහ සංස්ථාවේ තාක්ෂණික කමිටුව සාකච්ඡා පවත්වා පද්ධතිය සැලසුම් (design) කිරීමේ කටයුතු පහත දක්වා ඇති අකාරයට අවසන් කරන ලදී.

| දිනය | විස්තරය |
|---|---|
| 2022-03-16 | උපදේශන සමාගම අදාල කාර්‍යය සම්බන්ද ඔවුන්ගේ පැහදිලිකිරීම ඉදිරිපත් කරන ලදී |
| 2022-05-18 | මෙහිදී 2019 වර්ෂයේ පැවති සිසිලන අවශ්‍යතාවය (cooling load) 385 RT වුවත් 2022 වසර වනවිට 499 RT දක්වා වැඩිවී ඇති බව අනාවරණය කරනු ලැබුනි. ඒ අනුව අදාල සැලසුම් සකස් කිරීම සිදු කෙරේ |
| 2022-09-02 | සැලසුම් කිරීම (designing) සහ අදාල drawings, Tender Document, BOQ සමාලෝචනය කරන ලදී |
| 2022-10-11 | TEC සාමාජිකයින් ලෙස අදාල විෂයයන්ට සම්බන්ද ඉංජිනේරුවන් TEC සාමාජිකයින් ලෙස පත් කිරීමට තීරණය කරන ලදී. |
| 2022-11-04 | ව්‍යාපෘතිය සඳහා කාලරාමුව (tentative project time frame) සහ ලංසු ලේඛන පිලියල කිරිම අවසන් කිරීම |

මේ සම්බන්ධව MSU/A/SPMC/I/2022/AQ 02 විගණන විමසුම සඳහා සවිස්තරව කරුණු ඉදිරිපත් කර ඇත.

ඉහත ආකාරයට උපදේශක සමාගම විසින් කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන පත්‍රිකා සහ පිරිවිතර (Bid Document and Specifications) සකස් කොට අවසන් කල අතර මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු සඳහා පහත දැක්වෙන කාර්යයන් සිදු කරන ලදී.

| දිනය | විස්තරය |
|---|---|
| 2022-10-13 | අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලයේ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) සඳහා යාන්ත්‍රික සහ විදුලි, සිවිල් ඉංජිනේරුවන් කමිටු සාමාජිකයන් ලෙස පත්කරන ලෙස ඉදිරිපත් කරන ලද ලිපිය |
| 2022-11-18 | ලංසු ලේඛන නැවත සමාලෝචනය කර සංශෝධනය කිරීම |
| 2022-11-28 | අමාත්‍යාංශය විසින් තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් පත්කර එවන ලද ලිපිය |
| 2022-12-12 | තාක්ෂණික ඇගයීම් කමිටුව 14-12-2022 දින පැවත්වීම දන්වන ලද ලිපිය |
| 2022-12-19 | තාක්ෂණික ඇගයීම් කමිටුව 22-12-2022 දින පැවත්වීම දන්වන ලද ලිපිය |
| 2022-12-23 | ලංසු ලේඛන සහ පුවත්පත් දැන්වීම සම්බන්ධව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන්ගේ අදහස් සහ නිරීක්ෂණ (comments and observations) වෙන වෙනම ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී. |
| 2022-12-28 | මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයාගේ අදහස් සහ නිරීක්ෂණ ලබා දෙන ලදී. |
| 2023-01-04 | අයවැය ප්‍රතිපාදන සඳහා මුදල් අමාත්‍යාංශයේ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලදී. |
| 2023-01-18 | විදුලි ඉංජිනේරුවරයාගේ අදහස් සහ නිරීක්ෂණ ලබා දෙන ලදී. |
| 2023-01-24 | යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ අදහස් සහ නිරීක්ෂණ ලබා දෙන ලදී. |
| 2023-01-24 | ඉහත තාක්ෂණ කමිටු සාමාජිකයන්ගේ අදහස් සහ නිරීක්ෂණ උපදේශන සමාගම වෙත ඉදිරිපත් කරන ලදී. |

තාක්ෂණ කමිටු සාමාජිකයන්ගේ අදහස් සහ නිරීක්ෂණ උපදේශන සමාගම වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පහත දැක්වෙන කාර්යයන් සිදු කරන ලදී.

| දිනය | විස්තරය |
|---|---|
| 2024-03-13 | උපදේශන සමාගම විසින් සංස්කරණය කරන ලද ලංසු ලේඛන නැවත අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීමේ කමිටුවට ඉදිරිපත් කරන ලද අතර එහිදී දක්වන අදහස් අනුව උපදේශන සමාගම විසින් සංශෝධිත ලංසු ලේඛන ලබා දෙන ලදී. |
| 2023-03-14 | එම ලංසු ලේඛන අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීමේ කමිටු සමාජිකයන් වෙත ඊ-මේල් මගින් යොමු කරන ලදී. |
| 2023-03-17 | 2023 වසර සඳහා අයවැය ප්‍රතිපාදන අනුමැතිය (letter of approval for the SPMC capital budget utilize 2023) සමග 2023-03-17 දින ලිපිය මගින් අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීමේ කමිටු සභාපති වෙත යොමු කරන ලදී. |
| 2023-03-28 | අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීමේ කමිටුව 2023-03-29 දින රැස්වූ අතර එහිදී එම කමිටුවේ නිලධාරීන් විසින් ටෙන්ඩර් ලේඛනයේ තාක්ෂණික සහ සිවිල් කොටස් තවදුරටත් සාකච්ඡා කරන ලදී. |
| 2023-05-03 | අයවැය ප්‍රතිපාදන සඳහා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දෙන ලදී. |
| 2023-05-04 | ලංසු ලේඛනයේ තාක්ෂණික සහ සිවිල් කොටස් සංශෝධන, උපදේශන සමාගමෙ විසින් සංස්කරණය කරන ලද අතර එම ලංසු ලේඛන නැවත අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීමේ කමිටුවට ඉදිරිපත් කරන ලදී |

| | |
|---|---|
| 2023-05-15 | අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීමේ කමිටුව 2023-05-15 දින රැස්වූ අතර එහිදී පුවත්පත් දැන්වීම් මගින් ලංසු කැඳවීම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය සඳහා ලංසු ලේඛන නිර්දේශ කරන ලදී |
| 28-07-2023 | උපදේශන සමාගම විසින් මෙම ප්‍රසම්පාදනය ආරම්භ කරන ලද 2019 වසරට සාපේක්ෂව ඉහල ගොස් ඇති සිසිලන ධාරිතාවය සහ රටෙහි පැවති මූල්‍යමය අර්බුදකාරී තත්ත්වයෙන් පසුව ඇතිවූ විදේශ විනිමය අනුපාත අනුව ඉංජිනේරු ඇස්තමේන්තුව රු. මිලියන 699 ක් ලෙස සංශෝධනය කර ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව 2023 වසර සඳහා අයවැය ප්‍රතිපාදන සංශෝධනය සිදු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී |
| 02-08-2023 | සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මුදල් අමාත්‍යාංශය වෙත අයවැය ප්‍රතිපාදන සංශෝධනය අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී |
| 21-08-2023 | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව "ඒ" විසින් මෙම ප්‍රසම්පාදනය රු. මිලියන 500 ඉක්මවන බැවින් ස්ථාවර කැබිනට් ප්‍රසම්පාදන කමිටුව SCAPC (Standing Cabinet Appointed Procurement Committee) වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුව බව නිර්දේශ කරන ලදී |
| 05-09-2023 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර කැබිනට් ප්‍රසම්පාදන කමිටුව සඳහා තාක්ෂණික ඇගයීමේ කමිටුව පත් කර එවන ලදී |
| 11-09-2023 | සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් තාක්ෂණික ඇගයීමේ කමිටුව වෙත දැනුම් දෙනු ලැබුවේ 2023-09-25 දිනට පෙර ලංසු ලේඛන, ස්ථාවර කැබිනට් ප්‍රසම්පාදන කමිටුව SCAPC වෙත ඉදිරිපත් කිරීම සඳහා ලබා දිය යුතු බවයි |
| 21-09-2023 | තාක්ෂණික ඇගයීමේ කමිටුවේ සිවිල් ඉංජිනේරු එස්. පී සෙනවිරත්න මහත්මිය වෙනුවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ සිවිල් ඉංජිනේරු කේ.ඩී.එන්.ඩී. කුරුප්පු මහතා පත් කරන ලදී. |
| 23-10-2023 | තාක්ෂණික ඇගයීමේ කමිටුව 2023-10-23 දින රැස්වූ අතර එහිදි නැවතත් ලංසු ලේඛන සංශෝදනය සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී. |
| 31-10-2023 | උපදේශන සමාගම විසින් නිවැරදි කරන ලද ලංසු ලේඛන තාක්ෂණික ඇගයීමේ කමිටු සාමජිකයන් වෙත ලබා දීම සඳහා තාක්ෂණික ඇගයීමේ කමිටු සභාපති වෙත ඊ මේල් කරන ලදී. |
| 24-11-2023 | මෙතෙක් අනුගමනය කරන ලද "ප්‍රධාන කොන්ත්‍රාත්තු" CIDA ප්‍රකාශනය අංක CIDA/SBD/02, 2009 දෙවන සංස්කරණය වෙනුවට "ප්‍රධාන කොන්ත්‍රාත්තු" CIDA ප්‍රකාශනය අංක CIDA/SBD/102, 2023 මාර්තු තෙවන සංස්කරණය අනුගමනය කිරීමට උපදෙස් ලැබුන අතර ඒ අනුව උපදේශන සමාගම විසින් සංශෝධනය කරන ලද ලංසු ලේඛන ලබාදෙන ලදී. |
| 2023-11-27 | සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් - ප්‍රසම්පාදන විසින් තාක්ෂණික කමිටුවේ සභාපති වෙත, කෙටුම්පත් කරන ලද ලංසු ලේඛන ලබාදෙන මෙන් කරන ලද සිහි කැඳවීම |
| 2023-12-22 | තාක්ෂණික කමිටුවේ සභාපති විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් - ප්‍රසම්පාදන වෙත, තාක්ෂණික කමිටුවේ වාර්තාව සහ කෙටුම්පත් කරන ලද ලංසු ලේඛන ඉදිරිපත් කරන ලදී |

| | |
|---|---|
| 2024-02-05 | 2024-02-02 දින රැස්වූ ස්ථාවර කැබිනට් ප්‍රසම්පාදන කමිටුව SCAPC විසින් ලංසු ලේඛන අනුමත කරන ලද බවත් ඒ අනුව පුවත්පත් දැන්වීම පල කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් - ප්‍රසම්පාදන විසින් දැනුම් දෙන ලදී. |

ඉහත කරුණු අනුව පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම අපගේ සීමාවෙන් ඔබ්බට ගිය ක්‍රියාවලියක් බවත්, මෙම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කරමින් වඩාත් සුදුසුම කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම නිවැරදිව සිදුකරමින්, සංස්ථාවේ බලශක්ති පරිභෝජනයේ පිරිමැසුම්දායී බව හැකි ඉක්මනින් ලඟා කර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි.

මෙහිදී NMRA විසින් සිදු කල නිරීක්ෂණ වාර්තාවේ, පවතින සිසිලන පද්ධතියේ දුර්වලතාවයන් පෙන්වා දී ඇතැයි දක්වා තිබෙන කාරණය සම්පූර්ණයෙන්ම සාවද්‍ය නිරීක්ෂණයකි. එනම් ඔවුන් සඳහන් කර ඇත්තේ වායු මෙහෙයුම් ඒකක (Air Handling Unit – AHU) පිරිසිදු කිරීමේ හා ආදේශ කිරීමේ (cleaning & replace) ක්‍රියාවලිය සඳහා සම්මත මෙහෙයුම් පටිපාටියක් (Standard Operating Procedure) ඇති බවත් (SPMC/SOP/ENG/005) එයට අනුව HEPA filters හි අඛණ්ඩතාවය පරීක්ෂා කිරීම කලයුතු බවත් (HEPA filter integrity should be checked) නමුත් පවතින පද්ධතියේ එවැන්නක් නොමැති බවත්ය (But it is not in place due to central HEPA filters of old HVAC system).

මෙහිදී අප විසින් සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) සඳහා HEPA filter integrity should be checked ලෙස දක්වා ඇත්තේ ඉදිරියේදී ස්ථාපනය කරනු ලබන පද්ධතිය සඳහාද ගැලපෙන අයුරින් මෙම පිරිසිදු කිරීමේ හා ආදේශ කිරීමේ (cleaning & replace) ක්‍රියාවලිය සිදු කලයුතු බැවිනි. NMRA විසින් එය කඩිනමින් නිවැරදි කලයුතු බවට නිර්දේශ ලබා දී නැත. එනම් මෙම නව සිසිලන පද්ධතිය ස්ථාපනය කලත් දැනට පවතින වායු මෙහෙයුම් ඒකක (Air Handling Unit – AHU) වෙනස් කිරීමක් සිදු කලයුතුව නැත. දැනට තිබෙන වායු මෙහෙයුම් ඒකක තවත් වසර කීපයක් භාවිතා කල හැක.

(උ) කඳවල නිමි ඖෂධ තොග ගබඩා කිරීමේ දෙමහල් ගබඩා ගොඩනැගිල්ල

2017 වර්ෂයේ නිෂ්පාදනය පුළුල් කිරීමේ JICA ව්‍යාපෘතියෙන් පසුව අපගේ නිෂ්පාදන ධාරිතාවය වැඩිකරන ලද අතර ඒ අනුව ගබඩා අවශ්‍යතාවය සඳහා මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කරන ලදී. මෙහෙදී සැලසුම් කිරීම සහ ගොඩනැගීම (design and build) යටතේ තෝරාගත් කොන්ත්‍රාත්කරු වෙත ඉදිකිරීම ප්‍රදානය කර ඇත. මෙහිදි වැඩ විෂය පථය (scope of work) සහ පාංශු විමර්ශන වාර්තා (soil investigation report) ලබාදුන් අතර ඒ අනුව ඔවුන් විසින් සැලසුම් සකස් කර ඉදිකිරීම ආරම්භ කරන ලදි.

මේ අතර 2018 සහ 2019 වසර වල අප සංස්ථාවේ නිෂ්පාදන වල ප්‍රධානතම ගැණුම්කරුවන රජයේ වෛද්‍ය සැපයුම් අංශය (Medical Supplies Division) වෙතින් අයවීමට තිබූ හිඟමුදල් (2018 outstanding balance -Rs 445.80 million and 2019 outstanding balance -Rs 1482.40 million) මුදල් අමාත්‍යාංශය විසින් ලබා දීමට ප්‍රමාද වීම හේතුවෙන් අප ආයතනය මූල්‍යමය අපහසුතාවයකට ලක්වී තිබුනි. පහත සඳහන් ගෙවීම් සිදුකිරීමට ප්‍රමාද වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය කරගෙන යාමේදී ඉදිකිරීම් ප්‍රමාද වීම් සිදුවිය .

- කොන්ත්‍රාත් සමාගම වන KSJ Construction Pvt Ltd වෙත ප්‍රථම ගෙවීම වන කොන්ත්‍රාත් වටිනාකමින් 20% ක අත්තිකාරම් මුදල ගෙවීමට ගිණුම් අංශය වෙත 2018-05-18 දින ඉදිරිපත් කරන ලද නමුත් ඉහත හේතුව නිසා එම ගෙවීම සිදුකර අවසන් කර තිබුනේ මාස 7කට පසුව එනම් 2018-12-07 දින වේ.

- පලමු බිල් පත (Interim Payment No 1) 2019 ජනවාරි මස ඉදිරිපත් කරන ලද නමුත් ගෙවීම මාස 6කින් පමණ ප්‍රමාද කර තිබුනි.

මේ අතර 2019 වසරේ පත්වූ රජයේ ප්‍රතිපත්ති තීරණයන් අනුව, ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යවරයාගේ සංකල්පයක් වන "අලුත් රටට අලුත් බෙහෙත්" සංකල්පය යටතේ අප සංස්ථාව විසින් නව නිෂ්පාදන රටට හඳුන්වා දීමට කටයුතු කරන ලදී.

මෙම අවශ්‍යතාවය සපුරාගැනීමට නිෂ්පාදානාගාරය පුළුල් කිරීමට සිදුවේ. මේ සඳහා සුදුසුම ස්ථානය ලෙස කළමණාකාරීත්වය විසින් හඳුනාගනු ලැබුවේ දැනට අලෙවි අංශය පවත්වාගෙන යන E කලාප ගොඩනැගිල්ලේ බිම් මහලයි. නො 105 ඉඩමේ ඉදිකරමින් පවතින දෙමහල් ගබඩා ගොඩනැගිල්ල වැඩ නිමවීමෙන් පසු අලෙවි අංශය එම ගොඩනැගිල්ලේ ස්ථාපනය කිරීමටත් එම නිසා හිස්වන ඉඩකඩ නව නිෂ්පාදනාගාරයක් ලෙස දියුණු කිරීමටත් අප විසින් තීරණය කරන ලදී. මෙහිදී කලින් සැලසුම් කල ගබඩා ගොඩනැගිල්ලේ මුල් සැලැස්ම වෙනස් කර නව අවශ්‍යතාවයන්ට අනුව ගොඩනැගිල්ල සැලසුම් සකස් කිරීමටත්, වැඩිවන නිෂ්පාදන ධාරිතාවයට අනුව ගබඩා ධාරිතාවය සලකා බැලීමටත් තීරණය කරන ලදී.

මේ සඳහා රජයේ ඉදිකිරීම් සම්බන්ධ ආයතනයක් වන ඉංජිනේරුමය කාර්යයන් පිලිබඳ මධ්‍යම උපදේශක කාර්‍යාංශය (Central Engineering Consultancy Bureau - CECB) සහය ලබාගන්න ලදී. ඒ අනුව ඔවුන් මෙම ගොඩනැගිල්ලේ වානේ ව්‍යුහය විශ්ලේශනය (steel structure design analysis) කිරීමට කටයුතු කරන ලදී. එහිදී ඔවුන්ගේ නිර්දේශයන්ට අමතරව පාදමේ නැවත සලකා බැලීමක් (verification) සිදු කිරීමට නිර්දේශ කරන ලදී. ඒ අනුව පාංශු විමර්ශනය (soil investigation) සිදු කරන ලද M/S Soil Matter Pvt Ltd ආයතනයෙන් නැවත වැඩිදුර වාර්තාවක් ලබා ගැනීමක් සිදු කරන ලදී. ඒ අනුව නව සැලසුමට අනුකූලව, ටෙන්ඩරය ප්‍රදානය කල පිරිවැය තුලම (BOQ Rates) ඉදිකිරීම් සමාගම විසින් ව්‍යාපෘතිය කරගෙන යාමට එකඟවිය.

එමෙන්ම කොවිඩ් වසංගත තත්ත්වය නිසා සිදුවූ නොයෙකුත් බාධාවන් හේතුවෙන් මෙම ඉදිකිරීමේ වැඩ තාවකාලිකව නතර කිරීමට සිදුවිය.

තවද, 2022 වර්ෂයේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදුවූ විශාල මිළගණන් වැඩිවීම හේතුවෙන් කොන්ත්‍රාත් සමාගම සවිස්තර විශ්ලේෂණ වාර්තාවක් (Detail Analysis for recommend the compensation for the project overruns due to prevailing market condition of Sri Lanka) ඉදිරිපත් කල අතර ඉන් අනතුරුව 2021-09-13 දින ඉතිරි වැඩ (balance work) කරගෙන යාම සඳහා සංශෝධිත BOQ ඉදිරිපත් කරන ලදී.

මෙහිදී සංශෝධිත BOQ අනුව ඉතිරි වැඩ කරගෙන යාම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කල අතර එහිදී අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව “A” පහත නිර්දේශ ඉදිරිපත් කර ඇත.

1. සංස්ථාවේ අවශ්‍යතා හඳුනාගෙන ඉදිරිකිරීමේ උපදේශක ආයතනය (M/S CECB) වෙත සංශෝධිත BOQ ඉදිරිපත් කර සමාලෝචන ඇස්තමේන්තුව ලබා ගැනීමට. (To obtain consultant's review estimate with the clients requirements)

2. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ/මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස. (Submit for the approval of Department of National Planning/Ministry of finance after obtaining the Board of Directors approval)

ඒ අනුව අපගේ අවශ්‍යතාවය අනුව උපදේශක ආයතනය සැලසුම් සකස් කරන ලද අතර 2023 වසර සඳහා අයවැය ප්‍රතිපාදන සංශෝධනය සිදු කිරීම සඳහා 2023-07-28 සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

මෙම ප්‍රසම්පාදනය රු. මිලියන 500 ඉක්මවන බැවින් ස්ථාවර කැබිනට් ප්‍රසම්පාදන කමිටුව SCAPC (Standing Cabinet Appointed Procurement Committee) වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු බැවින් ඒ අනුව උපදේශන සමාගම වන M/s CECB විසින් සකස් කරන ලද ලංසු පත්‍රිකා අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීමේ කමිටුව විසින් සංශෝධන නිර්දේශ කර 2023-11-20 ඉදිරිපත් කරන ලදී.

අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීමේ කමිටුව විසින් දක්වන ලද සංශෝධන උපදේශන ආයතනය නිවැරදි කිරීමෙන් අනතුරුව 02-02-2024 දින පවත්වන ලද ස්ථාවර කැබිනට් ප්‍රසම්පාදන කමිටුව SCAPC වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව ලංසු පත්‍රිකා අනුමත කර පුවත් පත් දැන්වීම් පලකරන ලෙස අතිරේක ලේකම්-ප්‍රසම්පාදන විසින් සංස්ථාවේ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව වෙත දැනුම් දෙන ලදී .

ඉහත කරුණු අනුව ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනය නිසිපරිදි සිදු නොකිරීම, එම භූමියේ පසෙහි දුර්වලතා සහ නිර්මාණ කරනයේ වෙනස්කිරීම් හේතුවෙන් වැඩ අතරමග නතරකර ඇති බව දක්වා තිබීම සාවද්‍ය නිරීක්ෂණයක් වන අතර සංස්ථාවේ අවශ්‍යතාවය පරිදි සැලසුම් සකස් කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා ඉදිකිරීම සිදු කිරීමට අප විසින් කටයුතු කර ඇත.

මෙම ඉදිකිරීම අවසන් කර භාවිතයට ගන්නා තෙක් අපගේ නිෂ්පාදන සහ හවුල් සමාගම් (joint venture companies) විසින් නිෂ්පාදනය කරනු ලබන නිමි ඖෂධ ගබඩා කර ගැනීම සඳහා පිටතින් ගබඩා කුලියට ගැනීම අනිවාර්යයෙන් සිදු කල යුතු මෙන්ම, අපගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල යාම නිසා ගබඩා සඳහා ගෙවිය යුතු මිළ ගණන්ද ඉහල ගොස් තිබේ.

(ඌ) වෛද්‍ය සැපයුම් අංශය විසින් SPMC බද්ධ ව්‍යාපාරයක් වන Yaden Laboratories (Pvt) Ltd මගින් නිෂ්පාදනය කරනු ලබන Tranexamic Acid injection 500mg/5ml සඳහා මිලදී ගැනීමේ ඇණවුමක් 2022/11 /22 දිනැතිව අප ආයතනය වෙත ලබාදී තිබුණ අතර, එහි සඳහන් වන මුළු ඇණවුමම, එනම් ඇම්පියුල් 300,000ම ජනවාරි 01වන දින සපයන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව, Yaden Laboratories (Pvt) Ltd ආයතනය විසින් මෙම අයිතමයෙන් ඒකක 70,000ක් 2023 ජනවාරි 27 වන දින සපයන ලද අතර, එම තොගය ඔවුන් විසින් නිෂ්පාදනය කර ඇත්තේ 2022 දෙසැම්බර් මාසයේදීය.

තවදුරටත් මෙම නිෂ්පාදිත අයිතමය 2023 ජනවාරි පෙබරවාරි සහ මාර්තු යන මාසයන්වල නිෂ්පාදනය කර ඇති අතර මුළු ඇණවුමෙන් ඒකක 30540ක ප්‍රමාණය හැරෙන්නට ඉතිරි ප්‍රමාණයන් ජනවාරි සිට මාර්තු දක්වා කාල පරාසයන් තුළ සපයා අවසන් කර ඇත. තවද ඉහත සඳහන් ඒකක 30540ක ප්‍රමාණය සැපයීමට සැලසුම්කර තිබූ පරිදි සැපයීමට නොහැකි බව මෙම බද්ධ ව්‍යාපාර ආයතනය අප වෙත දැනුම් දීමක් 2023 මාර්තු මාසයේදී සිදුකර ඇත.

එබැවින් Yaden Laboratories ආයතනය විසින් ඉතිරි ඇණවුම් ප්‍රමාණයට අදාල ඉන්වොයිස් පත 2023. 07.12 දින අප වෙත යොමු කරමින් අදාල තොගය වෛද්‍ය සැපයම් අංශයට සැපයුම් කිරීමට කටයුතු කර ඇත.

කෙසේ නමුත් අප විසින් දැනට ඉන්වොයිස් කිරීම සඳහා භාවිතා කරන ERP System එක තුලින් එසේ ප්‍රමාද වී ලැබෙන සැපයුම් හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් එම පහසුකම් ලබාගැනීම සඳහා මෙම පරිගණක දත්ත පද්ධතිය යාවත්කාලීන කරදෙන මෙන් සංස්ථාවේ තොරතුරු තාක්ෂණ අංශය හරහා දැනට අප ආයතනයේ පරිගණක දත්ත පද්ධතිය මෙහෙයවන EWIS සමාගම වෙත ඉල්ලීම් කර ඇත. එබැවින් ඉදිරියේදී මෙම තොරතුරු පද්ධතිය ඉහත තොරතුරු ලබාගැනීමට අවශ්‍ය පරිදි පහසුකම් ලබාදේ යයි අපේක්ෂා කරන බැවින් ඉදිරියේදී ඉහත ආකාරයේ සැපයුම් විචලනයන් ඇතිවුවහොත් එවැනි අවස්ථාවන් මිල කෙරෙහි කවර ආකාරයෙන් බලපාන්නේ දැයි යන්න හඳුනා ගැනීමට පහසු වනු ඇතැයි අපේක්ෂා කරමු.

(එ) 2023 වර්ෂයේදී සමඟ බද්ද ව්‍යාපාර ඇති කර ගත් ආයෝජකයින් පහත සඳහන් අයෝජකයින් 05 විසින් වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සැපයීම සිදු කොට ඇත.

1. Diyatha Pharmaceuticals & Healthcare (Pvt) Ltd.
2. Glosante (Pvt) Ltd.
3. Celogen Lanka (Pvt) Ltd.
4. Sands Active (Pvt) Ltd.
5. Yaden Laboratories (Pvt) Ltd.

(ඒ) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මගින් මෙම සියලූම බද්ධ ව්‍යාපාර සපයන ඖෂධ වල මිල ගණන් නියමිත පරිදි මාස 6 කින් සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබුවත් පසුගිය කාලසීමාව තුල සෞඛ්‍ය ලේකම්තුමා මගින් මිල කමිටු රැස්වීමක් ඉල්ලීම් කලද මේ වන තෙක් එම අවස්ථාව නොලැබුනු අතර ඉදිරියේදි මිල කමිටු රැස්වීමක් ලබා ගැනීමෙන් පසු සියලූම අයිතමයන්ගේ මිල සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඔ) 2020 වසරේ Covid-19 වසංගතය ඉතා උග්‍රව පැතිර ගිය අතර ලොව පුරා Chloroquine Phosphate BP 250mg යන ඖෂධය Covid-19 වසංගතය සඳහා භාවිතා කිරීමට නිර්දේශ විය. ඒ වන විට අප සතුව පැවති Chloroquine Phosphate අමුද්‍රව්‍ය තොගය භාවිත කරමින් ඉතා කෙටි කාලයක් ඇතුලත Chloroquine Phosphate BP 250mg පෙති මිලියන පහක ප්‍රමාණයක් නිෂ්පාදනය කර රටේ අවශ්‍යතාවය සඳහා භාවිතා කිරීමට වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබා දීමට අපට හැකි විය.

Covid-19 වසංගතය සඳහා Chloroquine Phosphate ඖෂධය භාවිතා කිරීමට නිර්දේශ කිරීමත් සමගම මෙම Chloroquine Phosphate අමුද්‍රව්‍ය සඳහා ලෝක වෙළඳපලේ පැවති ඉල්ලුම ඉතා ඉහළ ගිය අතර ලංකා වාසී ජනතාව වෙනුවෙන් මෙම ඖෂධය ලබා දීමේ වගකීම අප සංස්ථාව සතු බව විශ්වාස කරමින් වෛද්‍ය සැපයුම් අංශයේ උපදෙස් පරිදි, 600kg ක ප්‍රමාණයක් ඉක්මණින් ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කළෙමු. මෙලෙස ප්‍රසම්පාදනය කරණ ලද්දේ, එවැනි වසංගත අවස්තාවක රටේ ජනතාවට අප විසින් කළ යුතු මෙහෙය නොපිරිහෙලා ඉටු කිරීමේ උදාර අරමුණෙනි.

නමුත් බලාපොරොත්තු වූ ආකාරයට මෙම ඖෂධය භාවිතා නොවීම නිසා මෙම තොගය භාවිතා කළ නොහැකි විය.

මෙම තොගය නැවත ප්‍රති අපනයනය කිරීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලන ලෙස IPCA Laboratories - India (19/01/2021, 27/02/2023) ආයතනය වෙත දන්වා ඇත. එමෙන්ම මෙම තොගය හෝ එහි නිෂ්පාදන United Nations Children Fund - Thailand (29/06/2020) වෙත ලබා දීමේ ඇති හැකියාව සොයා බලන ලෙසද ඉල්ලීම් කර ඇත.

එමෙන්ම මෙම නිෂ්පාදිත ඖෂධ හෝ අමුද්‍රව්‍ය තොගය දේශීය හෝ විදේශීය පාර්ශවයකට අවශ්‍ය නම් එය සම්බන්ධීකරණය කර දෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යංශයේ අතිරේක ලේකම් (සෞඛ්‍ය සේවා) වෙත ඉල්ලීම් කර ඇති අතර ෆිජි දූපත් රටක් සඳහා ප්‍රධානයක් ලෙස ලබාදීමේ ඇති හැකියාව සොයාබලමින් පවතින බව අප හට දන්වා ඇත. දැනට එම සම්බන්ධීකරණ කටයුතු සිදුවෙමින් පවතී.

(ඕ) නිරවුල් නොකල බිල්පත් සම්බන්ධයෙන් කටයුතු කරන ලෙසට ලිඛිත ඉල්ලීම් සැලකිය යුතු ප්‍රමාණයක් 2023 වසර පුරා වෛද්‍ය සැපයුම් අංශයට කර ඇති අතර එම කර ඇති ලිඛිත ඉල්ලීම් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට හැකි අතර ඖෂධ නිෂ්පාදන සංස්ථාව සතු මේ සම්බන්ධ තොරතුරු නිරන්තරයෙන් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අදාල නිළධාරින් දැනුවත් කර ඇත. නමුත් ඒ සඳහා පැහැදිලි විසඳුමක් ලබා දී නොමැත.

(ක) මූල්‍ය ප්‍රකාශන වන අදාල නිවැරදි කිරීම් කර ඇත.

(ග) ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 දරණ රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් නිකුත් කළ චක්‍රලේඛය අනුව බඳවා ගැනීම් සීමා කර තිබූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයෙන් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් සියළු බඳවා ගැනීම් වලට අනුමැතිය ලබා ගැනීමට සිදු වුණි. තවද අනුමැතිය ලැබුණු නව තනතුරු වල බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වූ තනතුරු සඳහා බඳවා ගැනීමට ක්‍රියා කරමින් සිටී.

(ජ) ඉතිරි බද්ධ ව්‍යාපාරිකයන් තව දුරටත් ඔවුන්ගේ කර්මාන්තශාලා සම්පූර්ණ කරමින් පවතින අතර ඒ හේතුවෙන් ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කර නොමැති වීම මත අදාල කොටස් නිකුතුවක් කර නොමැත. ඔවුන්ගේ කර්මාන්තශාලා සම්පූර්ණ කර නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කර විගස 10% ක කොටස් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ට)

i. කොරෝනා වසංගතයේ ප්‍රතිඵලයක් වශයෙන් 2022 වර්ෂයේදී ලංකාවේ පැවති ආර්ථික කඩාවැටීම හේතුවෙන් විදේශීය බැංකු දේශීය බැංකු හරහා කාර්යය සාධන සුරක්ෂණ නිකුත් කිරීම ප්‍රතික්ෂේප වූ පසුබිමක් නිර්මාණය විය. ඒ බව Canara Bank වෙත ලිපියක් මගින් උපදේශන ආයතනය පළමුව අපව දැනුවත් කිරීමෙන් අනතුරුව එම කාර්යය සාධන සුරක්ෂණය ලෙස මුදල් සංස්ථාවේ ගිණුමට බැරකිරීමට අදාල උපදේශණ ආයතනය කටයුතු කර ඇත. එම මුදල් මුවමරුව සඳහා උපදේශන ආයතනය වන Meridian Engineers and Consultancy Services වෙත සංස්ථාව මගින් නිකුත් කල අංක 202203765 දරන ලදු පතෙහි Bid Bonds Payable Performance bond for Millewa land ලෙස සඳහන් වීම Performance Bond for Millewa land ලෙස නිවැරදි විය යුතුය. විමසුමෙහි සඳහන්වන Canara Bank යන ඉන්දියානු බැංකුවකින් ඉදිරිපත් කරන ලද (USD 50,000.00) සුරක්ෂනය වන්දි රක්ෂණයක් ලෙස ඉදිරිපත් කර ඇත.

ii. උපදේශන ආයතනයක් තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියකදී ලංසු ඇපකරයක් ලබා ගැනිමේ අවශ්‍යතාවයක් මතු නොවේ. අදාල වෘත්තිය වන්දි රක්ෂණය වෙනුවෙන් USD 50,000/- වටිනාකමක් සහ 2025 මාර්තු මස 24 තෙක් වලංගු බැංකු රක්ෂණ සහතිකයක් Canara Bank හරහා ඉදිරිපත් කර තිබුණි. විමසුමෙහි සඳහන්වන අදාල (USD 19,285.00) රු. 6,942,500/- ප්‍රේෂණය කරන ලද්දේ කාර්යය සාධන සුරක්ෂණ සහතිකය වෙනුවෙන් ආදේශක සුරැකුමක් ලෙස ඉහත පිළිතුරේ පැහැදිලි කල ආකාරයට හුවමාරු කරන ලද වටිනාකම වේ. එම මුදල (Bind Bond) ලෙස සටහන් කිරීම වරදවා වටහා ගැනීමකි. එම මුදල් හුවමරුව සඳහා නිකුත් කල අංක 202203765 දරන ලදු පතෙනි විස්තරය Performance Bond for Millewa land ලෙස නිවැරදි විය යුතුය. ඊට අමතරව i හා ii ප්‍රශ්ණ වලදී කාර්යය සාධන සුරක්ෂණය හා වන්දි රක්ෂණය සඳහා ඉදිරිපත් කල ලේඛණ මාරු කොට සලකා විමසුම යොමු කොට ඇත.

iii. අවසාන වශයෙන් මෙම උපදේශන සේවාව සිදුකරගැනීමට තීරණය වුයේ Review and Evaluation of Design and Contract Proposals, Advice the Client on Technology Transfer යන කාර්යයන් වලට පමණි. ව්‍යාපෘතියේ නිෂ්පාදනාගාරවල නිර්මාණ (Design) කොටස කොන්ත්‍රාත් කරුට බාරදීමට තීරණය කෙරිණි. එයින් පසුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මූලික අදියරය වන ලංසු ආරාධන දැන්වීම් පුවත්පත්වල පල කිරීමේ අවස්ථාවේ සිටම මෙහි මාතෘකාව Review and Evaluation of Design and Contract Proposals" Advice the Client on Technology Transfer ලෙස පවත්වාගෙන ගොස් ඇත.

ඒ අනුව මෙම ලංසු කැඳවන අවස්ථාවේ සිටම (Design) සැලසුම් කරන කොටස උපදේශන ආයතනයෙන් ලබා ගැනීම ඉවත් කර ඇත.

මෙම කොන්ත්‍රාත් කරු ඉදිපත් කල මුළු ලංසු මුදල වන USD 386,100/- වටිනාකම යෝජිත නිෂ්පාදනාගාර 3 වන (ඝන හා මුඛ මාර්ගයෙන් ලබා දෙන ඖෂධ) Oral Solid Dosage (General Products), පිළිකා නාශක ඖෂධ (Oncology Drugs), විකලාංග හා ශල්‍ය වෛද්‍ය උපකරණ (Orthopedic

and Neurosurgical Implants) යන නිෂ්පාදනාගාර වල උපදේශන කටයුතු සඳහාය. එහි එක් එක් නිෂ්පාදනාගාරයක උපදේශන කටයුතු සඳහා මුදල් ගෙවීම් අදියර 14ක් යටතේ නිම කිරීමට සැලසුම් කර තිබුණි.

තවද, උපදේශන ආයතනයට කොන්ත්‍රාත් ගත සම්පූර්ණ මුදල වන USD 386,100/- ගෙවා නොමැති අතර ඔවුන් විසින් සම්පූර්ණ කරන ලද කාර්යයන් වලට පමණක් දැනට USD 90,000/- ක් පමණක් ගෙවීම් සිදුකොට ඇත.

iv. මෙම ව්‍යාපෘතිය, අදාල සැලසුම් මත නිම කිරීමට බලාපොරොත්තු වුවත් ප්‍රසම්පාදන කටයුතු කරගෙන යාමේදී එයට අදාල වන අවශ්‍යතාවයන් සපුරාලීමට සිදුවූ නිසා සහ අවසාන වශයෙන් මෙම ව්‍යාපෘතිය යටතේ Oral Solid Dosage නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම සඳහා අභිලාශ ඉදිරිපත් කරන ලද ආයතන 9 ක් පැවතිනි. පැවතිනි එම ආයතන 9 යෙන් මෙම නිෂ්පාදනාගාරය ඉදිකිරීමට සඳහා ලංසු කැඳවීමට ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුව (Standing Technical Evaluation Committee – STEC) හා ස්ථාවර අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව (Standing Cabinet Approved Procurement Committee – SCAPC) මගින් අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අතරින් දෙදෙනෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි ඒවා ඇගයීම සඳහා යොමු කල විට ඔවුන් දෙදෙනාද අවශ්‍ය අවම තාක්ෂණික අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වූ නිසාවෙන් එම දෙදෙනාගේම ලංසු (STEC) හා (SCAPC) මගින් ප්‍රතික්ෂේප කරන ලදී. ව්‍යාපෘතිය ආරම්භයේදී කරන ලද මූල්‍ය ශක්‍යතා වාර්තාව වලංගුව පැවතියේ වසර 3කට පමණි. එම නිසා සහ කොරෝනා වසංගතය නිසා ලංකාවේ උද්ගත වූ ආර්ථික කඩාවැටීම හේතු කොටගෙන දැනට මෙම ව්‍යාපෘතියට අදාලව සම්පූර්ණ ශක්‍යතා අධ්‍යනයක් කිරිමට අමාත්‍ය මණ්ඩල කමිටුව තීරණය කර ඇත. එයින් පසුව ව්‍යාපෘතිය සාර්ථකව කරගෙන යාමට අදහස් කරගෙන ඇත.

v. අත්‍යවශ්‍ය ඖෂධ සඳහා දේශීයව ඉහල ඉල්ලුමක් පැවතිම හේතුවෙන් රාජ්‍ය මැදිහත් වීමක් හරහා ඖෂධ සැපීමට දායක වීමට මෙම ව්‍යාපෘතිය යෝජනා විය. මුදල් අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ මැදිහත් වීම මත සහ කැබිනට් අනුමැතියන් අනුව මේ ව්‍යාපෘතිය මේ දක්වා ඉදිරියට ගෙන ගිය අතර ව්‍යාපෘතියේ මෙහෙයවීම් කමිටුවේ මගපෙන්වීම යටතේ කටයුතු කරගෙන ගොස් ඇත. මෙම සංස්ථාව දැනටමත් ඖෂධ නිෂ්පාදනයේ නියැලී සිටින බැවින් ව්‍යාපෘතිය යෝජනා කල මූලික අවස්ථාවේ අනුමැතිය සඳහා මූල්‍ය ශක්‍යතා අධ්‍යනයක් පමනක් ඉදිරිපත් කර ඇත. පසුව රටේ පැවති ආර්ථිකමය අස්ථාවර භාවය නිසා සම්පූර්ණ ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමට (SCAPC) අමාත්‍ය මණ්ඩල කමිටුව මගින් තීරණය කර ඇත.

vi. 2024 පෙබරවාරි 2 වැනි දින අමාත්‍ය මණ්ඩල කමිටු තිරනය ලබා දී තිබුනත් එය විදිමත් ලෙස ලැබුණේ 2024 මාර්තු මස 1 වැනි දින වේ. එයින් පසුව මේ සඳහා ප්‍රසම්පාදන කමිටුවක් පත් කරන ලෙස ඉල්ලීමක් 2024 මාර්තු 4වැනි දින කිරීමෙන් අනතුරුව එයට සාර්ථක ප්‍රතිචාරයක් ලෙස 2024 අප්‍රේල් මස 10 වැනිදා කමිටුවක් පත් කෙරිණි.

එම කමිටුවට මගින් ප්‍රසම්පාදන මර්ගොපදේශණයට අනුව ලංසු කැඳවීම් හා සම්බන්ධ ලේඛණ සකස් කිරීම මේ වන විට අවසාන අවස්ථාවේ ඇත.

vii. 1987 වසරේ ජපාන රජයේ පරිත්‍යාගයක් ලෙස රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ස්ථාපිත කරන ලද්දේ ආරම්භක ධාරිතාවය පෙති හා කරල් මිලියන 550 ක් වශයෙනි. මෙම ධාරිතාවය 2012 වසරේ JICA ආධාර දෙවන අදියර යටතේ පෙති හා කරල් මිලියන 3000 ක් දක්වා පුළුල් කිරීමට සැලසුම් කරන ලද අතර 2018 වසරේ එම ව්‍යාපෘතිය අවසන් කරන ලදී. ඒ අනුව අපගේ නිෂ්පාදන ධාරිතාවය පහත ආකාරයට අප විසින් සාක්ෂාත් කරගෙන ඇත.

2019 දෙසැම්බර් 31:- පෙති හා කරල් මිලියන 2400
2020 දෙසැම්බර් 31:- පෙති හා කරල් මිලියන 3015
2021 දෙසැම්බර් 31:- පෙති හා කරල් මිලියන 3040
2022 දෙසැම්බර් 31:- පෙති හා කරල් මිලියන 3302

ඉහත JICA දෙවන අදියර යටතේ නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය අනුව උපරිම ධාරිතාවය වන පෙති හා කරල් මිලියන 3000 නිෂ්පදනය කිරීමට සැලසුම් කර තිබුනේ 2023 වර්ෂයේදීය. නමුත් එවකට පැවති කොවිඩ් වසංගතය හමුවේ වුවත් සියළුම සේවකයින්ගේ දැඩි කැපවීම මත 2020 වර්ෂයේදීම පෙති හා කරල් මිලියන 3000 ඉලක්කය පසු කිරීමට අපට හැකිවිය.

ඒ අනුව නිෂ්පාදන ධාරිතාවය වැඩිවීමත් සමග ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) අනුමැතිය ලබාගෙන අපගේ වට්ටෝරු සංවර්ධන අංශය (Formulation Development) විසින් නව ඖෂධ එලිදැක්වීම සඳහා සැලසුම් සකස් කරමින් රටට ආනයනය කරන ඖෂධ වැඩි ප්‍රමාණයක් නිපදවීමට කටයුතු සිදුකරන ලදී. නමුත් අප විසින් උපරිම ධාරිතාවයෙන් ඖෂධ නිෂ්පාදනය සිදු කරන බැවින් අලුතෙන් හඳුන්වාදෙන ලද ඖෂධ නිෂ්පාදනය කිරීමට අපහට ධාරිතාවය නොමැති බව වැටහුණි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ වෛද්‍ය භාණ්ඩ වල දේශීය සැපයුම වැඩි කිරීමට යෝජනාවක් (Proposal to increase the local supply of medical goods in Sri Lanka) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් පිලියල කල අතර, එම යෝජනාව 2020-04-11 දිනැති ලිපිය මගින් එවකට සෞඛ්‍ය ලේකම්තුමිය වෙත යොමු කරන ලදී. ඒ අනුව රටේ ඖෂධ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා පහත දැක්වෙන සාමාජිකයින් 08 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් සෞඛ්‍ය ලේකම්තුමිය විසින් පත්කරන ලදී.

1. කාන්ති ගුණවර්ධන මිය - අතිරේක ලේකම් (පාලන 1) - සභාපති
2. වෛද්‍ය උත්පල ඉන්ද්‍රවංශ මහතා- සභාපති, රා.ඖ.නි.සං. - සාමාජික
3. සුජීවා ජයසුන්දර මිය - සාමාන්‍යාධිකාරී, රා.ඖ.නි.සං. - සාමාජික
4. ජී.ජී. වීරක්කොඩි මහතා - යාන්ත්‍රික ඉංජිනේරු, හිටපු නි.නාගරික කොමසාරිස් - සාමාජික
5. වෛද්‍ය ජයරුවන් බණ්ඩාර මහතා- අධ්‍යක්ෂ, වෛද්‍ය පර්යේෂණ ආයතනය - සාමාජික
6. ඩබ්. ඩී. විජේරත්න මිය - හිටපු ප්‍රධාන මූල්‍ය නිලධාරී, ඉඩම් අමාත්‍යාංශය - සාමාජික
7. එම්.එම්.සී.අයි. හේරත් මහතා - අධ්‍යක්ෂ ගොඩනැගිලි (ඉංජිනේරු) - සාමාජික
8. මංජුල ගුණවර්ධන මහතා - ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය - සාමාජික

එම කමිටුව විසින් මේ පිලිබඳව අධ්‍යනය කර අප රටට ආනයනය කරන අත්‍යාවශ්‍ය ඖෂධ කාණ්ඩ වශයෙන් හඳුනාගෙන ඒ සම්බන්ධව වාර්තාවක් ලබා දුන් අතර එහිදී විශාල වියදමක් දරමින් ඖෂධ ආනයනය කරන බවත්, මෙම ඖෂධ දේශීය වශයෙන් නිෂ්පාදනය කරමින් විදේශ විනිමය රටට ඉතිරිකල හැකි බවත් එමගින් ජනතාවට පහසු මිලට ප්‍රමිතියෙන් උසස් ඖෂධ ලබා දිය හැකි බවත් හඳුනා ගෙන ඇත.

මෙහිදී ඖෂධ නිෂ්පාදනාගාර කාණ්ඩ 5ක් හඳුනා ගනු ලැබූ අතර, ප්‍රථම අදියර වශයෙන් නිෂ්පාදනාග ාර 3 ක් ආරම්භ කිරීමටත් දෙවන අදියර යටතේ අනෙක් නිෂ්පාදනාගාර සැලසුම් කිරීමටත් යෝජනා කරන ලදී. මේ සම්බන්ධව නිෂ්පාදනාගාර 5ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගන්නා ලදී.

ප්‍රථම අදියර (Phase 01)

01. විකලාංග හා ස්නායු ශල්‍ය උපකරණ (Orthopedic & Neuro Surgical Implants) නිෂ්පාදනාගාරය
02. පිළිකා නාශක ඖෂධ (Oncology Drugs) නිෂ්පාදනාගාරය
03. සාමාන්‍ය ඖෂධ (Oral Solid Dosage) නිෂ්පාදනාගාරය

දෙවන අදියර (Phase 02)

01. හෘද රෝගීන් සඳහා අවශ්‍ය ස්ටෙන්ට්ස් (Cardiac Stents) නිෂ්පාදනාගාරය
02. අක්ෂි කාච (Intra Ocular lenses) නිෂ්පාදනාගාරය

එමෙන්ම 2020.05.07 දින ගරු ජනාධිපතිතුමා, ජනාධිපති ලේකම්තුමා, මුදල් අමාත්‍යාංශ ලේකම්තුමා, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ (SPC) සභාපතිතුමා ඇතුලු පිරිස සමග ඖෂධ නිෂ්පාදනය සම්බන්ධව පැවති සාකච්ඡාවේදී මා විසින් විධිමත් ආකාරයෙන් කරුණු දැක්වීමක් සිදු කල අතර එහිදී ගරු ජනාධිපතිතුමා ඇතුලු පිරිස මේ පිලිබඳව අවබෝධ කරගනිමින් එම කරුණු ඉතා අගය කල අතර එහිදී ජනාධිපතිතුමා විසින් ජනාධිපති ලේකම්, පී.බී. ජයසුන්දර මහතා වෙත දැනුම් දුන්නෙ මෙම නිෂ්පාදනාගාර ස්ථාපිත කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩමක් ලබා දීමට කටයුතු කරන ලෙසයි.

ජනාධිපති ලේකම්, පී.බී. ජයසුන්දර මහතා විසින් නාගරික සංවර්ධන අධිකාරියේ ලේකම් නිමල් පෙරේරා මහතා වෙත දැනුම් දුන්නෙ මේ සඳහා සුදුසු ඉඩමක් SPMC වෙත ලබාදෙන ලෙසටය. ඒ අනුව මේ සම්බන්ධව රැස්වීම් ගණනාවක් පැවත්වූ අතර එහිදී අප වෙත කොළඹ ප්‍රදේශයෙන් සුදුසු ඉඩමක් සොයා බලන ලදී. එහිදී කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අයත් අක්කර 15 ක ඉඩමක් සහ වාරිමාර්ග අමාත්‍යාංශය සම්බන්ධ ඉඩමක් නිර්දේශ කලත් එහිදී එම ඉඩම් ප්‍රශ්න සහගත ඉඩම් බවත් අනවසර ඉදිකිරීම් පැවතීම නිසා ඒවා නුසුදුසු බවත් තීරණය කෙරුණි.

මීට සමගාමීව නාගරික සංවර්ධන අධිකාරිය විසින් අපවෙත දැනුම් දී තිබුනේ හොරණ මිල්ලෑව ප්‍රදේශයේ අක්කර 800 ක ඉඩමක් පවතින බවයි. එම ඉඩම කොටස් පහකින් (5 clusters) සමන්විතව ඇති බවත් ඉන් එක් කොටසක් වැලිකඩ බන්ධනාගාරය ස්ථාපිත කිරීමටත්, තවත් කොටසක් විශ්ව විද්‍යාලයක් සඳහාත් වෙන් කර ඇති බවත් එම ඉඩම් සම්බන්ධව නිරීක්ෂණය කර සුදුසුද යන්න සොයා බලන ලෙසත් අප වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී ඉහත කොටස් 5න් ප්‍රධානතම කොටස සහ ප්‍රමාණයෙන් කුඩාම කොටස (cluster) වන ප්‍රධාන මාර්ගයට ආසන්න අක්කර 65 පර්.17.66 කින් (හෙක්ටයාර් 26.3492) සමන්විත කොටස අප විසින් තෝරාගන්නා ලදී. මෙම ඉඩම් කොටස තෝරා ගැනීමේදී මීට ආසන්නයේ ස්ථාපිත කොට ඇති පෞද්ගලික ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් වන නවෙස්ටා (Navesta) කර්මාන්ත ශාලාවද පිහිටා ඇති බවද සැලකිල්ලට ගන්නා ලදී. එනම් මෙම ව්‍යාපෘතිය කරගෙන යාමේදී ඊට ආසන්නව ඖෂධ නිෂ්පාදනය සම්බන්ධ කර්මාන්තශාලාවක් තිබීම පරිසර අධිකාරියේ අනුමැතීන් ලබාගැනීමේදී ද පහසුවක් බව අප විසින් සලකන ලදී.

එමෙන්ම මෙම අක්කර 65 කින් සමන්විත ඉඩම තෝරාගැනීමේදි වානිජ වටිනාකමින් යුක්ත ඉඩමක් බවත්, මෙම භූමියේ පිහිටීම මෙන්ම ඉඩම ප්‍රධාන මාර්ගයෙන් එක් පසක අක්කර 5 කට ආසන්න කොටසකුත් අනෙක් පස අක්කර 60 ක කොටසකුත් පැවතීම නිසා ඉදිරියෙදි යහපත් නිෂ්පාදන පුරුදු (GMP) සහ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේදී ද සුදුසු බව සලකා ඇත.

තවද මෙම යෝජිත කර්මාන්තශාලා 5 පමණක් නොව අනාගතයේදී තවත් නිෂ්පාදනය පුළුල් කිරීමේදී අවශ්‍ය ප්‍රමාණවත් ඉඩකඩ ඇති බවද සලකා මෙම ඉඩම තෝරාගන්නා ලදී. එනම් තවත් නිෂ්පාදන කර්මාන්තශාලා මෙන්ම මෙම පරිශ්‍රයට අවශ්‍ය ගබඩා පහසුකම්, සේවක නේවාසිකාගාර, සුභසාධක මධ්‍යස්ථාන ඇති කිරීම ආදිය වේ. අපගේ රත්මලාන නිෂ්පාදනාගාරය 1987 ස්ථාපිත කරන අවස්ථාවේ භූමිය අක්කර 4ක භූමිය භාවිතා කරනු ලැබුවත්, නිෂ්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘති මෙන්ම ගබඩා සඳහා ඉදිකිරීම් සිදු කිරීමෙන් පසුව මේවන විට මෙම භූමියේ ඉඩකඩ ප්‍රමාණවත් නොමැති අතර කර්මාන්තශාලාව වැඩි දුරටත් පුළුල් කිරීමට කිසිදු ඉඩකඩක් නොමැත. එයද අප විසින් සලකා බලා ඇත.

අක්කර 65ක භූමි ප්‍රදේශයේ දළ සැලැස්ම

| |
|---|
| A - Oncology Plant |
| B - Administration Block |
| C - Orthopedic Implants Manufacturing Plant |
| D - Oral Solid Dosage Plant |
| E - Pharmacology Technical College & hostels |
| F - Centralized RM/Finished Goods warehouse |
| G – Staff Housing |




මෙම ඉඩම අප විසින් තෝරාගැනීමෙන් අනතුරුව එය අපවෙත ලබා දීම සඳහා එවකට අග්‍රාමාත්‍ය මෙන්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය භාර අමාත්‍යතුමා (ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා) අංක 21/1380/306/070 දරන "ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත හොරණ මිල්ලෑව ප්‍රදේශයෙන් බිම් කොටසක් බදු පදනම මත ලබා දීම" යන මැයෙන් කැබිනට් මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරමින් මේ සඳහා අනුමැතිය ලබාදෙන ලදී. එනම් මෙම ඉඩම රජය සතු ඉඩමක් මෙන්ම එය තක්සේරු වටිනාකමටත් වඩා අඩු මිලකට අපවෙත

ලබාදීමට කටයුතු කල අතර, ඒ අනුව මෙම ඉඩම අවුරුදු 99 ක බදු කාලයක් සඳහා බදු වටිනාකම රු මිලියන 296.90 සහ රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් නියම කරන ලද වාර්ෂික නාමික බිම් කුලියක් (රු 25,000.00) බදු කාල සීමාව තුල වාර්ෂිකව ගෙවීමට යටත්ව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත ලබාදීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇත.

ඒ අකාරයට මෙම ඉඩම රජයේ තක්සේරු වටිනාකමටත් වඩා අඩු මිලකට අප වෙත ලබාගැනීමට හැකිවීම SPMC ලද මහගු අවස්ථාවක් මෙන්ම එය ඉතාමත් වටිනා අයෝජනයකි.

මෙම ඉඩම 2022 වර්ෂයේ අප වෙත ලබාගැනීමෙන් අනතුරුව නිෂ්පාදනාගාර ඉදිකිරීම ආරම්භ කිරීමට ප්‍රථම මෙම ව්‍යාපෘතිය සඳහා පහත දක්වා ඇති පරිදි කටයුතු රාශියක් සිදුකලයුතුව ඇත.

- උපදේශන සමාගමක් පත් කරගැනීම
- ඉදිකිරීම් කර්මාන්තශාලා සැලසුම් කිරීම
- ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව අදාල අනුමැතීන් ලබාගැනීම
- ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් සමාගමක් තෝරා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ලිපිලේඛන පිලියෙල කිරීම
- පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අදාලව සහතික ලබාගැනීම සහා ඒවා යාවත්කාලීන කිරීම
- යෝජිත ඉදිකිරීම් සඳහා මැනුම් කටයුතු

ඉහත කටයුතු මෙන්ම මෙතෙක් අප රට මුහුණ නොදුන් ආකාරයේ අර්බුදකාරී වාතාවරණයන්ටද මුහුණ දෙමින් ව්‍යාපෘතිය සිදු කරගෙන යාමට අපහට සිදුවී තිබේ. එබැවින් භූමියේ කර්මාන්තාශාලා ඉදිකිරීමට ප්‍රථම සිදුකලයුතුව ඇති කාර්යයන් රාශියක් සිදුකරගෙන යන අවස්ථාවක ඉඩම නිෂ්කාර්‍යව පවතින බව දක්වා තිබීම පිලිගත නොහැකි කරුණකි.

මේ වන විට පෙති හා කරල් නිෂ්දනාගාරය (Oral Solid Dosage Plant) සඳහා පිලියල කරන ලද යොජනා කැඳවීමේ (RFP) පත්‍රිකා ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ STEC (Standing Technical Evaluation Committee) විසින් ප්‍රතිසංශෝධනය කරන ලදි. මෙම යොජනා කැඳවීමේ පත්‍රිකා සඳහා ස්ථාවර කැබිනට් ප්‍රසම්පාදන කමිටුව SCAPC (Standing Cabinet Appointed Procurement Committee) අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව පෙති හා කරල් නිශ්පාදනාගරය සඳහා කැමැත්ත පළකරන ලද (EOI) ලංසුකරුවන් වෙත (ලංසුකරුවන් 9 දෙනෙකු ඉදිරිපත්වී ඇත) යොජනා කැඳවීම් (RFP) ඉදිරිපත් කරනු ලබේ. ඒ අනුව ඔවුන් ලබාදෙන යොජනා STEC විසින් ඇගයීමට ලක්කොට SCAPC අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉහලම සුදුසුකම් සපුරාලන ලංසුකරු වෙත නිශ්පාදනාගරය ඉදිකිරීමේ කටයුතු බාර දෙනු ලැබේ.

එමෙන්ම මේ වනවිට ඉදිකිරීම් භූමියේ පස් විශ්ලේශන (soil investigation) කටයුතු සිදු කරමින් පවතී.

මෙම ව්‍යාපෘතිය ආරම්භකර පවත්වාගෙන යාමට ව්‍යාපෘති සම්බන්ධීකාරක (Project Co-Ordinator) සහ ව්‍යාපෘති ලේකම් (Project Secretary) යන තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී. එමෙන්ම සංස්ථාවේ නීතිමය කටයුතු සහ

මෙම ව්‍යාපෘතියේ නීතිමය කටයුතු සඳහා නීති උපදේශක (Legal Advisor) තනතුරක් ඇති කරන ලද අතර මේ සඳහා ද අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී. ඒ අනුව තනතුරු 3 සඳහා බඳවාගැනීම් සිදුකර ඇත.

මීට සමගාමීව 2021.09.14 දිනැති අංක SPMC/HR/Cadre/2021/21 දිනැති ලිපිය අමාත්‍යංශයේ ලේකම් මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට යොමු කරන ලද අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විසින් අංක DMS/1754/SPMC/2020 දරණ 2021.11.22 දිනැති ලිපිය මගින් ඒ සඳහා එකඟ විය නොහැකි බව දන්වා එවන ලදී.

නමුත් මෙම ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා මෙම බඳවාගැනීම අවශ්‍ය බව දන්වා නැවතත් ඉල්ලීමක් සිදු කිරීමට කටයුතු කර ඇත.

මෙම නිලධාරීන් සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2019 පදනම් කරගනිමින් අදාල දීමනාවන් ගෙවීම සිදුකර ඇත.

රටේ පවත්නා වර්තමාන තත්ත්වයට මුහුණ දීම සඳහා හැකි තරම් ඖෂධ දේශීයව නිපදවීම සැම අතින්ම යෝග්‍ය වේ. (ප්‍රමිතියෙන් උසස් සහ පහසු මිළකට ඖෂධ නිපදවීමට හැකි වීම, පිටරට වලට ඇදී යන විදේශ විණිමය ඉතිරි කරගැනීමට හැකිවීම, නව රැකියා අවස්ථා උත්පාදනය කිරීමට හැකිවීම....) එබැවින් හොරණ මිල්ලෑව ප්‍රදේශයේ මෙම කර්මාන්තශාලා ඉදිකිරීමේ ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට ආරම්භක අවධියේ සිට අවම ප්‍රමාණයකින් යුක්ත කාර්‍ය මණ්ඩලයක් අවශ්‍යවේ.

ඒ අනුව ව්‍යාපෘති සම්බන්ධීකාරක (Project Co-Ordinator) කැබිනට් මණ්ඩලය විසින් ද ව්‍යාපෘති කළමනාකරණ කමිටුව (Project Management Committee) සඳහා අනුමත කර ඇත. මෙවැනි ව්‍යාපෘති සිදු කිරීමේදී නීති උපදෙස් අත්‍යාවශ්‍ය වේ. එබැවින් එවකට SPMC සතුව ස්ථිර නීතිඥ තනතුරක් නොතිබූ බැවින් කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියද ඇතිව SPMC සඳහා කොන්ත්‍රාත් පදනම මත දැනටමත් සේවය කරන නීති උපදේශක (Legal Advisor) හොරණ මිල්ලෑව Lotus Pharma ව්‍යාපෘතිය සඳහා ද තෝරාගන්නා ලදී. නීති උපදේශක (Legal Advisor) තනතුරේ සේවය අප ලබාගෙන ඇත්තේ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නීති උපදේශන කාර්යයන් සහ හොරණ මිල්ලෑව Lotus Pharma ව්‍යාපෘතියේ නීති උපදේශන කාර්යයන් යන දෙකම සඳහාය.

ව්‍යාපෘති ලේකම් (Project Secretary) තනතුරද මෙවන් ව්‍යාපෘතියකදී අනිවාර්‍යයෙන් අත්‍යාවශ්‍ය වේ. එබැවින් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියට යටත්ව මෙම ව්‍යාපෘතිය ආරම්භකොට ඉදිරියට ගෙනයාම සඳහා ව්‍යාපෘති ලේකම් (Project Secretary) තනතුරද කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී. ඒ අනුව මෙම තනතුරු 3 ම ව්‍යාපෘති සම්බන්ධීකාරක (Project Co-Ordinator), නීති උපදේශක (legal Advisor) සහ ව්‍යාපෘති ලේකම් (Project Secretary) සඳහා ජාතික අවශ්‍යතාවයක් වන මෙම ඖෂධ නිෂ්පාදන ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියන් ලබාගැනීමට දැනටමත් පියවර ගෙන ඇත.

මායිම් වැට සහ ව්‍යාපෘති කාර්යාලය ඉදිකිරිම සඳහා ලංසු කැඳවිමට අදාලව පුවත්පත් දැන්වීම් පල කිරිම වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC) අනුමැතිය ලබා ගැනිමට පෙරාතුව 2022 පෙබරවාරි 24 වැනි දින සභාපතිතුමාගේ පොරොත්තු අනුමැතියට (pending approval) යටත්ව පුවත්පත් දැන්වීම් 2022 පෙබරවාරි 27 වැනි දින පල කර ඇත. ඉන් අනතුරුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC) ආවරණ අනුමැතිය (covering approval) 2022 මාර්තු 21 ලබාගෙන ඇත.

මායිම් වැට සහ ව්‍යාපෘති කාර්යාලය ඉදිකිරිම සඳහා ලංසු කැඳවිම අවසන් කරන කාල වකවානුවේ පැවති අධික ආර්ථික අර්බුදය සහ උද්ධමන තත්වයත් හමුවේ නිකුත්කල National Budget 3/2022 සහ Public Enterprise 4/2022 යන චක්‍රලේඛ යටත්ව ඉදිකිරීම් කාර්යයන් තාවකාලිකව අත්හිටුවන ලදී.

මෙම වැට ඉදිකිරීම සහ ව්‍යපෘති කාර්යාල (site office) ඉදිකිරීම සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුගත මුදලට (engineering estimate) වඩා ලැබී තිබූ අවම ලංසුවේ වටිනාකමත් සැලකියයුතු ඉහල අගයක් විය. එම නිසා දෙවනවර ලංසු කැඳවිමට අදහස් කර ඇත්තේ ප්‍රමුඛතාවය මත පදනම්ව වැට ඉදිකිරිමට පමනක් වන අතර, මෙම ඉදිකිරීම ආකාර 2ක් අනුව සංශෝදිත ලංසු ලේඛණ හා පුවත්පත් දැන්වීම් පිලියෙල කර ප්‍රසම්පදන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව ප්‍රසම්පදන කමිටුව ලබාදෙන තීරණය අනුව වැට ඉදිකිරීම සඳහා ලංසු කැඳවිමට කටයුතු කිරීමට බලාපොරොත්තුවේ.

තවද මේ සඳහා 2022-03-04 දින පවත්වන ලද මෙහෙයුම් කමිටු තීරණය (steering committee meeting minutes) අනුව ද කටයුතු කර ඇත. මෙම කමිටුව රැස්වන ලද්දේ එම කමිටුවේ සභාපති, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙනි.

එමෙන්ම මෙම ව්‍යාපෘතිය සඳහා පත් කර ඇති ව්‍යාපෘති කළමනාකරණ කමිටු සාමාජිකයින් ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් වන අතර සංස්ථාවේ ඔවුන්ට නියමිත රාජකාරි සිදුකරමින් ඔවුන්ගේ තාක්ෂණික දැනුම මෙම ව්‍යාපෘතිය සඳහා යොදාගනිමින් රාජකාරි ඉටු කරනු ලබයි.

මේ සඳහා පූර්ණ කාලීන නිලධාරීන් බඳවාගත්තෙ නම් ඒ සඳහා විශාල වියදමක් මෙන්ම කාර්යාල පහසුකම් ආදිය ලබාදීමටද වියදමක් අපහට දැරීමට සිදුවනු ඇත.

ඒ අනුව මෙම බඳවාගැනීම් තුලින් අප සංස්ථාවට මුල්‍යමය වශයෙන් ලාභයක් අත්කරගෙන ඇත.

මෙම පත් කිරීම් සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට මේවන විට කටයුතු කරමින් පවතී.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ SPMC ලෝටස් ශාඛා ව්‍යාපෘතිය සඳහා ස්වාධීන උපදේශකයෙකු තෝරා ගැනීම සඳහා ඇමරිකානු ඩොලර් 386,100 ක් (ඇමරිකානු ඩොලර් තුන් ලක්ෂ අසූහයදහස් එකසියයක්) වූ සම්පූර්ණ මිළකට මෙම ව්‍යාපෘතිය සඳහා ස්වාධීන උපදේශකයකු ලෙස තාක්ෂණික හා මුල්‍ය ලංසු ඇගයීම සඳහා වැඩිම ලකුණු (ලකුණු 87) ලබාගත් ලංසු තබන්නා වූ මෙරිඩියන්

ඉංජිනියර්ස් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (M/s Meridian Engineers & Consultancy Services) ආයතනය තෝරා ගැනීමට ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුව (STEC) විසින් නිර්දේශ කරන ලද අතර අමාත්‍ය මණ්ඩලය පත් කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) විසින් අනුමත කරන ලදී.

ඒ අනුව ඉන්දියාවේ හයිද්‍රාබාද්හි - 500038 තෙලන්ගනා ශ්‍රීනිවාස් කොළණියේ (W) අංක 43 දරණ කොටසේ පිහිටි මෙරිඩියන් ඉංජිනියර්ස් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (M/s Meridian Engineers & Consultancy Services) ආයතනය පත් කිරීම සහ වැඩ අවසන් කරන පියවරයන්ට අනුව කොටස් වශයෙන් ගෙවීම සඳහා 2022-03-08 අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුනි.

2022 මාර්තු 10 වන දින පිලිගැනීමේ ලිපිය නිකුත් කලද ගිවිසුමට අදාල බැංකු ඇපකරයේ (performance bond) අන්තර්ගතය පිලිබඳව සහ විදේශීය බැංකු විසින් ඉල්ලුම් කරන ලද ඇපකරය ලබාදීම ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික සහ දේශපාලන අස්ථාවරත්වය මත අදාල ඉන්දියානු බැංකුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ඒ පිලිබඳව සාකච්ඡා කිරීමටත්, අදාල ඉන්දියානු බැංකුව විසින් අනුමැතිය ලබාදීමටත්, එකී සඳහන් කාලය ගත විය. මෙම කාලය තුල වුවද උපදේශන සේවා ගිවිසුම සම්පූර්ණ කිරීමට හැකිවූයේ ඒ සඳහා කටයුතු කල SPMC නිලධාරීන්ගේ දැඩි කැපවීම හා උනන්දුව මතය.

බැංකු ඇපකරයේ වලංගු කාලය තීරණය කරන ලද්දේ පිලිගැනීමේ ලිපියෙන් පසුව එම ලිපියේ දිනට අදාලවය. නමුත් ගිවිසුම අත්සන් කල දිනය බලාපොරොත්තු නොවූ ලෙස කල්පසුවීමෙන් මෙම කාල පරතරය ඇතිවී තිබේ. එහෙත් මෙම බැංකු ඇපකරයේ වලංගු කාලය අවශ්‍ය පරිදි නැවත දීර්ඝ කරගැනීමේ හැකියාව පවතී. ඒ අනුව උපදේශක ආයතනය බැංකු ඇපකරයේ වලංගු කාලය අවශ්‍ය පරිදි දීර්ඝ කරන බව අප වෙත දන්වා ඇත. එම නිසා මෙමගින් අනාගතයේදී අවදානමක් ඇතිවීමට හැකියාවක් නොමැත.

උපදේශන ආයතනය සමග එකඟතාවය ඇතිකරගත් ගිවිසුමට අනුව මෙම සම්පූර්ණ ව්‍යාපෘතිය කාර්යයන් ඒකක (Mile Stones) 14 කින් සමන්විත වේ . ඒ අතරින් දැනට සම්පූර්ණ කරන ලද කාර්යයන් වන විකලාංග හා ස්නායු ශල්‍ය උපකරණ (Orthopedic & Neuro Surgical Implants) නිෂ්පාදනාගාරය, පිළිකා නාශක ඖෂධ (Oncology Drugs) නිෂ්පාදනාගාරය සහ සාමාන්‍ය ඖෂධ (Oral Solid Dosage) නිෂ්පාදනාගාරය සඳහා වන RFP හා TOR සමාලෝචනය යන කාර්යයන් සඳහා (scope no 01) අදාල ගෙවීම වන US $ 52,500 (US $ 17,500 x 3) ක මුදල අදාල ගිවිසුම් ප්‍රකාරව ගෙවීම සිදුකර ඇත. උපදේශන ආයතනය සම්පූර්ණ කරන කාර්යයන් සඳහා ගෙවීම් සිදුකරන අකාරය කොන්ත්‍රාත් ගිවිසුමේ දක්වා ඇති අතර ඒ අනුව අදාල කාර්යයන් අවසානයේ ගෙවීම සිදුකල යුතුය.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් නිසි අධ්‍යනයක් සිදු කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ වෛද්‍ය භාණ්ඩ වල දේශීය සැපයුම වැඩි කිරීමට යෝජනාවක් (Proposal to increase the local supply of medical goods in Sri Lanka) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් පිලියල කරන ලද අතර, මේ සඳහා ලංකාවේ කීර්තිමත් ගණකාධිකාරි සමාගමක් කිසිදු අයකිරීමකින් තොරව අප වෙත මෙම අධ්‍යයනය සඳහා සහයෝගය දක්වන ලදී. එම යෝජනාව 2020-04-11 දිනැති ලිපිය මගින්

එවකට සෞඛ්‍ය ලේකම්තුමිය වෙත යොමු කරන ලදී. ඒ අනුව රටේ ඖෂධ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා සාමාජිකයින් 08 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් සෞඛ්‍ය ලේකම්තුමිය විසින් පත්කරන ලදී.

එම කමිටුව විසින් මේ පිලිබඳව අධ්‍යනය කර අප රටට ආනයනය කරන අත්‍යාවශ්‍ය ඖෂධ කාණ්ඩ වශයෙන් හඳුනාගෙන ඒ සම්බන්ධව වාර්තාවක් ලබා දුන් අතර එහිදී විශාල වියදමක් දරමින් ඖෂධ ආනයනය කරන බවත්, මෙම ඖෂධ දේශීය වශයෙන් නිෂ්පාදනය කරමින් විදේශ විණිමය රටට ඉතිරිකල හැකි බවත් එමගින් ජනතාවට පහසු මිලට ප්‍රමිතියෙන් උසස් ඖෂධ ලබා දිය හැකි බවත් හඳුනාගෙන ඇත මෙහිදී ඖෂධ නිෂ්පාදනාගාර කාණ්ඩ 5ක් හඳුනා ගනු ලැබූ අතර, ප්‍රථම අදියර වශයෙන් නිෂ්පාදනාගාර 3 ක් ආරම්භ කිරීමටත් දෙවන අදියර යටතේ අනෙක් නිෂ්පාදනාගාර සැලසුම් කිරීමටත් යෝජනා කරන ලදී.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ව්‍යාපෘති කළමණාකරු (Project Manager) වශයෙන් රජයේ සමාගමක් වන සෙලන්ඩිවා ඉන්වෙස්ට්මට් (M/s. Selandiva Investment) සමාගම පත්කරනු ලැබූ අතර එවකට පැවති මූල්‍ය ප්‍රතිපාදන ගැටළු හේතුවෙන් විශාල මුදලක් වැයකර ශක්‍යතා වාර්තාවක් සකස් කිරීමට නොහැකි බැවින් ඔවුන් විසින් මුල්‍යමය අධ්‍යනයක් සිදු කර වාර්තාවක් පිලියෙල කරන ලදී. මේ සඳහා සංස්ථාවට කිසිදු මුදලක් වැයවුයේ නැති බවද සඳහන් කල යුතුය.

එහිදී ඔවුන් විසින් සිදු කරන ලද ආයෝජන මත ප්‍රතිලාභ (Return on Investment) වාර්තාව අනුව මෙම ව්‍යාපෘතියේ නිෂ්පාදනාගාර 3ම සඳහා ලැබෙන ප්‍රතිලාභ ඉතා හොඳ අගයක් ගන්නා බව දක්වා ඇත. එනම් මෙරට ඖෂධ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ආනයනය කරන ඖෂධ දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා වන මෙම ව්‍යාපෘතිය කිසි සේත්ම පාඩු ලබන ව්‍යාපෘතියක් නොවන බවත් මේ සඳහා යොදවන මුදල් ඉතා පහසුවෙන් නැවත උපයාගත හැකි බවත් ඔවුන් විසින් දක්වා ඇත.

එමෙන්ම මෙම ව්‍යාපෘතිය සඳහා ලබාගැනීමට නියමිත මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඔවුන්ගේ වෙබ් අඩවියේ දක්වා ඇති විශේෂඥයන් ලයිස්තුව මගින් තෝරාගත් මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්‍යවරුන් දෙදෙනෙකු සම්බන්ද කරගනිමින් මෙම නිෂ්පාදනාගාර 3 සඳහාම සවිස්තරාත්මක විශ්ලේශන වාර්තාවක් (comprehensive analysis report) සකස් කරන ලද අතර එය මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කිරීමෙන් අනතුරුව මධ්‍යම පරිසර අධිකාරිය ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකරන ලදී. ඒ අනුව ඔවුන් විසින් පාරිසරික බලපෑම් හඳුනාගැනීම සලකා බලා (Environmental Impact Identification -EII) අදාල ඉඩමේ මෙම යෝජිත නිෂ්පාදනාගාර 03 කරගෙන යාම සඳහා අදාල අනුමැතියන් ලබාදෙන ලදී.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා සිදු කරන ලද පූර්ව ශක්‍යතා අධ්‍යන සියල්ලන්ගෙන්ම පෙනී යන්නෙ මෙම ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා ශක්‍යතාවය පවතින බවයි.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිත ලෝටස් ෆාමා ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නීති උපදේශක, ව්‍යාපෘති සම්බන්ධීකාරක, ව්‍යාපෘති ලේකම් හා ව්‍යාපෘති කළමණාකරු තනතුරු සඳහා අනුමැතිය ඉල්ලා 2021.09.14 දින, 2023.03.07 වන දින හා 2023.06.30 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇත. ඒ සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/19 ලෙස කටයුතු කරන ලෙස 2023.10.10 දිනැති ලිපිය මගින් දන්වා එවා ඇති අතර ප්‍රසම්පාදන කමිටුව කිරීම සඳහා 2024.02.05 වන දින සැලසුම් හා ප්‍රසම්පාදන අංශය වෙත යොමු කරන ලදි. තවදුරටත් මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2024.03.14 දින ලිපියක් යොමු කරන ලදි. නැවතත් මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2024.05.28 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කරන ලද අතර එය සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිර්දේශ කර අවශ්‍ය කටයුතු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව 2024.06.04 දිනැති ලිපිය මගින් දන්වා එවා ඇත.

ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී දැනුම් දෙන ආකාරයට ඉහත තනතුරු පිළිබඳව කටයුතු කිරීමට හැකි බව දන්වා සිටිමි.

viii. මෙම ඉඩම සම්පූර්ණ අක්කර 800කින් යුතු ඉඩම් කොටසකින් ලබාගත් ඉතාම කුඩා කොටසකි. එය නාගරික සංවර්ධන අධිකාරිය මගින් කැබිනට් පත්‍රිකාවක් හරහා ලබාගත් එකකි. එය රජයේ තක්සේරු වටිනාකමට වඩා ඉතා අඩු වටිනාකමකට ලබා ගන්නා ලදී. මෙම ව්‍යාපෘතියේදී ඉදිරි අනාගතයේ සැලසුම් සඳහා ඉඩකඩ ඉතිරි කර ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බව මෙම සංස්ථාවේ රත්මලාන පරිශ්‍රය පිළිබඳ සැලකීමේදී නව ඉදිකිරීමකට ඉඩකඩ නොමැති හේතුවෙන් තදින්ම වැටහේ.

එම හේතුවෙන් සහ මෙම ව්‍යාපෘතිය දිගුකාලීනව ඖෂධ කලාපයක් දක්වා පුළුල් කිරීමට සැලසුමක් පැවතීමත් එහි පලමු අදියරයේදී කර්මාන්ත ශාලා 3ක්ද පසුව එහි සේවක සේවිකාවන්ට නිසි වෙලාවට සේවයට වාර්තා කිරීමට හා කාර්යක්ෂමතාවය උපරිම කිරීමට සේවක නිල නිවාස ඉදිකිරීම, අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා සාප්පු සංකීර්ණයක්, වට්ටෝරු සංවර්ධන ආයතනයක් ඉදිකිරීමට සැලසුම් ගතව තිබුණි. මෙම නිෂ්පාදනාගාර සමග විශ්වවිද්‍යාල අනුබද්ධ කොට පාඨමාලා වලට යොමු කිරීමටත් මෙහි සැලසුම් කර ඇත. අනෙකුත් ඉඩම් වල වෙනත් ආයෝජකයන්ට කර්මාන්ත ශාලා ඉදිකිරීමට අවස්ථාව සලසාදීම අරමුණු විය. මෙම අක්කර 65ක ප්‍රමාණය ඉහත සියලු ක්‍රියාකාරකම් අරමුණු කරගෙන ලබාගත් ඉඩමකි.

ix. පාරිසරික තක්සේරු වාර්තාවේ වලංගු කාලය දීර්ඝ කර ගැනීමට සංස්ථාව කටයුතු පවතින අතර පරිසර අධිකාරිය මගින් ඒ සඳහා ප්‍රථමව නිරීක්ෂණය කිරීමට අදාලව නිකුත් කරන ලද ලිපිය ලෙස හා වලංගු කාලය දීර්ඝ කරන ලද පාරිසරික තක්සේරු වාර්තාව මේ සමග අමුණා ඇත. ඒ අනුව පාරිසරික වාර්තාව ලබා ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයක් සිදුවුවද, පාරිසරික නිර්දේශයන් දීර්ඝ කරගැනීමට සංස්ථාවට සමත් වී ඇත.

x. මෙම සම්පූර්ණ මුදල ව්‍යාපෘතිය සඳහා ලබාගත් ඉඩම වෙනුවෙන් හා බඳවා ගත් නිලධාරීන්ගේ වේතන, මිනුම් ගාස්තු, නීති උපදේශන ගාස්තු, භූමි පරීක්ෂා වෙනුවෙන් දරනලද වියදමකි.

xi. පූර්ව ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් වල 2023 දෙසැම්බර් මස 31වැනි දිනට සාරාංශය ගත කරන ලද තොරතුරු මෙහි ලෙස දක්වා ඇත එහි උපදේශන ආයතනයට කරන ලද ගෙවීම් හැර ඉතිරි සියල්ල විමසුමේ දක්වා ඇති රු. මිලියන 20 ක මුදල් ගෙවීම් සමග සැසඳේ.

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව කටයුතු කර ඇති අතර සාර්ථක ලංසු කරුවෙකු නොමැති භාවය නිසාවෙන් ව්‍යාපෘතිය තාවකාලිකව නතර වී ඇත. (SCAPC) තීරණය අනුව සම්පූර්ණ ශක්‍යතා අධ්‍යනයකින් පසුව නැවත ලංසු කැඳවීමක් හරහා සුදුසු කොන්ත්‍රාත් කරුවෙකු තෝරාගෙන මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට අවකාශය සලසා ගත හැකිය.

(ඩ) මෙම ගොඩනැගිල්ලේ ඇති ස්ථාවර වත්කම් තක්සේරු කිරීම කිරීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (Industrial Development Board) (IDB) වෙත බාර දී ඇති අතර මෙම ශ්‍රවණාගාර පුටු 30 හා ආලින්ද පුටු 10 පිළිබඳ තක්සේරු වාර්තාව ලැබීමෙන් අනතුරුව සංස්ථා තක්සේරු කමිටුවේ තීරණ අනුව ක්‍රියා කිරීමට නියමිත වේ.

(ත) බද්ධ ව්‍යාපාර වලින් මිලදී ගෙන වෛද්‍ය සැපයීම් අංශයට සපයනු ලබන ඖෂධ වෙනුවෙන් කර ඇති අඩුකිරීම් රු. 884,136,286.00 ක වටිනාකම අදාල බද්ධ ව්‍යාපාර සඳහා කල යුතු පියවීම් වලින් හිලව් කිරීමට සංස්ථාව විසින් ඉදිරියේදී පියවර ගනු ලැබීමට නියමිත අතර ඒ නිසා එම අඩුකිරීම් වෙනුවෙන් අවසන් ගිණුම්වල කිසිදු වෙන් කිරීමක් සිදු කොට නොමැත.

එසේම මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය ඇමතිතුමා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුලු ඉහල නිළධාරින් වෙත ලිඛිතව දන්වා ඇති අතර රාජ්‍ය ආයතනයක් වන මෙම ආයතනය වෙනුවෙන් සහනයක් ලබා දෙන මෙන් ඉල්ලා ඇති අතර ඒ සම්බන්ධයෙන් අනුමැතියක් ලැබෙන තෙක් සිටියි.


(ත) දේපල පිරියත උපකරණ සම්බන්ධයෙන් අප සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් කමිටුව වෙත ස්ථාවර වත්කම් හඳුනාගැනිමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව ඉදිරියේදී අවශ්‍ය පියවරක් ගනු ලැබේ.

# අගය එකතු කිරීමේ ප්‍රකාශය


| | 2023<br>Rs.'000 | 2022<br>Rs.'000 |
|---|---|---|
| **අගය නිර්මාණය** | | |
| ආදායම | 29,331,719 | 16,620,185 |
| වෙනත් ආදායම් | 636,645 | 1,110,991 |
| | 29,968,364 | 17,731,176 |
| වෙනත් මූලාශ්‍රවලින් මිලදී ගත් භාණ්ඩ හා සේවා | (26,853,048) | (14,480,345) |
| උත්පාදනය කළ අගය | **3,115,316** | **3,250,831** |

| **එකතු කළ අගයේ බෙදාහැරීම** | 2023 | % | 2022 | % |
|---|---|---|---|---|
| සේවකයින් වෙත - වැටුප්, වේතන සහ වෙනත් ප්‍රතිලාභ | 672,968 | 21.60 | 583,294 | 17.94 |
| ප්‍රාග්ධනය සම්පාදකයන් වෙත - භාණ්ඩාගාර බද්ද | 300,000 | 9.63 | 100,000 | 3.08 |
| රජයට - බදු සහ නියාමන ගාස්තු | 838,617 | 26.92 | 622,943 | 19.16 |
| ණය හිමියන්ට - පොලී සහ ආශ්‍රිත ගාස්තු | 615 | 0.02 | 308 | 0.01 |
| ව්‍යාපාර ව්‍යාප්තියට සහ වර්ධනයට | | | | |
| - ක්ෂය | 258,320 | 8.29 | 262,466 | 8.07 |
| - රඳවාගත් ආදායම | 1,044,796 | 33.54 | 1,681,820 | 51.74 |
| | **3,115,316** | | **3,250,831** | |

2023




2022





- සේවකයින් වෙත
- ප්‍රාග්ධනය සම්පාදකයන් වෙත
- රජයට
- ණය හිමියන්ට
- ව්‍යාපාර ව්‍යාප්තියට සහ වර්ධනයට


# ප්‍රස්ථාරාත්මක සමාලෝචනය




## පිරිවැටුම





## ආදායම වර්ගීකරණය





## බදු පෙර ශුද්ධ ලාභය




## නිෂ්පාදනය




## නිෂ්පාදනයේ ප්‍රධාන දායකත්වයන් (මිලියන) -2023




## මානව සම්පත



# පසුගිය වර්ෂ 10 තුළ වැදගත් මූල්‍ය විස්තර



| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැටුම | 1,712,105 | 2,054,363 | 2,434,508 | 3,174,612 | 4,621,537 | 5,646,878 | 7,647,780 | 8,538,944 | 16,620,185 | 29,331,719 |
| අලෙවි පිරිවැය | 1,319,715 | 1,539,441 | 1,888,256 | 2,666,683 | 3,990,801 | 4,743,125 | 6,280,757 | 7,102,322 | 14,508,387 | 26,381,969 |
| දළ ලාභය | 392,391 | 514,921 | 546,252 | 507,928 | 630,736 | 903,752 | 1,367,023 | 1,436,621 | 2,111,797 | 2,949,749 |
| මෙහෙයුම් ලාභය | 224,758 | 364,845 | 353,776 | 244,987 | 308,741 | 564,411 | 1,067,020 | 1,078,814 | 2,061,371 | 1,608,248 |
| පරිපාලන වියදම | 133,933 | 125,469 | 165,788 | 204,579 | 242,218 | 237,694 | 247,137 | 244,271 | 327,115 | 396,276 |
| පොළී ආදායම | 44,196 | 53,586 | 87,629 | 77,401 | 51,659 | 28,093 | 94,487 | 156,792 | 330,531 | 622,549 |
| බදු පෙර ශුද්ධ ලාභය | 266,481 | 414,501 | 441,164 | 321,982 | 359,680 | 592,057 | 1,160,997 | 1,235,327 | 2,391,594 | 2,173,308 |
| බදු පසු ශුද්ධ ලාභය | 183,848 | 262,323 | 296,646 | 223,907 | 251,262 | 434,777 | 1,017,364 | 1,006,185 | 1,674,345 | 1,518,555 |
| ස්ථාවර වත්කම් | 780,718 | 762,560 | 798,657 | 802,775 | 3,133,903 | 3,203,159 | 3,117,911 | 2,974,013 | 3,656,401 | 4,002,112 |
| කෙටි කාලීන ආයෝජන | 913,443 | 1,027,388 | 1,175,754 | 926,461 | 369,761 | 474,984 | 3,040,316 | 3,452,508 | 4,241,086 | 5,974,554 |
| මුලු වත්කම් | 2,386,449 | 2,700,885 | 2,902,284 | 3,073,637 | 6,229,453 | 7,185,386 | 7,829,711 | 8,680,301 | 14,700,782 | 16,517,180 |
| සේවක සංඛ්‍යාව | 226 | 229 | 248 | 274 | 276 | 276 | 291 | 329 | 336 | 345 |

**මුලු වත්කම් = මුළු ජංගම නොවන වත්කම්වල ශුද්ධ ගිණුම්ගත වටිනාකම + මුළු ජංගම වත්කම්**

# ආයතනික තොරතුරු





**ආයතනයේ නාමය**
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

**නෛතික තත්ත්වය**
1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1987 වසරේ දී පිහිටුවන ලදී.

**සංස්ථාපිත කළ දිනය**
1987 ජූනි මස 04

**ලියාපදිංචි කාර්යාලය**
අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, කඳවල වත්ත, රත්මලාන, ශ්‍රී ලංකාව

**අධ්‍යක්ෂ මණ්ඩලය**

| | | |
|---|---|---|
| වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවංස | - | සභාපති |
| වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන | - | අධ්‍යක්ෂ |
| ඒ.ආර්. වික්‍රමසිංහ | - | අධ්‍යක්ෂ |
| වී.ජී. චමින්ද වික්‍රමරත්න | - | අධ්‍යක්ෂ |
| යූ.එස්.කේ. දෙනාවත්ත | - | අධ්‍යක්ෂ |

**විගණකවරු**
විගණකාධිපති, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල

**බැංකු**
ලංකා බැංකුව / මහජන බැංකුව/ ජාතික ඉතිරි කිරීමේ බැංකුව

**කළමනාකරණ කමිටුව**

| | | |
|---|---|---|
| එස්.ඩබ්. ජයසුන්දර | - | සාමාන්‍යාධිකාරිණී |
| ඒ.ජී.ඩී.එස්. අතුරලිය | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (මූල්‍ය) |
| එස්.පී. ජයවීර | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන) |
| පී.ඩී. ජයසුන්දර | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) |
| ආර්. ධර්මදාස | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් සහ ප්‍රසම්පාදන) |
| ආර්.එම්.ආර්.එම්. රණසිංහ | - | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වට්ටෝරු, පර්යේෂණ  සහ සංවර්ධන) |
| එච්.කේ.පී.ජී. සේනාධීර | - | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තත්ත්ව පාලන) |
| ඒ.එම්.ටී.පී. කුලසේකර | - | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (අලෙවි ප්‍රවර්ධන) |
| සී.ඩී. මගිනආරච්චි | - | වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (මානව සම්පත්) |
| ජේ.එම්.එස්. ජයසුන්දර | - | කළමනාකාරු (මූල්‍ය) |
| ඒ.සී.පී. ආනන්දකුමාර | - | කළමනාකාරිණී (සැලසුම් සහ ප්‍රසම්පාදන) |
| වී.ජේ. බණ්ඩාරවත්ත | - | අභ්‍යන්තර විගණක |
| ඒ.එන්. හේවාගම | - | කළමනාකරු (නිෂ්පාදන) |
| පී. දන්තනාරායන | - | කළමනාකාරිණී (නිෂ්පාදන) |
| බී.වී.එච්.පී.එස්. කුමාර | - | කළමනාකරු (ඉංජිනේරු) |
| එස්. වික්‍රමසිංහ | - | කළමනාකරු (නිෂ්පාදන) |
| වයි.එම්.පී. කුමාර | - | කළමනාකරු (සැලසුම් සහ ප්‍රසම්පාදන) |
| ඒ.පී.එම්. වික්‍රමනායක | - | කළමනාකරු (නිෂ්පාදන) |
| එම්. බෙනරගම | - | කළමනාකරු (ඉංජිනේරු) |
| ඒ.ටී.එම්. ජයසේකර | - | කළමනාකරු (නිෂ්පාදන) |
| එම්. විතුෂන් | - | කළමනාකාරිණී (තත්ත්ව පාලනය) |
| ආර්.ඕ.එන්. දිසානායක | - | කළමනාකරු (ඉංජිනේරු) |